

# මහාවග ගැටපදය

# මහාවග ගැටපදය

හත්තක මාලිගාතැන්නේ පුරාණ විහාරාධිපති

හත්නක ශ්‍රී සාරානන්දාභිධාන මහාස්ථවිරපාදයන් වහන්සේගේ

ශිෂ්‍ය

## උහන්ඹිවිට සාසනතිලක

ස්ථවිරයන් වහන්සේ විසින් සම්පාදිත යි.

---

විද්‍යෝදය පිරිවෙණේ උපප්‍රධානාචාර්ය
වික්‍රමශිලා විදර්ශනා පරිවෙණාධ්‍යක්ෂ ආභිධර්මික
වාගීශ්වරාචාර්ය

## කුකුල්නාපේ ශ්‍රී දෙවරක්ෂිතාභිධාන

මහාස්ථවිරපාදයන් වහන්සේ විසින්

ශුද්ධිපත්‍රාවලෝකනය කරණ ලදී.

---

විද්‍යෝදය පරිවෙණාධිපති පණ්ඩිත ජනාවතංස

## බද්දේගම ශ්‍රී ප්‍රියරතනාභිධාන

නායක මාහිමියන් වහන්සේ විසින්

අවසාන ශුද්ධිපත්‍රාවලෝකනයෙන් පිළිගන්නා ලදී.

---


මාතර කොටුවේ එච්. පී. ප්‍රැන්සිස් ජයවික්‍රම මහතා විසින්

මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරණ ලදී.

---

2485
——ජනවාරි 1 දිනදීය.
1942

මිල ශත 80 යි.

# ප්‍රස්තාවනා

---

බුදුරදුන් පිරිනිවි තෙමසකින් මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රධාන කොට ඇති පන්සියයක් මහරහතන් වහන්සේ අජාසත් රජහු විසින් රජගහනුවර වෙහාර පර්වත ප්‍රාන්තයෙහි පිහිටි සප්තපර්ණීගුහාද්වාරයෙහි අනෙකප්‍රාකාරාදියෙන් සරසා පිළියෙල කරවන ලද මණ්ඩපයට ප්‍රථම ධර්මසඞ්ගායනාව පිණිස රැස්වූවාහු පන්සිය පස්විස්සක් පමණ ශික්ෂාවන්ගෙන් සමන්විත වූ පරිජි–පචිති දෙපොත ප්‍රථම කොට සඞ්ග්‍රහ කළහ.

ඉක්බිති සත්සති කථා, බ්‍රහමායාචන කථා, යස පබ්බජ්ජා කථා, චතුසහාය පබ්බජ්ජා කථා, මාර කථා, සරණාගමන උපසම්පදා කථා, භද්දවග්ගිය සහායක කථා, පඨම–දුතිය–තතිය–චතුත්ථ–පඤ්චම පාටිහාරිය කථා, ආදිත්ත පරියාය කථා, උරුවෙල පාටිහාරිය කථා, සාරිපුත්ත මොග්ගල්ලාන පබ්බජ්ජා කථා, උපජ්ඣාය වත්ත, සද්ධිවිහාරිකවත්ත, ආචරියවත්ත, අන්තෙවාසිකවත්ත, උපසම්පාදෙතබ්බ පඤ්චක – ඡක්ක, අඤ්ඤතිත්ථිය පුබ්බ කථා, අභය කථා, දණ්ඩකම්ම, න උපසම්පාදෙතබ්බක න පබ්බාජෙතබ්බක උපසම්පදාකම්ම, නිස්සයකම්ම, අකරණීය යන ප්‍රධාන කරුණු පස් විස්සකින් බදුනාවූ වස්තු එක්සිය දෙසැත්තෑවකින් පරිමිතවූ මහාඛන්ධකය;

අඤ්ඤතිත්ථිය කථා, චොදනාවත්ථු, අනාපත්ති, වග්ගාවග්ග සඤ්ඤී, වෙමතික, කුක්කුච්චපකත, භෙදපුරෙක්ඛාර, උපොසථාදි ප්‍රධාන කොටස් අටකින් බදුනාවූ වස්තු සයාසූවකින් පරිමිතවූ උපොසථක්ඛන්ධකය;

වස්සාවාස කථා, වස්සූපනායික යන ද්විප්‍රභෙදයක් ඇති වස්තු දෙපණසකින් පරිමිතවූ වස්සූපනායිකක්ඛන්ධකය;

අනාපත්ති, වග්ගාවග්ගසඤ්ඤී වෙමතික, කුක්කුච්චපකතක, භෙදපුරෙක්ඛාර, පවාරණීය යි යන කොටස් සයකින් බදුනාවූ සසාලිස් වස්තු කෙනෙකුන්ගෙන් යුක්තවූ පවාරණක්ඛන්ධකය;

වස්තු තෙසැටකින් පරිමිතවූ චම්මක්ඛන්ධකය;

භෙසජ්ජ අනුඤ්ඤාත කථා, සුප්පිය කථා, ලිච්ඡවි කථා, සීහ කථා, භෙසජ්ජ කථා යන ප්‍රභෙද සයකින් පරිච්ඡින්නවූ වස්තු එක් සිය සයකින් පරිමිතවූ භෙසජ්ජක්ඛන්ධකය;

ආදාය, ආනාදාය, ආසා, කරණීය, අපවිනය, කඨින යන ප්‍රධාන කොටස් සයකින් ප්‍රභෙදවත්වූ එක්සිය සොළසක් වස්තූන් ගෙන් පරිමිතවූ කඨිනක්ඛන්ධකය;

විසාඛ කථා, චීවර කථා යන ප්‍රධාන කොටස් දෙකකින් භින්නවූ සයානූ වස්තු කෙනෙකුන්ගෙන් යුක්තවූ චීවරක්ඛන්ධකය;

චතුවග්ග කරණ, පඤ්චවග්ග කරණ, දසවග්ග කරණ, වීසති වග්ග කරණ, වාසභගාමි කථා, උපාලිපුච්ඡා කථා, චම්පෙය්‍ය කථා යන භෙදත්‍රයකින් භින්නවූ සතිස් වස්තු කෙනෙකුන්ගෙන් යුක්තවූ චම්පෙය්‍යක්ඛන්ධකය;

දීඝාවූ කථා, කොසම්බ කථා යන ප්‍රභෙද ද්වයකින් භින්නවූ සූවිසි වස්තු කෙනෙකුගෙන් පරිමිතවූ කොසම්බක්ඛන්ධකය සි ඛන්ධක දශයකින් සම්පූර්ණවූ ''මහාවග්ග'' නම් ශ්‍රෙෂ්ඨ විනය ග්‍රන්ථයද, විනය පිටකයට අයත් ශෙෂ ග්‍රන්ථ වූ චුල්ලවග්ග, පරිවාර යන ග්‍රන්ථද්වය ද යථා ක්‍රමයෙන් සංග්‍රහ කළහ.

**'විනය'** නම් ශාසනයාගේ ආයුෂය යි. ශාසනය රඳා තිබෙන්නේ විනය ධර්මය නිසි අයුරින් පිළිපදින සඞ්ඝයා මතුයෙහි ය. .විනය' නම් හික්මීම යි. භික්ෂූන් විසින් හික්මිය යුතු නීති රීති ඇතුළත් කොට වදාළ ග්‍රන්ථයන්ට **'විනය පිටක'** යයි නම් කළහ.

මේ විනය ග්‍රන්ථයන්හි ප්‍රකාශිත කරුණු නිසිසේ නොවැටහෙන්නහුට ඒ නීති අනුව පිළිපැදිය නොහැක. එහි සඳහන් සමහර කරුණු අවබොධ කරගැනීම සුකර නොවේ. සමර්ථ ආචාර්ය්‍යවරයන්ගේ සදුපදෙශයන්ගෙන් වෙන්ව විනය ග්‍රන්ථයන්හි සඳහන් කරුණු කාහට වුවත් දුරවබොධ ය. එහිවූ සමහර වචනවල ධාතු ප්‍රත්‍යය වෙන්කර ගැනීමෙන් ද නියම අර්ථය ලබාගන්ට නොහැකි ය. අතික් පාලි ග්‍රන්ථයන්හි නොපැණෙන, විනය ග්‍රන්ථයන්හි පමණක් පෙණෙන, ඇතැම් වචන ද ඇති. ඒවායේ නියම අර්ථය විනය ග්‍රන්ථයන් හැදෑරීමෙන් ම දත යුතුයි.

නියස්ස කම්ම, තජ්ජනීය කම්ම, උක්ඛෙපණීය කම්ම යනාදිය පහදාගන්ට විනය ග්‍රන්ථ ම පුහුණු කළ යුතුය, ඉගෙණ ගත යුතුය.

ඛන්ධක යනු උසස් විනය කර්ම සමූහයකට කියන නමකි. එබැවින් ඛන්ධක සමූහයක් ඇතුළත් මේ මහාවග්ග නම් ග්‍රන්ථය ද උසස් බැව්හි ලා ගිණිය යුතුය. එහි අන්තර්ගත කරුණු ද එසේම ගරුය, දුරවබොධය. පෙර විනය ග්‍රන්ථයන්ට ලියූ ගැටපදයක් තිබුන බැව් පොත පතින් දක්නට ලැබේ. මෙකල එය නාමශෙෂබවට පැමිණ තිබේ.

එබැවින් ආධුනිකයන්ට මෙයින් යම්තම් මෙහෙයක් සිදුවුව හොත් මැනව යි සැලකූ අප විසින් මහවග නම් විනය ග්‍රන්ථයට මේ ගැටපදය සම්පාදනය කරණ ලදී.

විනය පිටකයේ ඉතිරි ග්‍රන්ථ සතරට ද ගැටපද කල් නොයවා පළවෙනවා ඇත.

විද්‍යොදය පරිවෙණාධිපති ප්‍රාචීන විද්‍යාවෘත්‍යාග්‍රගණ්‍ය අතිගරු බද්දේගම ශ්‍රී පියරතනාභිධාන නායක මාහිමියානන් වහන්සේ විසින් මෙහි අවසාන ශුද්ධි පත්‍රය බලා වදාරා මෙය ගරු ස්ථානයට පමුණුවන ලදී.

තන්ත්‍රොපප්‍රධානාචාර්ය ආභිධර්මික කුකුල්නාපේ ශ්‍රී දෙව රක්ෂිතාභිධාන ස්ථවිර පාදයන් වහන්සේ ඉතා සැලකිල්ලෙන් මෙහි ශුද්ධි පත්‍රාවලොකනය කර වදාළ බව ගෞරවයෙන් සිහිපත් කරණ අතරම ආචාර්ය පණ්ඩිත වේරගොඩ අමරමොලි ස්ථවිර පාදයන් වහන්සේගෙන් ලැබුනු ආධාරය ද සතුටින් සඳහන් කරණු කැමැත්තෙමි.

තවද අපගේ ධර්මාචාර්යවූ විද්‍යොදය පිරිවෙණෙහි උපප්‍රධානාචාර්ය ත්‍රිපිටක වාගීශ්වර පණ්ඩිත වැලිවිටියේ සොරතාභිධාන ස්ථවිරපාදයන් වහන්සේ ද, පණ්ඩිත පලන්නොරුවේ විමලධම්ම ස්ථවිර පාදයන් වහන්සේ ද, ආචාර්ය දෙවුන්දර වාචිස්සර ස්ථවිර පාදයන් වහන්සේ ද ආචාර්ය භක්තියෙන් යෙදී මෙහිලා අනුස්මරණය කරමි

එසේම තවදත් මගේ අභිවෘද්ධියට හිතැ'ති මාරපණ ශාසනොදය පිරිවෙණෙහි ප්‍රධානාචාර්ය පණ්ඩිත කිරිඇල්ලේ ඤාණවිමල ස්ථවිර පාදයන් වහන්සේ හා ජී. කේ. මාරාජාසිංහ උහන්ඩිවිට පඬිතුමා ද මෙහිදී හැම අයුරින් ම උපෂ්ටම්භකවූ බව කෘතඥතා පූර්වකව සඳහන් කරණු කැමැත්තෙමි.

**මෙහි ප්‍රමාද භ්‍රමාදියෙන් සඤ්ජාත දොෂස්ථාන වෙත් නම් එහිදී සුධීහු සමාධිය භජනය කරත්වා.**

**මේ ග්‍රන්ථය ශ්‍රද්ධාවෙන් මුද්‍රණය කර වූ වර්ෂ 1934 රේ පටන් ඇසුරු කළ; රොමානු කතොලික ලබ්ධිකයෙකු වූ, මා හිතෛෂී එච්. පී. ෆ්‍රැන්සිස් ජයවික්‍රම මහතා බෞද්ධ ලබ්ධිකයෙකු වූ බව මෙහිලා සඳහන් කරන්නට ලැබීම මට මෙන් ම ශාසනස්ථිති කාමී සැමදෙනාගේ ම ප්‍රීතියට කරුණක්වනු නියතය. තරුණ වියෙහි සිටින ඒ මහතා 'චූකලී විමර්ශන බුද්ධියෙන් යුත් ඇත්ත දුටුතැන ගරුකරණ ජාති මමත්වයෙන් ඔද වැඩුනු මතා චරිතය කින් යුත් නිරහඞ්කාර නියම මහත්මාගති ඇත්තෙකු බැව් ද අවඞ්කාධ්‍යාශයෙන් මතක් කරමි.**

මෙයට,

**උහන්ඕවිට ශාසනතිලක**

$\frac{2485}{1942}$ ජනවාරි 1 දින හත්තක

මාලිගාතැන්නේ පුරාණ විහාරස්ථානයේ දී ය,
පිටිගල.

# ප්‍රකාශකයාගේ නිවේදනය.

වර්ෂ 1934 පටන් මේ දක්වා ගෞ. උභන්ඹිවිට සාසනතිලක ස්වාමිපාදයන් වහන්සේ ඇසුරු කරමින් කල් ගැවූ මට සිංහල වර්ගයාගේ ජාතික ආගම බුද්ධාගම බවත්, කිසිම ගැලවුම් කාරයෙකුගේ පිහිටක් නැතිව මොක්ෂ මාර්ගය තමහට ම සොයාගතහැකි එකායන මාර්ගය පෙන්වූ අසහාය ධර්ම දෙශකයන් වහන්සේ බුදුරජාණන් වහන්සේ බවත්, මේ ලෝකයෙහි තිබෙන ආගම් අතුරෙන් මැවුම් කාරයෙක් නැතිව හේතු-ප්‍රත්‍යය ධර්මයන්ගේ බලය නිසා සතර මහා භූතයන්ගේ පහළවීමෙන් ලෝකය ඇතිවූ බව තර්කානුකූලව උගන්වන ආගම බුද්ධාගම බවත්, මනුෂ්‍යයන්ට යථා මාර්ගය පෙන්වීමට උන්වහන්සේ වෙනුවෙන් ඉදිරිපත් වී සිටින එකම ධර්මදූත පිරිස මහා සඞ්ඝරත්නය බවත් වැටහුනෙන් සත්‍යය දැක දැකත් ඊට පිටු නොපෑම මනුෂ්‍ය සභ්‍යත්වයේ ශ්‍රේෂ්ඨ ගුණාඞ්ගයක් හෙයින් මෙතෙක් කල් වැළඳ සිටි කතොලික ලබ්ධිය හැර බෞද්ධයෙක් වීමි.

කල්‍යාණ මිත්‍ර සෙවනයෙන් ලැබිය හැකි අර්ථය ඉතා මහත්ය. යුරොපිය තුන් ජාතියක් විසින් බලයෙන් හා ධනයෙන් පිළිගැන්වූ යුරෝපීය සිරිත්-විරිත් හා ලබ්ධියත් වෙනස් කොට සිංහලයන්ගේ ජාතියත්, ඥනයත්, ශිෂ්ටාචාරයත් රැකදුන් බුදුසමය පිළිගෙණ නුදුරු අනාගතයෙහි පෙර මෙන්ම ලක්දිව ධර්මද්වීපයක් කිරීමට සෑම සිංහල සහෝදරයෝ ම සිතට ගණිත්වා!

එමෙන් ම අපේ පින්වත් සෑම බුඬපුත්‍රයාණන් වහන්සේ නමක් ම අන්‍ය ලබ්ධික ස්වකීය ජනතාව කෙරෙහි සානුකම්පිතව ඔවුන්ට යහපත් මාර්ගය පෙන්වා සම්‍යග් දෘෂ්ටිකයන් කරවන ලෙස ආරාධනය කරමි.

මා බෞද්ධයෙකුවීම නිමිති කොටගෙන ප්‍රතිපත්ති ශාසනය ඉගෙණ ගන්නවුන්ට අතිශයින් ප්‍රයෝජනවත්වූ මේ විනය ගැටපදය ලාංකික බෞද්ධයන්ගේ අතට පැමිණවීමට අදහස්කොට මෙසේ පළ කෙළෙමි.

මිට, සත්‍යගරුක:
එච්. පී. ප්‍රැන්සිස් ජයවික්‍රම.

2485/1941 ජනවාරි 1. දින දීය.



එච්. පී. ප්‍රැන්සිස් ජයවික්‍රම මහතා

# මහවග ගැටපදය

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

1. පිට

**උරුවෙලායං,**- උරුවෙල් දනව්වෙහි (වෙලා අතික්කමන හෙතු ආනීතා උරු= උරුවෙලා); **නජ්ජා නෙරඤ්ජරාය තීරෙ,**- නේරඤ්ජරා නම් නදීහුගේ ඉවුර සමීපයෙහි; **බොධිරුක්ඛමූලෙ,**- බොධිවෘක්ෂ මූල යෙහි; **පඨමාභිසම්බුද්ධො,**-අභිසම්බුඩව(නොහොත්) අභිසම්බොධියට පැමිණ පළමු කොට ම; **සත්තාහං,**- සත්දවසක් මුළුල්ලෙහි; **විමුත්තිසුඛ පටිසංවෙදී,**--විමුක්ති සැපය විඳිනසේක්; හෙවත්,- පලසමවත් සුව විඳිනසේක්; **පටිච්චසමුප්පාදං,**- ප්‍රතීත්‍ය සමුප්පාදය (නොහොත්) ප්‍රත්‍යයාකාරය; **අවිජ්ජාපච්චයා,**- අවිද්‍යා හේතුවින්; **විරාගා,** වැළැක්මෙන්(නොහොත්) නො ඇලීමෙන්; **නිරොධා,** නිරුඬ කිරීමේ හේතුවෙන්; **ඉමං උදානං,** මේ ප්‍රීති වාක්‍යය;

2. පිට

1. **යදා හවෙ,** යම් කාලෙක්හි(හෙවත්)යම්කෙලශ යුඩයෙක්හි; **ආතාපිනො,** කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ; **ඣායතො,** ආරම්මණො'පනිධ්‍යාන ලක්ඛණො'පනිධ්‍යාන වශයෙන් ධ්‍යායී වූ; **බ්‍රාහ්මණස්ස,** බාහිත පාපී ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයාහට; **ධම්මා,** අනුලොම ප්‍රත්‍යයාකාර ප්‍රතිවෙධ සාධක බොධිපාක්ෂිය ධර්මයෝ, නොහොත් චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයෝ; **පාතුභවන්ති,** උපදිද් ද, නොහොත් අභිසමය වශයෙන් පහළවෙත් ද; **අථ,** එකල්හි; **යතො,** යම් හෙයකින්; **සහෙතු ධම්මං,** අවිද්‍යාදී හෙතුසහිත සියලු දුඃඛස්කන්ධ ධර්මය; **පජානාති.** දනී ද;(එහෙයින්) **අස්ස,** ඔහුගේ; **සබ්බා කඞ්ඛා,** සියලු කාඞ්ක්ෂාවෝ; **වපයන්ති,** නිරුඬ වෙත්; [මෙය ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය ප්‍රත්‍යවෙක්ෂා කිරීම් වශයෙන් වදාරණ ලදී.]

2. **යතො,** යම් හෙයකින්; **පච්චයානං,** ප්‍රත්‍යයන්ගේ (නොහොත්) හේතුන්ගේ; **ඛයං,** ක්ෂය; **අවෙදි,** දැනගත් සේක් ද; එහෙයිනි. (සෙස්ස පෙරමෙනි) [මෙය නිර්වාණ ධර්මය ප්‍රත්‍යවෙක්ෂා කිරීම් වශයෙන් වදාරණ ලදී.]

3. **අන්තලික්ඛං**, අහස; **ඔභාසයං**, බබලවන්නා වූ; **සූරියෝව**, සූර්‍ය්‍යයා මෙන්; **මාරසෙනං**, මාරසෙනාව නොහොත් කෙලෙශ සමූහය; **විධූපයං**, කම්පනය කෙරෙමින්; **තිට්ඨති**, සිටියි; (සෙස්ස පෙර මෙනි) [මෙය මාර්ගය ප්‍රත්‍යවෙක්ෂා කිරීම් වශයෙන් දෙශිතය]

**බොධිකථා නිට්ඨිතා.**

---

**තම්හා සමාධිම්හා**, ඒ ඵලසමවතින්; **අජපාලනිග්‍රොධො**, අජපල් නුගය; **හුහුඞ්කජාතිකො**, මානවශයෙන් හා ක්‍රොධ වශයෙන්; "හුහුං" යයි ශබ්ද කරණ ස්වභාව ඇත්තා වූ; **කිත්තාවතා නු ඛො**, කොපමණකින් වනාහි; **භො ගොතම**, භවත් ගෞතමයන් වහන්ස; **බ්‍රාහ්මණ කරණ ධම්මා**, බමුණෙකු කරණ ධර්මයෝ;

3. පිට

4. **යො**, යමෙක්; **බාහිත පාප ධම්මො**, බැහැර කරණලද පාපධර්ම ඇත්තේ ද; **නිහුහුඞ්කො**, මානාදි වශයෙන් කරණ 'හුහුං' යන අනුකරණ නැත්තේ ද; **නික්කසාවො**, පහවූ රාගාදී කසට ඇත්තේ ද; **යතත්තො**, භාවනානුයොගී සිත් ඇත්තේ ද(නොහොත්,ශිලසංවරයෙන් සංයත වූයේ ද; **වෙදන්තගූ**, චතුර්මාර්ගඥාන සඞ්ඛ්‍යාත වෙදයෙන් අන්තයට පැමිණියේ ද; **වුසිත බ්‍රහ්මචරියො**, වැස නිමවන ලද මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යය ඇත්තේ ද **යස්ස**, යමෙකු හට; **ලොකෙ**, සකල ලොක සන්නිවාසයෙහි; **කුහිඤ්චි**, කිසියම් එකාරම්මණයෙක්හි දු; **උස්සදා**, රාගාදී පඤ්චවිධ උස්සදයෝ; **න සන්ති**, නොවෙද් ද; **සො**, හෙතෙමේ; **බ්‍රහ්මවාදං**, මම බ්‍රාහ්මණයෙක්මි යි; **ධම්මෙන**, දැහැමෙන්; **වදෙය්‍ය**, කියන්නේ ය.

**අජපාල කථා නිට්ඨිතා.**

---

**මුචලින්දො**, මිදෙල් රුක; **මහා අකාලමෙඝො**, මහත් අකාල මෙඝයක්; **සත්තාහවද්දලිකා**, හද වැස්සක් ඇති; **සීත වාත දුද්දිනී**, සිසිල් සුළඟින් වැලලී දවාල ඇති; **භොගෙහි**, දරණ වැලින්; **පරික්ඛිපිත්වා**, වටකොට; **උපරි මුද්ධනි**, හිස මත්තෙහි; **මහන්තං ඵණං**, මහත් පෙණගොබක්; **මා භගවන්තං සීතං**, ශීතය තෙමේ භාග්‍යවතුන් නොපෙළා වා; **විද්ධං**, දුරුවූ; **විගතවලාහකං**, පහවූ වලාපටල ඇති; **දෙවං විදිත්වා**, අහස දැන; **විනිවෙඨෙත්වා**, වෙළුම් හැර; **පටිසංහරිත්වා**, හකුළුවා; **පඤ්ජලිකො**, ඇඳිලි බැඳීම් ඇත්තේ;

5. **සුතධම්මස්ස,** ප්‍රකාශිත ධර්‍ම ඇත්තාවූ; **පස්සතො,** එය වීර්‍ය්‍ය බලයෙන් අධිගත නුවණැසින් බලන්නාවූ; **තුට්ඨස්ස,** චතුමග්ග ඥාණසන්තොසයෙන් සතුටුවූවහුගේ; **විවෙකො,** උපධිවිවේක සංඛ්‍යාත නිර්‍වාණය; **සුඛො,** සැපයි; **ලොකෙ,** ලොකයෙහි; **අබ්‍යාපජ්ජං,** අව්‍යාපාද ස්වභාවය; (හෙවත්) නොකිපෙන සුලුබව; **සුඛං,** සැපයි; [මින් මෛත්‍රී පූර්‍වභාගය දක්වන ලදී] **පාණභූතෙසු,** සත්වයන් කෙරෙහි; **සංයමො,** අවිහිංසන භාවය සැප වෙයි. [මින් කරුණා පූර්‍ව භාගය කථිත යි.]

6. **ලොකෙ,** ලොකයෙහි; **විරාගතා,** විරාගභාවය; **සුඛා,** සැපයි; **කාමානං,** කාමයන්ගේ; **සමතික්කමො,** ඉක්මවීම ද; [මින් අනාගාමි මාර්ගය ප්‍රකාශිතයි;] **අස්මිමානස්ස,** අස්මිමානයාගේ, **යො විනයො,** යම් හික්මවීමක් වේ ද; [මින් අර්හත්වය දෙශිත යි] **එතං** මෙය; **වෙ,** ඒකාන්තයෙන්; **පරමං සුඛං,** උත්තම වූ සැපය යි.;[මින් පිටත් සැපතක් නම් නැතැයි යූසේ යි]

### මුචලින්ද කථා නිට්ඨිතා.

---

**රාජායතනං,** කිරිපලු රුක; **තපුස්සභල්ලිකා,** එනම් වෙළඳ දෙබෑයෝ; **උක්කලා,** උක්කල නම් ජනපදයෙන්; **තංදෙසං,** ඒ මධ්‍ය දෙශයට; **අද්ධානමග්ගපටිපන්නා හොන්ති,** අදන් මගට පිළිපන්නාහු වෙත්; **ඤාතිසාලොහිතා දෙවතා,** සහලේ නෑවූ දේවතාවෙක්; **මන්ථෙන ච,** අත් සුන්තෙන් ද; **මධුපිණ්ඩිකාය ච,** මීපිඬු යෙන් ද; **පතිමානෙථ,** ලඟට ගොස් පුදව්;

**චෙතොපරිවිතක්කං,** සිත සම්බන්ධ වූ හාත්පස විතර්කය; **පච්චග්ගෙ,** වෙන්වසයෙන් මාහැඟි වූ; නොහොත් අළුත් වූ; **ද්වෙවාචිකා,** වචන දෙකකින් සරණගියා වූ;

### රාජායතන කථා නිට්ඨිතා.

---

**රහොගතස්ස,** රහසිගත වූ; **පටිසල්ලීනස්ස,** ප්‍රතිසංලීන වූ, හෙවත් ඵලසමවතින් සමන්විත වූ; **අධිගතො,** අවබොධ කරණ ලද් දේය; **දුරනුබොධො,** දුකසේ අවබොධ කටයුතුයි; **අතක්කාවචරො,** තර්කයෙන් නොබැසගත හැකි වේ; **නිපුණො,** සියුම් ය (නොහොත්) දක්ෂ නුවණට ගොචර ය; **ආලයරාමා,** පඤ්චකාම ගුණ යෙහි රමණය කරන්නීය; **ආලයරතා,** ආලයෙහි ඇලුනා ය; **ආලයසම්මුදිතා,** ආලයෙන් අතිශයින් සතුටු වූවා ය; **දුද්දසං,** දුක

**සේ** දක්කයුතු ය; **ඉදං ඨානං**, මේ කාරණය තෙමේ; **සුදුද්දසං**, අතිශයින් දුකසේ දක්ක යුතුයි; **සො**, ඒ ධර්මදේශනා කිරීම; **අනච්ඡරියා**, පුදුමයට සුදුසුය; **පටිභංසු**, වැටහුනාහු ය;

7. **මම**, මා විසින්; **කිච්ඡෙන**, දුකසේ; **අධිගතං**, අවබෝධ කරණ ලද චතුරාර්‍ය සත්‍ය ධර්මය තෙමේ; **ඉදානි**, දැන්; **පකාසිතුං**, ප්‍රකාශ කරන්ට; **අලං**, කම් නැත; **අයං ධම්මො**, මේ ධර්මය තෙමේ; **රාග දොස පරෙතෙහි**, රාග ද්වේෂයෙන් යුක්තවූවන් විසින්; **න සුසම්බුද්ධො**, සුවසේ අවබෝධ නො කට හැකි වෙයි;

8. **නිපුණං**, සියුම් වූ; **ගම්භීරං**, ගැඹුරු වූ; **දුද්දසං**, දුකසේ දක්ක යුතු වූ; **අණුං**, සියුම් වූ; **පටිසොත ගාමිං**, නිර්වාණ ගාමී වූ ධර්මය; **රාගරත්තා**, රාගයෙන් රත්වූ; **තමොක්ඛන්ධෙන**, අවිද්‍යාන්ධකාර රාශියෙන්; **ආවටා**, වැසුනා වූ සත්ත්වයෝ; **න දක්ඛින්ති**, නො දක්නාහ.

**ඉතිහි**, මෙසේ වනාහි; **පටිසංචික්ඛතො**, සලකන්නා වූ; **අප්පොස්සුක්කතාය**, අල්පෝත්සාහී භාවයට; **නිහන්තවා**, ගසා; **අප්පරජක්ඛ ජාතිකා**, නුවණ නමැති ඇසෙහි ස්වල්ප වූ රාගාදී රජස් ස්වභාව ඇති; **අස්සවණතා**, අශ්‍රවණයෙන් (යලොපයයි) **පරිහායන්ති**, පිරිහෙත්; **ධම්මස්ස අඤ්ඤාතාරො**, ධර්මය දැනගන්නෝ;

9. **පුබ්බෙ**, පෙර; **සමලෙහි**, රාගාදී මල සහිත වූ ෂට් ශාස්තෘන් විසින්; **චින්තිතො**, සිතන ලද්දා වූ, **අසුද්ධො**, අපිරිසිදු වූ; **ධම්මො**, මිථ්‍යාදෘෂ්ටි ධර්මය; **මගධෙසු**, මගධ ජනපදයන්හි; **පාතු අහොසි**, පහළ වූයේය; **අමතස්සද්වාරං**, නිර්වාණ ද්වාරය වූ; **එතං**, මේ ආර්ය මාර්ගය; **අවාපුර**, විවෘත කළ මැනවි; **විමලෙන**, අතිශයින් පරිශුද්ධ වූ; (ඔබවහන්සේ විසින්) **අනුබුද්ධං**, අවබෝධ කළාවූ; **ධම්මං**, ධර්මය; **සුණන්තු**, අසත්වා.

10-11. **සමන්ත චක්ඛු**, සමතැස් ඇති; **සුමෙධ**, සුන්දර ප්‍රාඥයන් වහන්ස; **සෙලෙ පබ්බත මුද්ධනි**, ශෛලමය පර්වතයක් මුදුනෙහි; **ඨිතො**, සිටියෙක් තෙම; **සමන්තතො**, හාත්පස; **ජනතං**, ජන සමූහයා; **යථාපි පස්සෙ**, යම් සේ දකී ද; (එසේ) **අපෙත සොකො**, පහවූ සෝක ඇති ඔබ වහන්සේ; **තදූපමං**, ඒ ශෛල පර්වතය උපමාකොට ඇති; **ධම්මමයං**, ධර්මය ම වූ; **පාසාදං**, පහයට; **ආරුය්හ**, නැඟ; **ජාති ජරාභිභූතං**, ජාති ජරාවෙන් මඩනා ලද; **සොකාවතිණ්ණං**, සෝකයට බැසගත්; **ජනතං**, ජන සමූහයා; **අවෙක්ඛස්සු**, බලනු සේක්වා,

12. **විජිත සඞ්ගාම**, දිනූ මරයුද ඇති; **සත්ථවාහ**, විනෙය ජනයා සසරින් එතරකරණ හෙයින් සාර්ථවාහක වූ; **අණන**, කාමච්ඡන්දාදි ණය රහිත වූ; **වීර**, වීරයන්වහන්ස; **උට්ඨෙහි**, නැගී සිටිනු මැනවි., **ලොකෙ**, ලොකයෙහි; **විචර**, චාරිකා වශයෙන් හැසිරෙණු මැනවි.; **භගවා**, භාග්‍යවත් තෙමේ; **ධම්මං**, ධර්මය; **දෙසස්සු**, දෙසනු මැනවි.; **අඤ්ඤාතාරො**, ධර්මය දැනගන්නෝ; **භවිස්සන්ති**, වන්නාහ.

**අජ්ඣෙසනං**, යාච්ඤාව (ආරාධනය); **කාරුඤ්ඤතං පටිච්ච**, කරුණාවද් භාවය නිසා; **බුද්ධචක්ඛුනා**, ඉන්ද්‍රිය පරොපරියත්ත ඥාන ආසයානුසය ඥාන සඞ්ඛ්‍යාත බුදු ඇසින්; **තික්ඛින්ද්‍රියෙ**, තීක්ෂණ වූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇත්තාවූ ද; **ස්වාකාරෙ**, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ යහපත්වූ ආකාර ඇත්තාවූ ද; **සුවිඤ්ඤාපයෙ**, සුවසේ හැඟ විය හැක්කාවූ ද(නොහොත්)සුවසේ අවබොධ කරණ නුවණ ඇත්තා වූ ද; **පරලොක වජ්ජභය දස්සාවිනො**, පරලොව වරදද භය වශයෙන් දක්නා සුලු වූ; **උප්පලිනියං වා**, උපුල් විලෙක හෝ; **පදුමිනියං වා**, පියුම් විලෙක හෝ; **පුණ්ඩරීකිනියං වා**, හෙල පියුම් විලෙක හෝ;

## 6. පිට

**උදකානුග්ගතානි**, දියෙන් උඩට නොනික්මුනා වූ; **අන්තො නිමුග්ග පොසීනි**, ඇතුළත ගැලී වැඩෙන; **සමොදකං ඨිතානි**, දිය සමකොට සිටියාවූ; **උදකා අච්චුග්ගම්ම**, ජලයෙන් නැගී (නොහොත්) ජලය ඉක්මවා; **අනුපලිත්තානි**, නොතැවරුණාවූ;

13. **බ්‍රහ්ම**, එම්බා බ්‍රහ්මය; **විහිංස සඤ්ඤී**, කාය වාක්කලමථ සංඥා ඇත්තෙමි; **මනුජෙසු**, සත්වයන් විෂයයෙහි; **පගුණං**, ප්‍රගුණ වූ; **පණීතං ධම්මං**, උතුම් ධර්මය; **න භාසිං**, නො කීයෙමි, **තෙසං**, ඒ සත්වයන්ට; **අමතස්ස ද්වාරා**, අමෘත ද්වාරයෝ; **අපාරුතා**, විවෘතයහ; **යෙ**, යම් කෙනෙක්; **සොතවන්තො**, ඇසීමට කන් ඇත්තෝ වෙත් ද (හෙවත්) අසනු කැමති වෙත් ද (ඔව්හු); **සද්ධං**, ශ්‍රද්ධාව; **පමුඤ්චන්තු**, එලවත්වා;

බ්‍රහ්මයාචන කථා නිට්ඨිතා.

---

## 7. පිට

**ආජානිස්සතීති**, දැනගන්නේ යයි; **අන්තරහිතා**, අතුරුදහන් වූ

**ඤාණං**, ඥාන දර්ශනය; **මහාජානියො ඛො**, මහත් හානි ඇත්තෙක; **අභිදොසකාලකතො ඉති**, ඊයේ රෑ සැන්දෑවේ කාලක්‍රියා කළේ යයි; **පධාන පහිතත්තං**, වීර්‍ය වැඩීමට මෙහෙයන ලද සිත් ඇති; **බහුකාරා**, බොහෝ උපකාර කළෝය; **මිගදායෙ**, මුව වනයෙහි වූ; **යථාභිරන්තං**, අදහස් පරිදි; **අන්තරා ච ගයං අන්තරා ච බොධිං**, ගයාවට ත් බොධියට ත් අතර; **අද්ධානමග්ග පටිපන්නං**, අදන් මගට පිළිපන්නා වූ; **විප්පසන්නානි ඛො**, විශෙෂයෙන් ප්‍රසන්නයහ, **ඡවිවණ්ණො**, ශරීර වර්ණය; **පරියොදාතො**, අතිශයින් නිර්මලය; **රොචෙසීති**, රුචි කරන්නෙහි දැයි.

14. **සබ්බෙසු ධම්මෙසු**, සියලු ත්‍රෛභූමික ධර්මයන්හි; **අනූපලිත්තො**, ක්ලේශ වශයෙන් නොතැවරුණාවූ; **සබ්බඤ්ජහො**, සියලු ත්‍රෛභූමික ධර්ම දුරුකළා වූ; **තණ්හක්ඛයෙ**, තෘෂ්ණා ක්ෂය සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි; **විමුත්තො**, අරමුණු වශයෙන් මිදුණා වූ; **සබ්බාභිභූ**, සියලු ත්‍රෛභූමික ධර්මයන් මැඩපවත්වමින් සිටියා වූ; **අහං**, මම; **සබ්බවිදූ අස්මි**, සියලු චාතුර්භූමික ධර්මයන් දක්නෙක් වෙමි; **සයං**, තෙමේ; **අභිඤ්ඤාය**, විශිෂ්ට ඥානයෙන් දැන; **කං**, කවරෙකු; **උද්දිසෙය්‍යං**, ඇදුරු ලෙස උදෙසම් ද ?

15. **මෙ**, මට; **ආචරියො**, ධර්මාචාර්යයෙක්; **න අත්ථි**, නොමැත; **මෙ**, මට; **සදිසො**, තුල්‍යයෙක්, **න විජ්ජති**, විද්‍යමාන නොවෙයි; **සදෙවකස්මිං ලොකස්මිං**, දෙවියන් සහිත ලොකයෙහි, **මෙ**, මට, **පටිපුග්ගලො**, ප්‍රතිභාග පුද්ගලයෙක්; **නත්ථි** නැත..

16. **ලොකෙ**, ලොකයෙහි; **අහං හි**, මම ම; **අරහා**, රහත් වෙමි; **අහං**, මම; **අනුත්තරො**, නිරුත්තර වූ; **සත්ථා**, ශාස්තෘ වෙමි; **සීතිභූතො අස්මි**, කෙලෙස් ගිනි නිවීමෙන් සිසිල් වූයේ වෙමි; **නිබ්බුතො**, එහෙයින්ම නිවුනේ වෙමි; **එකො**, අසහාය වූ; **සම්මා සම්බුද්ධො අස්මි**, සම්‍යක් සම්බුද්ධ වෙමි;

17. **අන්ධභූතස්මිං**, අවිද්‍යාවෙන් අන්ධ වූ; **ලොකස්මිං**, ලොකයෙහි; **අමතදුන්දුභිං**, අමාබෙරය; **ආහඤ්ඤං**, ප්‍රහරණය කරවන්ට **ධම්මචක්කං**, ධර්මචක්‍රය; **පවත්තෙතුං**, පැවැත්වීම පිණිස, **කාසිනං පුරං**, කසීරට (බරණැස් නුවර) බලා; **ගච්ඡාමි**, යෙමි;

18. **උපක**, උපකාජීවකයෙනි! **යෙ**, යම්කෙනෙක් තුමූ; **ආසවක්ඛයං**, නිවණට; **පත්තා**, පැමිණියාහු වෙත් ද, **තෙ**, ඒකාන්තයෙන්; **මාදිසා**, මා වැන්නෝ; **ජිනා හොන්ති**, ජින නම් වෙත්; **මෙ**, මා විසින්; **පාපකා ධම්මා**, පාපධර්මයෝ; **ජිතා**, දිනන ලදහ; **තස්මා**, එහෙයින්; **අහං**, මම; **ජිනො**, 'ජින' නම් වෙමි.

8. පිට

**භුඤ්ජෙය්‍ය අපි ඉති**, වළඳනට ද් හැකැ යි; **උම්මග්ගං ගහෙත්වා**, නොමඟක් ගෙණ; **කතිකං**, කතිකාවක්; **සණ්ඨපෙසුං**, තබාගත්තහුය; **බාහුලිකො**; චීවරාදී බහුල බැව් ඇතියේ; **පධාන විබ්භන්තො**, පදන් වීයයීයෙන් බැහැරවූයේ; **බාහුල්ලාය**, ප්‍රත්‍යය බහුල කොට ඇති බවට; **ආවත්තො**, පෙරළුණේ; **පාදොදකං**, පා දෝනාදිය ද; **පාදපීඨකං**, පා පුටුව ද; **පාදකඨලිකං**, පාපෝරුව ද; **උපනික්ඛිපි**, එලවා තැබූයේය; **පාදෙ පක්ඛාලෙසි**, පා සේදූසේක; **අපිස්සු**, එසේ ද වුව ත්; **සමුදාචරන්ති**, කතා කෙරෙත්; **බද්ධහථ**, පිහිටූ වච්; **යථානුසිට්ඨං**, යම්සේ අනුසාසනා කරණ ලද්දේ නම්; **තථා**, එපරිද්දෙන්; **අලං**, කෙලශ ප්‍රහාණයට පොහොසත් වූ; **අරියඤාණ දස්සන විසෙසං**, උත්තම ඥාන දර්ශන විශෙෂය කට, **නෙවජ්ඣගා**, නො පැමිණියෙහි ය; **අභිජානාථනු**, දන්නහුදූයි; **අසක්ඛි ඛො**, හැකිවූයේ ම ය;

9. පිට

**සුස්සූසිංසු**, මනාකොට අසනු කැමති වූ; ඇසුවාහු යි; **ඔදහිංසු**, යොමු කළාහු ය; **අඤ්ඤාය**, දැනගැණීම පිණිස; **උපට්ඨාපෙසුං**, එළඹ වූවාහුය.; **පොථුජ්ජනිකො**, පෘථජ්ජනයන්ට අයිති වූවකි; **චක්ඛුකරණී**, පැණැස් ඇතිකරන්නීය; **ඤාණකරණී**, නුවණ ඇතිකරන්නීය; **උපසමාය**, ව්‍යුපශමනය පිණිස; **අභිඤ්ඤාය**, විශෙෂාවබොධය පිණිස;

10. පිට

**අනනුස්සුතෙසු**, නො ඇසූ විරූ; **පරිඤ්ඤෙය්‍යං ඉති**, පිරිසිඳ දතයුතු යයි; **පහාතබ්බං ඉති**, ප්‍රහාණය කටයුතු යයි; **සච්ඡිකාතබ්බං ඉති**, ප්‍රත්‍යක්ෂ කටයුතු යයි; **යාව කීවඤ්ච**, යම් පමණ කාලයක්; **තිපරිවට්ටං**, පරිවෘතති තුනක් ඇත්තාවූ; **ද්වාදසාකාරං**, දෙළොස් ආකාරයක් ඇත්තා වූ; **න සුවිසුද්ධං අහොසි**, අතිශයින් පිරිසිදු නොවූයේද; **අභිසම්බුද්ධො**, විශෙෂයෙන් අවබොධ කොළෙම් යයි; **නෙව පච්චඤ්ඤාසිං**, නොම ප්‍රතිඥ කොළෙම්; **ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං**, මේ නිගීථක සූත්‍රය; **භඤ්ඤමානෙ**, දෙසනු ලබන කල්හි; **විරජං**, රාගාදී රජස් රහිත වූ; **වීතමලං**, කෙලෙස් මලයෙන් තොර වූ; **සමුදය ධම්මං**, හට ගැණීම සවභාව කොට ඇත්තා වූ;

11. පිට

**අප්පතිවත්තියං**, ප්‍රතිවිරුඬව පැවැත්විය නොහැක්කා වූ; **භුම්මා දෙවා**, භූමිනිඃශ්‍රිත දෙවියෝ; **සද්දමනුස්සාවෙසුං**, (සාධුනාද)ශබ්දය ඇස්වූහ. **තෙන ඛණෙන**, ඒ ක්ෂණයෙන්; **සඞ්කම්පි**, චංචල විය; **සම්ප**

**ඛමම්පි**, අතිශයින් චංචල විය; **සම්පවෙධි**, වෙව්ලුවේය; **උළාරො**, උදාරවූ; **දිට්ඨ ධම්මො**, දක්නාලද මාර්ග ධර්ම ඇති; **පත්ත ධම්මො**, පැමිණියාවූ ශ්‍රොතාපත්ති ඵල ධර්ම ඇති; **විදිතධම්මො**, අවබොධ කරණ ලද ධර්ම ඇති; **පරියොගාළ්හ ධම්මො**, බැසගත්තාලද ධර්ම ඇති; **තිණ්ණ විචිකිච්ඡො**, තරණයකළා වූ සැක ඇති; **විගත කථංකථො**, පහවූ සැක ඇති; **වෙසාරජ්ජප්පත්තො**, විසාරද බවට පැමිණියා වූ; **අපරප්පච්චයො**, පර ප්‍රත්‍යයක් නැත්තා වූ; **තදවසෙසෙ**, ඔහුගෙන් අවශෙෂ වූ; **අනුසාසියමානානං**, අනුශාසනා කරණු ලබන්නා වූ; **නිරොධ ධම්මං ඉති**, නිරුඬවන ස්වභාව ඇත්තේ යයි; **නීහාරභත්තො**, ඒළවා දුන් බත් ඇත්තේ; **ඡබ්බග්ගො**, සදෙනාගේ සමූහය තෙමේ;

12. පිට

**අත්තා අභවිස්ස**, ආත්මයක් වී නම්; **ආබාධාය**, රොග පිණිස; **ලබ්භෙථ ච**, ලැබිය හැකි ද වන්නේය; **සමනුපස්සිතුං**, නුවණින් දකින්නට;

13. පිට

**කල්ලං**නනු, සුදුසු ද; **නිබ්බින්දං**, කලකිරෙන්නේ, **විරජ්ජති**, නො ඇලෙයි; **ඉත්ථත්තායාති**, මෙසේ බව පිණිස(නොහොත්)මේ පස් කඳින් අන්‍ය වූ පඤ්චස්කන්ධයක් බව පිණිස; **පජානාති**, ප්‍රකාර යෙන් දනී;

**පඨමභාණවාරං**

---

**හෙමන්තිකො**, හෙමන්ත ඍතුවෙහි පරිභොග ය පිණිස වූයේ ය; **වස්සිකො**, වර්‍ෂාව ඇත්තා වූ; **නිප්පුරිසෙහි**, පුරුෂයන් රහිත වූ; **පරිචාරයමානො**, පරිචරණය කරණු ලබන්නේ; **හෙට්ඨා පාසාදං**, යට පහය ට; **න ඔරොහති**, නො බසී; **සමප්පිතස්ස**, පැමිණියා වූ නො හොත් පාවාදෙන ලද; **සමඞ්ගිභූතස්ස**, සමන්විත වූ; **පටිගච්චෙව**, පළමු කොටම; **ඔක්කමි**, බැස්සේය; **පරිජනස්සාපි**, පරිචාරික ජනයාට ද; **ඛායති**, දිලිහෙයි; **පටිබුජ්ඣිත්වා**, පිබිද; **සුපන්තං**, සයනය කරන්නා වූ; **අඤ්ඤිස්සා**, අන් එකියකුගේ; **කච්ඡෙ**, කිසිල්ලෙහි; **මුදිඞ්ගං**, මිහිඟු බෙරය ද; **ආලම්බරං** බෙරය ද; **විකෙසිකං**, විසුරුවන ලද කෙස් ඇති; **විකෙළිකං**, වහනය වන කෙළ ඇති; **විප්පලපන්තියො**, විලාප දෙඩන්නවුන් ද; **හත්ථප්පත්තං**, අතට පැමිණියා වූ; **නිබ්බිදාය**, කලකිරීමපිණිස; **සණ්ඨාසි**, පිහිටියේය.

### 14. පිට

**උපද්දුතං**, උපද්‍රැතය(උවදුරින් යුක්තය);**උපස්සට්ඨං ඉති**, රෝග විකාර ඇත්තේ යයි; **උදානං**, සංවේග වසයෙන් පැවැති වචනය; **උදානෙසි**, පිටකෙළේ ය; **සුවණ්ණපාදුකායො**, රන්මිරිවැඩි සඟලට; **නිවේසනද්වාරං**, ගෙයි දොර; **පච්චූස සමයං**, අලුයම් කාලයෙහි; **චඞ්කමා**, සක්මනින්; **හට්ඨො**, සතුටුවූයේ; **උදග්ගො**, ඔදවැඩියේ; **ඔකාරං**, ලාමක භාවය; **සංකිලෙසං**, කිලිටු වීම; **කල්ල චිත්තං**, කෙලෙසුන්ගෙන් නිරොගිවූ සිත් ඇති; **විනීවරණ චිත්තං**, නීවරණයන් ගෙන් පහ වූ සිත් ඇති; **සාමුක්කංසිකා**, තොමෝ ම උසස් වූ නොහොත් අතිසයින් ශ්‍රෙෂ්ඨ වූ; **අපගත කාලකං**, කිලුටෙන් පහ වූ; **රජනං**, රජනය නොහොත් සායම; **අස්ස දූතො**, අසුපිට නැගි දූතයන්; **ඉද්ධාභි සඞ්ඛාරං**, සෘද්ධ්‍යභි සංස්කරණ යක්; **අභිසඞ්ඛරෙය්‍යං**, කරන් නෙම් නම්;

### 15. පිට

**අපි පබ්බජෙය්‍යාති**, කිම දුටු දූයි; **නිකුඤ්ජිතං**, යටි කුරුවූ වක්; **භූමිං**, චතුස්සත්‍ය භූමිය; **පටිපස්සම්භෙය්‍ය**, ආපසු පෙරළන් නෙම් නම්; **හීනායාවත්තිත්වා**, ගිහිබවට හැරී; **අගාරික භූතො**, ගිහිවැසි වූ යේ; **පරිදෙව සොකසමාපන්නා**, විලාප සොකයට පැමිණියා ය; **සෙඛෙන ඤාණෙන**, ශෛක්ෂඥනයෙන්;

### 16. පිට

**අජ්ජතනාය**, අද පිණිස; **පච්ඡා සමණෙන**, පසුව යන මහණකු වූ;

**යසස්ස පබ්බජ්ජා නිට්ඨිතා**,

---

**පුරාණ දුතියිකා ච**, පුරාණ භාර්‍ය්‍යා තොමෝ ද; **වෙසාරජ්ජප්පත්තා**, විශාරද බවට පත්;

### 17. පිට

**සන්තප්පෙත්වා**, සතප්පා; **සම්පවාරෙත්වා**, පෙරළත්ත කොට වළඳවා; **භුත්තාවිං**, අනුභව කළාවූ; **ඔනීත පත්ත පාණිං**, පාත්‍රයෙන් ඉවතට ගත් අත් ඇති; **සන්දස්සෙත්වා**, මනාකොට කරුණු දක්වා; **සමාදපෙත්වා**, කරුණු සමාදන් කරවා; **සමුත්තෙජෙත්වා**, සිත්තියුණු කරවා; **සම්පහංසෙත්වා**, සතුටු කරවා; **සෙට්ඨානු සෙට්ඨීනං කුලානං**, සිටුඅනු සිටු කුලයන්ගේ; **නඔරකො**, ලාමක නොවෙයි;

**චතුගිහි සහාය පබ්බජ්ජා නිට්ඨිතා**,

18. පිට

**සා ච**, ඒ වැදෑරීම ම; **ජානපදා**, දන වූ වැසි වූ; **පුබ්බානු පුබ්බකානං**, පූර්වානු පූර්ව වූ නොහොත් පරම්පරා වශයෙන් පිළිවෙළින් ආවා වූ; **සබ්බ පාසෙහි**, සියලු කෙලශපාශයන් ගෙන්;

19. **දිබ්බා**, දිව්‍යමය වූ; **යෙ**, යම් කෙලශපාශයෝ වෙත් ද; **මානුසා**, මනුෂ්‍ය මය වූ; **යෙ ච**, යම් කෙලශපාශයෝ ත් වෙත් ද; **සබ්බපාසෙහි**, ඒ සියලු මලපත්වලින්; **බද්ධො අසි**, බැඳුනේ වෙහි ය; **මහා බන්ධන බද්ධො අසි**, මහත් කෙලශ බන්ධන යෙන් බැඳුනේ වෙහි ය; **සමණ**, ශ්‍රමණය; **මෙ**, මාගේ (පාසයෙන්,) **න මොක්ඛසි**, තුඹ නොමිදෙන්නෙහි ය.

20. **අහං**, මම; **යෙ දිබ්බා**, යම් දිව්‍යමය කෙලශපාශයෝ වෙත් ද; **යෙ ච මානුසා**, යම් මනුෂ්‍යමය කෙලශ පාශයෝ ත් වෙත් ද; **සබ්බ පාසෙහි**, ඒ සියලු පාසයන් කෙරෙන්; **මුත්තො**, මිදුනේ වෙමි. **මහාබන්ධන මුත්තො අම්හි**, තෘෂ්ණා නමැති මහත් වූ බැම්මෙන් මිදුනේ වෙමි; **අන්තක**, එම්බා පාපිවූ මාරය; **ත්වං**, තෝ; **නිහතො අසි**, නටුයේ වෙහි ය.

21. **අන්තලික්ඛ චරො**, අහසෙහි පවා හැසිරෙන්නාවූ; **මානසො**, චිත්ත සම්ප්‍රයුක්ත වූ; **යො අයං පාසො**, යම් මේ කෙලශපාශයක් තෙමේ; **චරති**, හැසිරේ ද; **තෙන**, එයින්; **තං**, තා; **බාධයිස්සාමි**, පෙළන්නෙමි; **සමණ**, ශ්‍රමණය; **මෙ**, මාගේ විෂය යෙන්; **න මොක්ඛසි**, තුඹ නොමිදෙන්නෙහි ය.

22. **රූපා**, ඉෂ්ටවූ රූපයෝ ය; **සද්දා**, ඉෂ්ට වූ ශබ්දයෝ ය; **රසා**, ඉෂ්ටවූ රසයෝ ය; **මනොරමා**, චිත්තාභිරාම වූ; **ඵොට්ඨබ්බා**, ස්පර්ශයෝ ය; (යත) **එත්ථ**, මෙහි; **මෙ**, මාගේ; **ඡන්දො**, ගෙහසිත තෘෂ්ණාව; **විගතො**, පහවූයේ ය; **අන්තක**, මාරය; **ත්වං**, තෝ; **නිහතො අසි**, නැසුනෙහි ය; හෙවත් මාගෙන් තෝ පැරදුනෙහි ය.

**"මාර කථා එකාදසමි නිට්ඨිතා"**

---

**පබ්බජ්ජාපෙක්ඛෙ**, පැවිදි අපෙක්ෂා කරන්නාවුන් ද; **කිලමන්ති**, වෙහෙසෙත්; **පතිසල්ලීනස්ස**, සිත එකඟ කළා වූ; **එතස්මිං පකරණෙ**, මේ කාරණයෙහි;

**තීහි සරණ ගමනෙහි උපසම්පදා කථා මාදසමි- නිට්ඨිතා.**

---

20. පිට

22. **මාරපාසෙහි**, මාරමල පුඩු වලින්; **මාරබන්ධන**, මර බැම් මෙන්;—සෙස්ස 18 හා සමයි.

23. **මාරපාසෙහි**, මාරමල පුඩුවලින්; **මාරබන්ධන**, මර බැම් මෙන්: සෙස්ස 19 හා සම යි.

**මග්ගා ඔක්කම්ම**, මාර්ගයෙන් ඉවත්ව; **අජ්ඣොගාහෙත්වා**, බැසගෙණ;

21. පිට

**භද්දවග්ගියා**, යහපත් සමූහයෙක්හි වූ; **සපජාපතිකා**, භාර්‍යාවන් සහිත වූවාහු; **පරිචාරෙන්ති**, පරිචරිණය කරවත්; **පජාපති**, බිරිඳක්; **වෙසි**, ගණිකාවක්; **වෙය්‍යාවච්චං කරොන්තා**, මෙහෙ කරන්නාහු; **යං වා**, යමක් හෝ ඇද්ද; **ගවෙසෙය්‍යාථ**, සොයන් නාහුය යන;

භද්දවග්ගිය සහායකානං වත්ථු නිට්ඨිතං

---

දුතියක භාරවාරං

---

22. පිට

**විනායකො**, විශේෂයෙන් නායක වූ හෙවත් හික්මවන්නා වූ; **පමුඛො**, පෙරටු කොට යන්නා වූ; **පාමොක්ඛො**, උතුම් වූ නොහොත් යහපත් ප්‍රඥා ඇත්තා වූ; **අගරු**, බර නො වේ නම්; **අග්‍යාගාරෙ**, ගිනිහල් ගෙයි; **ආසිවිසො**, දළුවිෂ ඇත්තා වූ නොහොත් ශීඝ්‍ර විෂ ඇත්තා වූ; **ඝොරවිසො**, දරුණු විෂ ඇත්තා වූ; **මා විහෙඨෙසි ඉති**, නො වෙහෙසාව යි; **ඉධස**, එසේ වී නම්; **තිණසන්ථරකං**, තණ ඇතිරියක්; **පධූපායි**, විෂ දුම් හැරියේය; **ජීවිං ච**, සිවිය ද; **අනුපහච්ච**, නො නසා=නො ගටා; **පරියාදියෙය්‍යං**, අභිබවන්නෙම් නම් නොහොත් නැති කරන්නෙම් නම්; **මක්ඛං**, කොපය; **අසහමානො**, නො ඉවසන්නේ; **සජොති භූතානං**, එළිය සහිත වූ; **සම්පජ්ජලිතං**, හාත්පසින් දිලිසුනාක් මෙන්; **ආදිත්තං විය**, ගින්නෙන් දල්වන ලද්දක් මෙන්; **පරියාදියිත්වා**, මැඩ පවත්වා=ගෙවා; **පරියාදින්නො**, ක්ෂය කරණ ලද්දේ යයි; නොහොත් මඩනා ලද්දේ යයි;

23. පිට

**යත්‍රහි නාම**, යමෙක් නම්; **යථා අහං**, මම යම්සේ ද එපරිද්දෙන්; **නත්වෙව ච ඛො අරහා**, රහත් නො වේ යයි;

24. **නෙරඤ්ජරායං**, "නෙරඤ්ජරා" නම් වූ නදිය සමීපයෙහි දී; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **උරුවෙල කස්සපං ජටිලං**, උරුවෙල් කසුප් දුළුල්ලාට; **අවොච**, මෙසේ වදාළ සේක; **කස්සප**, කාශ්‍යපය; **සචෙ**,ඉදින්; **තෙ**, තුඹට; **අගරු**, නො බර නම්; **අජ්ජුණ්හො**, අද දවස; **අග්ගිසරණම්හි**, ගිනිහල් ගෙයි; **විහරෙමු**, වාසය කරමු.

25. **මහා සමණ**, මහා ශ්‍රමණය; **මෙ**, මට; **න ඛො ගරු**, බර නො වෙයි; **එත්ථ**, මෙහි; **චණ්ඩො**, සැඩ වූ; **ඉද්ධිමා**, සෘද්ධි ඇත්තා වූ; **ආසිවිසො**, වහා පැතිරෙණ විෂ ඇති; **ඝොරවිසො**, කෲර විෂ ඇති; **නාගරාජා**, නා රජෙක්; (වෙසෙයි) **සො**, හෙතෙම; **තං**, තුඹ; **මා විහෙඨෙසී'ති**, නො පෙළාව යි; **ඵාසු කාමොව**, තුඹට පහසු කැමැත්තේ ම; **තං**, තුඹ; **නිවාරෙමි**, වළක්වමි;

26. **මං**, මා; **අප්පෙව න විහෙඨෙය්‍ය**, ඒ නාගරාජ තෙමේ නො වෙහෙසන්නේ නම්; **ඉඞ්ඝ**, එසේ ඇති කල්හි; **කස්සප**, කාශ්‍යපය; **ත්වං**, තුඹ, **අග්‍යාගාරං**, ගිනිහල් ගෙය; **අනුජානාහි**, අනු දන්න; **තං**, එය; **දින්නං ඉති**, දෙන ලදූයි; **විදිත්වා**, දැන; **අසම්භීතො**, නිභීයවූයේ; **භයං අතීතො**, බිය ඉක්මවූයේ; **පාවිසි**, ගිනිහල් ගෙට පිවිසි සේක;

27. **අහිනාගො**, සර්ප රාජ තෙමේ; **පවිට්ඨං**, පිවිසියාවූ; **ඉසිං**, බුදුන් වහන්සේ; **දිස්වා**, දැක; **දුම්මනො**, ක්‍රොධයෙන් දූෂිත සිත් ඇත්තේ; **පධූපායි**; විෂ ධූම හළේය; **සුමන මනසො**, පෙර බුදුවරුන්ට සමසිත් ඇති; **අධිමනො**, අධි චිත්ත ඇත්තා වූ; **මනුස්ස නාගො අපි**, මනුෂ්‍ය නාගයන් වහන්සේ ද; **තත්ථ**, එහි; **පධූපායි**, ප්‍රධූපනය (කළසේක)

28. **අහිනාගො**, සර්ප රාජ තෙමේ, **මක්ඛං**, කෝපය ද; **අසහමානො**, නො ඉවසන්නේ; **පාවකො ඉව**, ගින්නක් මෙන්; **පජ්ජලි**,දිලි සුනේ ය; **තත්ථ**;එතැන්හි දී;**තෙජොධාතුසු කුසලො**, තෙජෝ ධාතු සමාපත්ති විෂයෙහි දක්ෂ වූ; **මනුස්ස නාගො අපි**, මිනිස් නා තෙමේ ද; **පජ්ජලි**, දිලිසුනේ ය.

29. **උග්ගතානං,** දෙදෙන; **සජොතිභූතානං,** ගිනි සහිත වූ කල්හි; **අග්‍යාගාරං,** ගිනිහල් ගෙය; **ජටිලා,** දූළුල්ලෝ; **උදිච්චරෙ,** බැලූහ; නොහොත්; පිරිවැරූහ; **වත,** එකාන්තයෙන් ම; **අභිරූපො,** විශිෂ්ට රූප ඇත්තා වූ; **සමණො,** ශ්‍රමණ තෙමේ; **නාගෙන,** නාගයා විසින්; **විහෙඨියතී ඉති,** වෙහෙසනු ලැබේ ය යි; **භණන්ති,** කියත්.

30. **අථ,** නැවත; **'රත්තියා අච්චයෙන,** රෑ ඉකුත් වීමෙන්; **අහිනාගස්ස,** සර්ප රාජයාගේ; **අච්චියො,** කාන්තීහු; **න හොන්ති,** නො වෙත්; **ඉද්ධිමතො,** සෘද්ධිමත් වූ බුදුරජාතන් වහන්සේගේ ශරීරයෙන්; **උට්ඨිතා,** නැගී සිටියා වූ; **අනෙක වණ්ණා,** නොයෙක් වර්ණයෙන් යුත්; **අච්චියො,** රශ්මි; **හොන්ති,** වෙත්.

31. **අඞ්ගීරසස්ස,** සර්වඥයන් වහන්සේගේ; **කායෙ,** ශ්‍රී ශරීරයෙහි; **නීලකා,** නීල වර්ණ වූ ද; **අථ,** යළි; **ලොහිතිකා,** රක්ත වර්ණ වූ ද; **පීතිකා,** පීත වර්ණ වූ ද; **මඤ්ජෙට්ඨා,** මදට වන් වූ ද; **ඵලිකවණ්ණායො,** සඵටික මණි වර්ණ වූ ද; **අනෙක වණ්ණා,** නොයෙක් වර්ණයෙන් යුක්තවූ ද; **අච්චියො හොන්ති,** රශ්මිහු වෙති.

32. **කස්සප,** කාශ්‍යපය; **තෙ,** තාගේ; **අයං නාගො,** මේ නාගයා ය යි; **පත්තම්හි ඔදහිත්වා,** පාත්‍රයෙහි බහා; **අහිනාගං,** සර්පරාජයා; **බ්‍රාහ්මණස්ස,** බමුණා හට; **දස්සෙසි,** දැක්වූයේ ය; **තෙජසා,** මා තෙදින්; **අස්ස,** ඔහුගේ; **තෙජො,** තෙද, **පරියාදින්නො,** අභිභවනය කරණ ලද්දේය; නොහොත් විනාශිත ය.

24. පිට

**පුරිමානි වණ්ණනිභානි,** පළමු වර්ණ සටහන් වලට වඩා;

25. පිට

**පච්චුපට්ඨිතො,** එළඹ සිටියේ වෙයි; **කෙවලකප්පා අඞ්ගමගධා ච,** මුළු අඟු මගධ දෙරට වැස්සෝ; **අභික්කමිතුකාමා හොන්ති,** එළඹෙනු කැමැත්තාහු වෙත්; **අභිවඩ්ඪිස්සන්ති,** විශේෂයෙන් වැඩෙන්නේය.; **අනොතත්තදහෙ,** අනොතත්ත නම් විල සමීපයෙහි; **තෙ පටිවිංසො,** නුඹ වහන්සේගේ කොටස;

**පඤ්චමං පාටිහාරියං.**

26. පිට

**ධොවෙය්‍යං ඉති**, සෝදන්නෙම් දැයි.; **කිමඞ්ග නු භො**, කුමක නම්; **පරිමද්දෙය්‍යන්ති**, පිරිමදින්නෙම් දැයි; **උපනික්ඛිපි**, එළවා තැබුයේය; **ආලම්බිත්වා**, එල්බ; **උත්තරෙය්‍යන්ති**, ගොඩ නගින්නෙම් දැයි; **කකුධෙ**, කුඹුක් රුකෙහි; **සාඛං ඔනාමෙසි**, අත්තක් නැමූයේ ය; **විස්සජ්ජෙය්‍යන්ති**, දිගහරින්නෙම් (=වතන්නෙම්) දැයි;

27. පිට

**අලං**, කම් නැත; **එතං අරහසි**, මීට සුදුසු වන්නෙහි ය;

28. පිට

**ආමලකී**, නෙලලි රුකක් වේ ද; **හරීතකී**, අරළු රුකක් වේ; **අග්ගිං පරිචරිතු කාමා**, ගිනි සේවනය කරණු කැමැත්තෝ නො හොත් ගිනි පුදනු කැමැත්තෝ; **කට්ඨානි ඵාලෙතුං**, දර පලන්ට; **නිස්සංසයං භො**, නිසැකව ම; **ඵාලියන්තු ඉති**, පැලෙත්වා දැයි; **උජ්ජාලියන්තු ඉති**, දල්වෙත්වා ද;

29. පිට

**පඤ්ච අග්ගි සතානි**, ගිනිමැල පන්සියයක්; **යත්‍ර හි නාම**, යමෙකු හෙතුකොටගෙණ නම්; **විජ්ඣාපෙතුං**, නිවන්ට; **සීතාසු**, සිහිල් වූ; **හෙමන්තිකාසු**, හිමවැටීම ඇත්තා වූ; **අන්තරට්ඨකාසු**, නවම් මැදින් දෙමස අතර අටදවස වූ; **හිමපාත සමයෙ**, හිම වැටෙන කාලයෙහි; **උම්මුජ්ජන්තිපි**, මතුවන්නාහු ද වෙති; **නිම්මුජ්ජන්තිපි**, කිමිදින්නාහු ද වෙති; **පඤ්චමත්තානි මන්දාමුඛි සතානි**, පන්සියයක් පමණ ගිනි කබල්; **අභිනිම්මිනි**, නිර්මිත කෙළේය.; **විසිබ්බෙසුං**, ගිනි තැප්පාහුය; **පාවස්සි**, වැස්සේය; **මහා උදකවාහකො**, මහත් ජලප්‍රවාහයක් තෙමේ; **ඔඝො හොති**, පැතිර ගියේ වෙයි; **උස්සාදෙත්වා**, ඔසවා; **රෙණුගතාය භූමියා**, දූලි ගත වූ බිම; **මාහෙව භො උදකෙන වූළ්හො අහොසි**, ජලයෙන් පා කොට හරිණ ලද්දෙක් නොවේවා යි; **ඉධ නනුත්වං**, මේ නුඹ මෙහි (සිටිනෙහි) දැයි; **නප්පසහිස්සති**, නොමැඩලන්නේ ද;

30. පිට

**සංවෙජෙය්‍යං**, කලකිරුවන්නෙම් නම්; **ඤාය**, යම් පිළිපැදීම කින්; **පාමොක්ඛො**, ප්‍රධාන තන්හි පිහිටියෙක් වන්නෙහි ය; **අපලොකෙහි**, දන්ව ව; **චිරපටිකා**, බොහෝ කලක පටන්; **කෙස මිස්සං**, කෙස් ද; **ජටාමිස්සං**, ජටාවන් ද; **ඛාරිකාජ මිස්සං**, තවුස් පිරිකර කද ද; **අග්ගිහුත්ත මිස්සං**, ගිනිපුද න උපකරණ ද; **පවාහෙත්වා**,

පාකොට යවා; **උය්හමානෙ**, පාවෙන්නා වූ; **උපසග්ගො**, උවදුරක්; **පාහෙසි**, යැවූයේ ය; **සෙය්‍යො නු ඛො ඉති**, ශ්‍රෙෂ්ඨ දෝ යි;

33. **භගවතො අධිට්ඨානෙන**, භාග්‍යවතුන් වහන්සේගේ අධිෂ්ඨානයෙන්; **පඤ්චකට්ඨසතානි**, කාෂ්ඨ පන්සියයක්, **න ඵාලියිංසු**, නොපැළුනාහ; **ඵාලියිංසු**, පැළුනාහ; **අග්ගි**, ගිනි, **න උජ්ජලිංසු**, නො ඇවුලුනාහ; **උජ්ජලිංසු**, ඇවිලුනාහ; **න විජ්ඣායිංසු**, නො නිවුනාහ;

34. **විජ්ඣායිංසු**, නිවුනාහ; **පඤ්ච මන්දාමුඛිසතානි**, පන්සියයක් ගිනි බඳුන්; **අභිනිම්මිනි**, නිර්මිත කෙළේය; **එතෙන නයෙන**, මේ ක්‍රමයෙන්; **අඩ්ඪුඩ්ඪපාටිහාරියසහස්සානි**, තුන්දහස් පන්සියයක් ප්‍රාතිහාර්‍ය්‍යයෝ; **හොන්ති**, වෙත්;

**ගයාසීසං**, ගයා හිස; **කිඤ්චි සබ්බං**, කිනම් සියල්ලක්; **ආදිත්තං**, ඇවිල ගත්තේද;

32. පිට

**නිබ්බින්දං**, කලකිරෙන්නේ; **විරජ්ජති**, නො ඇලෙයි;–
**ආදිත්තපරියායං නිට්ඨිතං**,

---

**ලට්ඨිවනෙ**, තල්උයනෙහි; **ද්වාදස නහුතෙහි**, එක්ලක්ෂ විසි දහසක් විසින්; **සුප්පතිට්ඨෙ චෙතියෙ**, සුපපතිට්ඨ නම් චෛත්‍යයෙහි;

35. **උරුවෙලවාසී**, උරුවෙල් වැසි දුළුල්ල; **කිසකොවදානො**, තපශ්චර්‍ය්‍යා හෙතුවෙන් කෘශ යයි ලබන ලද නම් ඇති තවුසන්ට අවවාද කරණ සුලු වූයේ; නොහොත්; **කිසකො**, තෙමේ තපසින් කෘශවූයේ; **වදානො**, මෙරමාහට අවවාද කරන්නේ; **කිං**, කුමක්; **දිස්වා**, දැක; **අග්ගිං**, ගිනි පිදීම; **පහාසි**, දුරුකෙළෙහි ද; **කස්සප**, කාශ්‍යපය; **තව**, තාගේ; **අග්ගිහුත්තං**, අගනි හොමය; **කථං** කුමක් හෙතුකොටගෙණ; **පහීණං**, ප්‍රහීණ දැයි; **කස්සප**, කාශ්‍යපය; **එතං**, **අත්ථං** මේ කරුණ; **තං**, තා; **පුච්ඡාමි**, විචාරමි;

36. **රූපෙ ච**, රූපයන් ද; **සද්දෙ ච**, ශබ්දයන් ද; **අථ**, වැලි; **රසෙ ච**, රසයන් ද; **ඉත්ථියො**, ස්ත්‍රීන් ද; හෙවත් ස්පර්ශ ද; යන මොහුත්; **කාමා**, කාමයෝ යි;(මේ කාමයෙන්) **යඤ්ඤා**, යාග හෙතුවෙන් සම්බන්ධවෙත් ය යි; **අභිවදන්ති**, කියත්, **එතං** මේ කාම ප්‍රභෙදය, **උපධිසු**, ස්කන්ධොපධීන්හි; **මලං ඉති**, කිලුටු යි, **ඤත්වා**, දැන; **තස්මා**, එහෙයින්; **යිට්ඨෙ**, යාගයෙහි; **න අරඤ්ජිං**, නො ඇලුනෙමි; **හුතෙ**, හෝ මයෙහිද; **න අරඤ්ජිං**, අභිරමණය නොකෙළෙමි;

37. **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **ඉති**, මෙසේ වදාරණ සේක; **කස්සප**, කාශ්‍යප ය; **රූපෙසු**, රූපයන්හි ද; **සද්දෙසු**, ශබ්දයන්හි ද; **අථ**, නැවත; **රසෙසු**, රසයන්හි ද යන; **එත්ථ**, මෙහි; **තෙ**, තාගේ; **මනො**, සිත; **න රමිත්ථ**, නො ඇලුනේය; **අථ**, එකල්හි; **දෙවමනුස්සලොකෙ**, දෙව් මිනිසුන් සහිත ලොකයෙහි, **කො**, කොතැන්හි; **චරහි**, දැන්; **මනො**, සිත; **රතො**, ඇලුනේ ද; **කස්සප**, කාශ්‍යප ය; **එතං**, මෙය; මෙ මට; **බ්‍රූහි**, කියව;

38. **සන්තං**, ශාන්ත වූ; **අනූපධිකං**, කාමාදී උපධි රහිත වූ; **අකිඤ්චනං**, රාගාදී පළිබොධ රහිත වූ; **කාමභවෙ**, කාම ලොකයෙහි; **අසත්තං**, නො ඇලුනා වූ; **අනඤ්ඤථාභාවිං**, අන්‍ය ථාභාවයක් නැත්තා වූ; **අනඤ්ඤනෙය්‍යං**, අනිකෙකු විසින් නොපැමිණ විය හැකි බැවින් තමා විසින් භාවිත මාර්ගයෙන් ම අධිගන්තව්‍ය වූ; **පදං**, නිර්වාණ පදය; **දිස්වා**, දැක; **තස්මා**, එහෙයින්; **යිට්ඨෙ**, යාගයෙහි ද; **හුතෙ**, හෝමයෙහි ද; **න අරඤ්ජිං**, නො ඇලුනෙමි;

34. පිට

**උපාසකත්තං පවෙදෙසි**, උපාසක බව දැන්වූයේ ය; **කුමාරස්ස සතො**, කුමාරවූ ම; **පඤ්ච අස්සාසකා**, ප්‍රාර්ථනා පසක්; **තෙ**, ඒ ප්‍රාර්ථනාවෝ; **අභිසිඤ්චිංසූනන්ති**, අභිෂෙක කරන්නාහු නම්; **ඔක්කමෙය්‍ය**, බැසගන්නේ නම්;

39. **දන්තො**, දාන්තවූ හෙවත් චක්ෂුරාදී ඉන්ද්‍රියයන් දමනය කළා වූ; **විප්පමුත්තො**, කෙලෙසුන් කෙරෙන් මිදුනා වූ; **සිඞ්ගීනික්ඛසවණ්ණො**, සිඞ්ගී නම් සුවර්ණය පිළිබඳ නිෂ්කයකට බඳු ශරීර වර්ණ ඇති; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **දන්තෙහි**, දාන්ත වූ; **විප්පමුත්තෙහි**, කෙලෙසුන් කෙරෙන් මිදුනා වූ; **පුරාණජටිලෙහි සහ**, පරණ දුළුල්ලන් සමග; **රාජගහං**, රජගහ නුවරට; **පාවිසි**, වැඩිසේක.

40. **සන්තො**, කෙලෙසුන් කෙරෙන් නිවී හෙයින් ශාන්ත වූ; -පෙ-41. **මුත්තො**, සසරින් මිදුනා වූ;-පෙ-42. **තිණ්ණො**, චතුරොඝය තරණ ය කළාවූ; (සෙසු අර්ථ 39 කී නියායෙන් යොදගත යුතුයි.)

43. **යො ධීරො**, යම් ධෘති සම්පන්නයෙක් තෙමේ; **සබ්බධි**, සියලු සකන්ධායතනයන්හි; නොහොත් චක්ෂුරාදී සියලු ඉන්ද්‍රිය ගොචරවාරයෙහි; **දන්තො**, දැමුනේ; **සුද්ධො**, එහෙයින් ම පරිසුඬ ද;

**අප්පටිපුග්ගලො**, තමා හා ප්‍රතිභාග පුද්ගලයෙකු අවිද්‍යමාන හෙයින් අප්‍රති පුද්ගල ද; **ලොකෙ**, ලෙව්හි; **අරහං**, රහත්වූ; **සුගතො**, යම් සුගතයන් වහන්සේ කෙණෙක් වෙත් ද; **තස්ස**, ඒ බුදුරජානන් වහන්සේගේ; **අහං**, මම; **පරිචාරකො**, කිඞ්කර මෙහෙකරුවෙක් වෙමි; **ඔනීත පත්තපාණිං**, පාත්‍රයෙන් ඉවතට ගත් අත් ඇති;

36. පිට

**ගමනාගමන සම්පන්නං**, ගමනාගමනයෙන් සමන්විතවූ ම; **අට්ඨිකානං අට්ඨිකානං මනුස්සානං**, බුද්ධාභිවාදන ධර්මශ්‍රවණාදිය ඕනෑ ඕනෑ මිනිසුන්ට; **අභික්කමනීයං**, පැමිණිය හැක්කාවූ; **අප්පකිණ්ණං**, ජන සමූහයාගේ ගැවසීම නැත්තාවූ; **විජන වාතං**, ජන වාත රහිත වූ; **මනුස්සරාහසෙය්‍යකං**, මිනිසුන්ගේ රහස්‍ය ක්‍රියාවට සුදුසු වූ; **පතිසල්ලානසාරුප්පං**, විවේකයට සුදුසු වූ; **යං**, යම් ස්ථානයක්; **සොවණ්ණමයං**, සවර්ණමය වූ; **භිඞකාරං**, කෙණ්ඩිය; **ඔණොජෙසි**, අතපැන් වත්කොට පරිත්‍යාග කෙළේය.; **අඩ්ඪතෙය්‍යහි පරිබ්බාජක සතෙහි**, දෙසියපණසක් පිරිවැජියන් සමග; **පසාදිකෙන**, ප්‍රසාද එලවත්තාවූ; **අභික්කමෙනන**, ඉදිරියට යන ගමනින් ද; **පටික්කමෙනන**, පස්සට යන ගමනින් ද; **ආලොකිතෙන**, ඉදිරිපස බැලිමෙන් ද; **විලොකිතෙන**, හාත්පස බැලීමෙන් ද; **සමිඤ්ජිතෙන**, අත්පා හැකිලීමෙන් ද; **පසාරිතෙන**, අත්පා දිගහැරීමෙන් ද; **ඉරියා පථ සම්පන්නො**, යහපත් ඊර්‍යාපථයෙන් යුක්තවූයේ; **ඔක්ඛිත්ත චක්ඛු**, පහතට හෙලනලද ඇස්ඇත්තේ,

37.පිට

**අත්ථිකෙහි**, ප්‍රයොජන ඇත්තවුන් විසින්; **උපඤ්ඤාතං**, මැනව යි දන්නා ලද ද; **මග්ගො ඉති**, මාර්ගය වේය යි.

44. **දසවාසො**, දශවිධ ආර්‍යවාස ඇති; **දසබලො**, දශවිධ කාය බලයක් හා ඤාණ බලයක් ඇති; **දස ධම්මවිදූ**, දශවිධ කර්මපථ ධර්ම දන්නාවූ; **දසහි උපෙතො**, දශවිධ අසෙඛ ධර්මයන්ගෙන් යුක්තවූ; **දසසත පරිවාරො**, දහසක් පිරිවර ඇති; **සො භගවා**, ඒ භාග්‍යවතුන් වහන්සේ; **රාජගහං**, රජගහ නුවරට; **පාවිසි**, පිවිසි සේක.;

45. **අප්පං වා**, සවල්පයක් හෝ; **බහුං වා**, බොහොමයක් හෝ; **අත්ථං එව**, අර්ථය ම; **මෙ**, මට; **බ්‍රෑහි**, කියව; **මෙ**, මට; **අත්ථෙන එව**, අර්ථයෙන් ම; **අත්ථො**, ප්‍රයෝජන වෙයි; **ව්‍යඤ්ජනං බහුං**, බොහෝ ව්‍යඤ්ජන; **කිං කාහසි**, කුමක් කරන්නේ ද;

46. **යෙ ධම්මා,** යම් පඤ්චස්කන්ධ ධර්ම කෙනෙක් හෙවත් යම් දුඃඛ සත්‍යයක්; **හෙතුප්පභවා,** හේතුව ප්‍රභව කොට ඇත්තාහු ද; **තෙසං,** ඔවුන්ගේ; **හෙතුං,** හෙතු සඞ්ඛ්‍යාත තෘෂ්ණාව හෙවත් සමුදය සත්‍යය; **තථාගතො,** තථාගතයන්වහන්සේ; ආහ, වදාළ සේක; **තෙසං,** ඔවුන්ගේ; **යො නිරොධො,** යම් නිරෝධයක් වේ නම් හෙ ද වදාළසේක.; **මහා සමණො,** මහා ශ්‍රමණ තෙමේ; **එවං වාදී,** මෙබඳු වාද ඇත්තේය.;

47. **යදි,** ඉදින්; **තාව දෙව,** මෙපමණක් ම වූයේ නමුදු හෙවත් මේ සොවාන් මග පමණක්වූයේ නමුදු; **ධම්මො,** ධර්මය නම්; **එසො එව,** මෙය ම යි, **අසොකං පදං,** නිර්වාණ පදය; **පච්චබ්‍යථ,** නෙපි ප්‍රතිවෙධ කළහුය.; **බහුකෙහි,** බොහෝවූ; **කප්ප නහුතෙහි,** කප්ප නහුත ගණනකිනුත්; **අදිට්ඨං,** අපවිසින් නොදක්නා ලදුව; **අබ්භතීතං,** ඉක්ම ගියේය;

38.පිට

48–49– ගාථා සහ අර්ථ ද 45–46 වෙනි ගාථාවන් මෙනි,

39.පිට

50. **අථ,** ඉක්බිති; **ගම්භීරෙ ඤාණ විසයෙ,** ගැඹුරු වූ නුවණට ගොදුරු වූ; **අනුත්තරෙ,** නිරුත්තර වූ; **උපධිසඞ්ඛයෙ,** උපධීන්ගේ ක්‍ෂයකිරීම්සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි; **විමුත්තෙන,** මිදුනාවූ; **තෙ,** ඒ සැරියුත්-මුගලන් දෙදෙන; **වෙළුවනං,** වෙළුවනයට; **අප්පත්තෙ,** නො පැමිණිය වුන්; **සත්ථා,** ශාස්තෘන් වහන්සේ; **බ්‍යාකාසි,** ප්‍රකාශ කළ සේක.

51. **කොලිතො,** කොලිතය; **උපතිස්සො,** උපතිස්සය යන; **එතෙ මෙ සහායා.** මේ යහලුවෝ දෙදෙන; **ආගච්ඡන්ති,** එත්; **එතං,** තෙළු දෙදෙන; **මෙ,** මාගේ; **අග්ගං,** ශ්‍රෙෂ්ඨවූ; **භද්දයුගං,** සුන්දර යුග්මය වූ; **සාවක යුගං භවිස්සති,** ශ්‍රාවක යුග්මය වන්නේය යනු යි;

40.පිට

**වෙධබ්‍යාය,** කත වැන්දුම් බව පිණිස; **කුල්ල පචෙජ්දය,** කුල සිඳීම පිණිස; **උජ්ඣායන්ති,** අවඥකෙරෙත් නොහොත් හෙලා දකිත්. **ඛීයන්ති,** අගුණ ප්‍රකාශ කෙරෙත්; **විපාචෙන්ති,** අගුණ පතුරුවත්;

52. **මහාසමණො,** මහා ශ්‍රමණ තෙමේ; **සබ්බෙ සඤ්ජයෙ,** සඤ්ජය පිරිසෙහි වූ සියල්ලන් ම; **නෙත්වා,** තමා වෙත පමුණුවා ගෙණ, **මගධානං,** මගධ ජනපදසම්බන්ධ වූ; **ගිරිබ්බජං,** ගිරිබ්බජ නම් වූ නුවරට; **ආනෙතො බො,** ආයේය; **ඉදානි,** දැන්; **කංසු,** කවරෙකු; **නයිස්සති,** පමුණුවා ද?

53. **මහාවීර,** මහාවීර වූ; **තථාගතා,** තථාගතයන් වහන්සේලා; **වෙ,** ඒකාන්තයෙන්; **සද්ධම්මෙන,** සද්ධර්මයෙන්; **නයන්ති,** (සගමොක් සැපට විනෙදන) පමුණුවත්; **විජානතං,** ශික්ෂා විධි දන්නාවූ; **ධම්මෙන,** ධර්මය වූ පරිද්දෙන්; **නයමානානං,** දනා නිවණට පමුණුවන්නන්ට; **කා උසූයා,** කවර ඊර්ෂ්‍යාවක් ද;

54–55–ගාථා සහ අර්ථ ද. 52–53–මෙනි.

**සාරිපුත්ත මොග්ගල්ලාන පබ්බජ්ජා නිට්ඨිතා.**

**චතුත්ථ භාණවාරං නිට්ඨිතං.**

---

41. පිට

**අනුපජ්ඣායකා,** උපාධ්‍යායයන් නැත්තාහු; **අනොවදියමානා,** අවවාද නොකරනු ලබන්නාහු; **අනනුසාසියමානා,** අනුශාසනා නොකරණු; ලබන්නාහු; **දුන්නිවත්ථා,** නපුරු කොට හැන්දහු; **දුප්පාරුතා,** නපුරු කොට පෙරවූවාහු; **අනාකප්පසම්පන්නා,** ආකල්ප සම්පත් නැත්තාහු; **උපරි භොජනෙ අපි,** බොජුන් මත ද; **උත්තිට්ඨ පත්තං,** ඉඳුල් පාත්‍රය; **උපනාමෙන්ති,** තබත්; **උපරි සායනීයෙ අපි,** සායනය කටයුතු වූ හෙවත් ලෙව කෑ යුතු ආහාර මත්තෙහි දු; **උපරිපානීයෙ අපි,** පිය යුතු දේ මත්තෙහි දු; **විඤ්ඤාපෙත්වා,** විතවා; **භත්තග්ගෙ අපි,** භත්ත භාජනස්ථානයෙහි ද; **උච්චාසද්දා,** උස් හඬින්; **විප්පාවෙන්ති,** අගුණ පතුරුවා කියත්; **කුක්කුච්චකා,** කුකුස් කරන්නෝ වෙත් ද; **එතස්මිං නිදානෙ,** මේ මුල් හේතු වෙහි; **එතස්මිං පකරණෙ,** මේ ප්‍රධාන කාරණයෙහි; **සච්චං කිර ඉති,** සැබෑ දැ යි; **විගරහි,** ගැරහූසේක; **අනනුච්ඡවිකං,** නුසුදුස්සෙක; **අනනුලොමිකං,** ශාසනයට අනුලොම් නුවූ ක්‍රියා වෙක; **අප්පතිරූපං,** පිළිරූ (සුදුසු)නොවෙයි; **අස්සාමණකං,** මහණ කමක් නොවෙ යි; **අකප්පියං,** නො කැප දෙයෙක;

42. පිට

**දුබ්භරතාය,** දුකසේ රැකිය හැකි බැවිහි; **දුප්පොසතාය,** දුක සේ පොෂණය කට හැකි බැවිහි; **මහිච්ඡතාය,** බොහෝ දේ පිළිබඳ ආසා කිරීමෙහි; **අසන්තුට්ඨියා,** ලද දෙයකින් සතුටු නො වීමෙහි; **සඞ්ගණිකාය,** ගණ සඞ්ගණිකාවෙහි; **කොසජ්ජස්ස,** කුසීත භාවයෙහි; **සල්ලෙඛස්ස,** සල්ලෙඛ ධර්මයාගේ නොහොත් කෙලෙස් තුනී කරණ සවභාවයාගේ; **ධුතස්ස,** ධූත ගුණයාගේ නොහොත්

කෙලෙස් කම්පිත කිරීමෙහි; **අපචයස්ස**, රැස් නො කිරීමෙහි; **නාදනුලොමිකං**, ඒට සුදුසු වූ; පුත්ත චිත්තං, පුත්‍රයෙක යන සිත; **උපට්ඨාපෙස්සති**, එළවන්නේ ය; **සගාරවා**, ගෞරව සහිතවූවෝ; **සප්පතිස්සා**, දෙටු බැව් සහිත වූවෝ; **සභාගවුත්තිනො**, සමාන පැවතුම් ඇත්තාහු; **විරූළ්හිං**, විශෙෂයෙන් වැඩීමට; **සාහුති- ලහුති - ඔපායිකනති - පතිරූපනති**, යන මොහු හොඳ ය- නො බැරිය-උපාය ප්‍රතිසංයුක්තය-සුදුසුය යන අර්‍ථ ඇත්තෝ යි;

**සම්පාදෙහිති වා**, සම්පාදනය කරව කියා හෝ; **ඔපායිකං ඉති වා**, උපාය ප්‍රතිසංයුක්තය කියා හෝ; **උපාහනා ඔමුඤ්චිත්වා**, වහන් මුදා; **උපනාමෙතබ්බා**, එළවිය යුතු යි; **නීචං කත්වා**, පාත් කොට; **අපරි සංසෙහනන**, (කිසිවක) නොගසන්නහු විසින්; **පටි සාමෙතබ්බං**, තැන්පත් කොට තැබිය යුතුයි; **උද්ධරිතබ්බං**, ඔසව, තැබිය යුතුයි; **උක්ලාපො හොති**, කසළ ඇත්තේ වේ ද;

43. පිට

**පටිනිවාසනං**, හැඳි අඳනය; **සගුණං කත්වා**, ගුණ සහිත කොට හෙවත් දෙසිවුරු එකට අල්වා; **සඞ්ඝාටියො**, සඟළ සිවුරු; **සඋදකො**, ජලය සහිත වූයේ; **තිමණ්ඩලං**, තෙමඬුල්ල නොහොත් නාභි මණ්ඩලය හා දෙදෙන මඬුලු; **පරිමණ්ඩලං**, පිරිමඬුලු ඇති කොට; **ගණ්ඨිකං**, ගැටය; **පටිමුඤ්චිත්වා**, අමුණා; **නාතිදූරෙ**, ඉතා නුදුරෙහි; **ඔතාපෙතබ්බො**, තැවිය යුතුයි; **සිනානං හොති**, තෙත් වූයේ වේද; **උණ්හෙ**, අව්වෙහි; **න චනිඩ්ඩහිතබ්බො**, නො දූවිය යුතුයි; **සඞ්කරිතබ්බං**, ඇකිළිය යුතුයි නොහොත් නැමිය යුතුයි; **චතුරඞ්ගුලං කණ්ණං**, සතරඟුලක් වූ කොණ; **උස්සාදෙත්වා**, ඔසවා; **මා භඞ්ගා අහොසි ඉති**, බිඳීම නොවේ වයි; **ඔභොගෙ**, සිවුර නැමූ තන්හි; **වොදකං කත්වා**, ජලය රහිත කොට; **හෙට්ඨාමඤ්චං වා**, ඇඳ යට හෝ; **හෙට්ඨාපීඨං වා**, පුටුව යට හෝ; **පරාමසිත්වා**, පිස දමා; **අනන්තරහිතාය භූමියා**, නො අතුළාවූ බිම; **චීවර වංසං වා**, සිවුරු වස හෝ; **චීවරරජ්ජුං වා**, සිවුරු රැහැන හෝ; **පමජ්ජිත්වා**, පිරිමැද; **පාරතො අන්තං**, ඇතිට කොණ ද; **ඔරතො භොගං කත්වා**, මැතිට නැම්මදකොට; **ජන්තාඝරං**, ගිනිහල් ගෙට; **චුණ්ණං සන්නෙතබ්බං**, සුණු දියෙන් ගනා පිඩු කළ යුතුයි;

44. පිට

**උස්සහති**, හැකි වේ ද; **මුඛං මක්ඛෙත්වා**, මුහුණ ආලෙප කොට; **පච්ඡතො ච**, පිටිපසින් ද; **අනුපඛජ්ජ**, නො ගටා; **න පටිබාහෙතබ්බා**, නොවැළැක්විය යුතුයි; **පරික්කම්මං කාතබ්බං**, පිරි

යම් කට යුතුයි; **පමජ්ජිතබ්බා**, පිස දැමිය යුතුයි; **උද්දිසාපෙතුකාමො හොති**, උදෙසවනු කැමැත්තේ වේ ද; |**නිසීදන පච්චත්ථරණං**, හිඳිනා පස තුරුණු; **භිසි බිම්බොහනං**, බිස්ස හා කන් වයින; **කවාට පීඨං**, උළුවහු රාමුව; **අසංඝට්ටෙන්තෙන**, නොගටන්නහු විසින්; **මඤ්ච පටිපාදකා**, ඇඳෙහි ප්‍රතිපාදයෝ නොහොත් පාඅලු; **බෙල මල්ලකො**, පඩික්කම; **අපස්සෙන ඵලකං**, සේත්තුවන පෝරුව; **භූමත්ථරණං**, බුමු තුරුණු; **සන්තානකං හොති**, මකුළුදැලක් වේද; **උල්ලොකා**, උඩ වියන්තට්ටුවෙන්; **ඔහාරෙතබ්බං**, බැහැර කට යුතුයි; **ආලොක සන්ධිං**, ඇතුළත පිටත සහිත ජනෙල් කවුළු හා; **කණ්ණභාගා**, සතර කොන් හෙවත් කාමරයේ මූළු සතර; **ගෙරුක පරිකම්මකතා**, ගෛරිකයෙන් පිරියම් කළාවූ; **කණ්ණකිතා හොති**, හටගත් පුස්ඇති වේ ද; **චොළකං තෙමෙත්වා**, රෙදිකඩක් තෙමා; **පීළෙත්වා**, මිරිකා; **කාලවණ්ණකතා**, කෘෂ්ණවර්ණ කළාවූ; **අකතා**, පිරියම් නොකළාවූ; **පරිපෙළාසෙත්වා**, ඉස; **රජෙන**, රජසින් නොහොත් දූවිල්ලෙන්; **මා ඌහඤ්ඤීති**, නොනැසේ ව යි; **සඞ්කාරං විචිනිත්වා**, කසළ රුස් කොට; **ඡඩ්ඩෙතබ්බං**, අහක දැමිය යුතුයි; **භූමත්ථරණං**, බුමු තුරුණු; **ඔතාරෙත්වා**, බහා; **පප්ඵොටෙත්වා**, ගසා දමා; **අතිහරිත්වා**, ඇතුළට ගෙණ වුත්;

45. පිට

**සරජා වාතා**, රජස් සහිත වාතයෝ; **පුරත්ථිමා වාතපානා**, පෙරදිග වා කවුළු; **ථකෙතබ්බා**, වැසිය යුතුයි; **ආචමනකුම්භියා**, වැසිකිළි සැළියෙහි; **අනභිරති**, ශාසනයෙහි නො ඇල්මක්; **වූපකාසෙතබ්බා**, අන් තැනෙක පැමිණවිය යුතුයි; **විවෙචෙතබ්බං**, අත්හැරවිය යුතුයි; **අජ්ඣාපන්නො හොති**, පැමිණියේ වේ ද; **පරිවාසාරහො**, පිරිවෙසට සුදුසුවේ ද; **කිං ඉති නු ඛො**, කවර උපායකින්; **උස්සුක්කං කාතබ්බං**, උත්සාහ කටයුතුයි.

46. පිට

**අබ්භෙය්‍යාති**, අබ්භාන කරන්නේ ද; **පරිණාමෙය්‍ය ඉති**, පිරිණමන්නේ ද්‍යෙ හෝයි; **නියස්සං වා** එනම් කර්මය (විනය නොදත් භික්ෂූන්ට කරණ කර්මය යි;) **තජ්ජනීයං වා**, තජ්ජනීය කර්මය හෝ; **සම්මාවත්තෙය්‍ය**, මනාකොට පවත්නේ ද; **ලොමං පාතෙය්‍ය**, ලොමු හෙලන්නේ ද, නොහොත් භික්ෂූන් අනුව පවත්නේ ද; **නෙත්ථාරං වත්තෙය්‍ය**; කර්ම නිස්තරණයට හිතවූ අටළොස් වැදූරුම් වත අනුව පවත්නේ ද; **පටිප්පස්සම්භෙය්‍යාති**, මැඩපවත්වන්

**තේ** (අවලංගු කරන්නේ) දේ හෝයි; **රජනං පචිතබ්බං හොති**, පඬු පිසිය යුතු වේ ද; **සම්පරිවත්තකං සම්පරිවත්තකං**, පෙරල පෙරලා; **ථෙවෙ අවසිඤ්චන්ත**, පොද නොසුන් කල්හි; **ආගමෙතබ්බං**, බලාපොරොත්තු විය යුතුයි.

47. පිට

**උපජ්ඣාය වත්තං නිට්ඨිතං**

---

**උද්දෙසෙන**, උදෙසීමෙන් ද; **අනුසාසනියා ඉති**, අනුශාසනා වෙන් ද; **උපජ්ජියෙථාති**, උපදින්නේ ද යි.

48. පිට

**සන්නෙතබ්බං**, හතා පිඩුකට යුතුයි; **සන්තානකං**, මකුළුදැල් නම්;

49. පිට

**ගෙරුක පරිකම්ම කතා**, ගෙරික යෙන් පිරියම් කරණ ලද;

50. පිට

**උස්සුක්කං**, උත්සුවක්;

**සද්ධි විහාරික වත්තං නිට්ඨිතං.**

---

51. පිට

**පනාමෙතුං**, ඉවත්කරන්නට (පන්නා දමන්ට); **නෙව සම්මා වත්තන්ති**, මනාකොට නොපවතිත් මය; **දුක්කටස්ස**, දුකුලා, ඇවැත්හුගේ විබහමතත්පි, සිවුරු ද හරිත්; **සඞ්කමන්ති**, අන්‍ය පක්ෂවලට සඞ්ක්‍රමණය ද කෙරෙත්;

52. පිට

**අධිමත්තා භාවනා**, අධිමාත්‍ර වූ මෙසිත් වැඩීමක්, **සාතිසාරො හොති**, දෙස් ඇත්තේ වේ.;

53. පිට

**කිසො අහොසි**, කෘශ වූයේ ය; **ලූඛො**, රූක්ෂ වූයේ; **දුබ්බණ්ණො**, දුර්වර්ණවූයේ; **උප්පණ්ඩුප්පණ්ඩුක ජාතො**, ඉතා ඕවන් ශරීර ඇත්තේ; **ධමනි සන්ථත ගත්තො**, නහරවැල් ඉල්

පූත ශරීර ඇත්තේ; **අධිකාරං**, සත්කාරයක්; **සරතීති**, සිහි කෙරේ දූසි; **කටච්ඡුභික්ඛං**, කෙණෙසි බතක්; **කතඤ්ඤුනො**, කෘතඥ වූ; **කතවෙදිනො**, කළගුණ ප්‍රකට කොට දන්නෝය; **අජ්ජතග්ගෙ**, අදින් මතෙහි; **ඤත්ති චතුත්ථෙන කම්මෙන**, ඤත්තිය සතර වැනිකොට ඇත්තාවූ කර්මයෙන්; **පටිබලෙන**, ප්‍රතිබල වූ; **ඤපෙතබ්බො**, දැන්විය යුත්තේ ය; **මෙ සුණාතු**, මා කියන්නක් අසාවා;

54. පිට

**පත්තකල්ලං**, පැමිණි කල් ඇති කර්මය වී නම්; **ඤත්ති**, දැන්වීමයි; **උල්ලුම්පතු**, උද්ධරණය කෙරේවා නොහොත් ගිහි ධර්මයෙන් උත්තම ධර්මයෙහි පිහිටුවාවා;

55. පිට

**භත්තපටිපාටි**, බත් පිළිවෙළක්; **අට්ඨිතා හොති**, පිහිටියා වෙයි හෙවත් නැවැත්මක් නැති වෙයි (නිබඳ වෙයි); **නිවාතෙසු**, වැසි සුළං වැළැක්කා වූ; **ඛීයිංසු**, ක්ෂය විය; **චත්තාරො නිස්සයෙ**, නිශ්‍රය සතරක්; **අතිරෙකලාභො**, අතිරික් ලාභය නම්; **උද්දෙසභත්තං**, සඟින් උදෙසා දෙන බතය; **නිමන්තණං**, නිමන්ත්‍රණ බතය; **සලාකභත්තං**, ලහ බතය; **පක්ඛිකං** පක්ෂයක් පාසා ලැබියයුතු බතය; **පාටිපදිකං**, පැළවිය දවස්හි දිය යුතු බතය; **ඛොමං**, කොමු පිළිය; **කප්පාසිකං**, කපු පිළිය; **කොසෙය්‍යං**, කොසෙය්‍ය නූලින් කරණ ලද පිළිය; **කම්බලං**, රොමයෙන් කරණ ලද පිළිය; **සාණං**, හණ පිළිය; **භඞ්ගං**, මුසු පිළිය; **අඩ්ඪයොගො**, ගරුඩ පක්ෂාකාර සෙවෙනි ඇති ගෙය; **පාසාදො**, සිවුරැස් ගෙය; **හම්මියං**, සඳලු සහිත ගෙය; **ගුහා**, ලෙනය; **පූතිමුත්තභෙසජ්ජං නිස්සාය**, ගෝමූත්‍රයෙන් යුක්ත වූ බෙහෙත නිසා; **නවනීතං**, වෙඩරුය; **මධු**, මීය; **ඵාණිතං**, පැණි නොහොත් උක්සකුරුය;

**උපජ්ඣාය වත්ත භාණවාරං නිට්ඨිතං.**

---

56. පිට

**අභිරමෙය්‍යං**, සිත් අලවන්නෙම්; **ජෙගුච්ඡා**, ජිගුප්සිත වන්නාහු ය; **දුවග්ගෙනපි**, දෙදෙනාගේ වර්ගයක් වූ ද; **ගණෙන**, ගණයාගෙන්; **ඌනදසවග්ගෙන**, දසදෙනාගේ වර්ගයට අඩු වූ; **එකවස්සා අපි**, එක වසක් ඇත්තාහු ද; **පටිසම්මොදිතුං**, පිළිසඳර කථා කරන්ට, **ආචිණ්ණං හො**, පුරුදු කරණ ලද්දේ ම ය; **යාපනීයං**, යැපියහැකි ද; **අප්පකිලමථෙන**, ස්වල්ප වූ ක්ලාන්ත භාවයෙන්; **අද්ධානං**, අදුන් මග; **අත්ථසංහිතං**, අර්ථයෙන් යුක්ත වූවක්; **සෙතු**

**ඝාතෙනා,** පද ඝාතනය වෙයි හෙවත් හේතු නැතිකිරීම වෙයි; **කින්ති හොති,** කවරෙක් වේ ද ?; **ඔවදියො,** අවවාද කටයුතු වූයේ; **මඤ්ඤිස්සසි,** හඟින්නෙහි ද;

57. පිට

**අතිලහුං බො,** ඉතා වහාම; **ගණ බන්ධිං,** වගබැඳීම ඇති; **අප්පස්සුතා,** නූගත්, **අඤ්ඤ තිත්ථිය පුබ්බො අපි,** පූර්වයෙහි අන්‍ය තීර්ථික වූයෙක් ද; **සහධම්මිකං,** සහ ධර්මික ශික්ෂා පදයකින්; **තං එව නිස්සායතනං,** එම තීර්ථක ආවාසයට ම; **පක්කන්තෙනාපි,** බැහැර ගිය කල්හි ද; **පක්ඛසඞ්කන්තෙනාපි,** අන්‍ය තීර්ථක පක්ෂය කට මාරුවූ කල්හි ද;

58. පිට

**නිස්සාය,** නිඃශ්‍රය කොට; **නිස්සයං දාතුං,** නිසදෙන්ට; **වච්ඡාමි,** වසන්නෙමි; **සාධු ඉති වා,** යහපතය කියා හෝ; **ලහු ඉති වා,** සැහැල්ලුය කියා හෝ; **ඔපායිකන්ති වා,** උපාය ප්‍රතිසංයුක්ත යයි කියා හෝ;—

**ආචරියවත්තං නිට්ඨිතං-අන්තෙවාසික වත්තං නිට්ඨිතං.**

---

69. පිට

**නිස්සය පටිප්පස්සද්ධියො,** නිස පසු බැසුම් (=නිස අවලංගුවීම්) **ආණත්ති යෙව පඤ්චමී,** අණකිරීම ම පස්වෙනි වේ; **සමොධානං ගතො හොති** එකතු වීමට ගියේ හෝ වේද;

70. පිට

**අසෙඛෙන සීලක්ඛන්ධෙන,** අශෛක්ෂවූ ශීලස්කන්ධයෙන්;

71. පිට

**අධිසීලෙ,** ශ්‍රෙෂ්ඨවූ ශීලයෙහි; **සීලවිපන්නො හොති,** ශීලවිපත්ති යට පැමිණියේ වේ ද; **අජ්ඣාචාරෙ,** උත්තම වූ ආචාරයෙහි; **අතිදිට්ඨියා,** අති දෘෂ්ටියෙන්;

72. පිට

**උපට්ඨාතුං වා,** උපස්ථානකරන්ට හෝ; **වූපකාසෙතුං වා,** කරුණු කියා අත්හරවන්ට හෝ; **විනොදෙතුං වා,** වළක්වන්ට හෝ; **ආභි සමාචාරිකා සික්ඛාය,** කුදුවත්හි හැසිරීම වූ ශික්ෂා වෙහි; **ආදි බ්‍රහ්මචරියකාය සික්ඛාය,** ප්‍රාතිමොක්ෂ සංවර ශීල (උභතොවිභඞ්ගාගතශික්ෂා පද ශීලයෙහි) **අභිවිනයෙ,** විශිෂ්ට විනයෙහි (සියලු විනය පිටකයෙහි); **දිට්ඨිගතං,** මිථ්‍යාදෘෂ්ටියක්; **විවෙචෙතුං,** තොරකරන්ට;

## 73. පිට

**න සඞ්ගහිතානි හොන්ති**, මනාකොට ප්‍රගුණ වීමට නොආවාහු වෙද්ද; **න සුවිභත්තානි**, මනා කොට අර්ථවශයෙන් විභාග නොකරණ ලද්දාහු වෙද්ද; **න සුප්පවත්තීනි**, වාචොද්ගත නොවෙත් ද; **සුත්තසො**, සූත්‍ර වශයෙන්; **අනුබ්‍යඤ්ජනසො**, ව්‍යඤ්ජනාර්ථ වශයෙන්; **න සුවිනිච්ඡිතානි හොන්ති**, මනාකොට විනිශ්චය නොකරණ ලද්දාහු වෙත් ද;

**උප සම්පාදෙතබ්බ පඤ්චක සොළසවාරං නිට්ඨිතං.**

**උප සම්පාදෙතබ්බ ඡක්ක චුද්දස වාරං නිට්ඨිතං,**

## 77. පිට.

**තං යෙව තිත්ථායතනං**, ඒ තීර්ථායතනයට ම; **සඞ්කමි**, මාරු වී ගියේය; **පච්චාගතකො**, පෙරලා අවුත්;

## 78. පිට.

**ආරද්ධකො හොති**, පිරිවෙස් වත සපයන්නෙක් හෙවත් පුරන්නෙක් වෙයි; **අතිකාලෙන**, ඉතා උදෑසනින්; **අති දිවා**, ඉතා දවල් ව; **විධවාගොචරො වා හොති**, කත වැන්දඹු ස්ත්‍රීන් ඉන්නා ස්ථාන ගෝචර කොට ඇත්තේ හෝ වේ ද; **ථුල්ල කුමාරිකා**, වැඩි විය පැමිණි කුමාරිකාවන්; **භික්ඛුනී ගොචරො වා හොති**, භික්ෂුණීන්ගේ ආශ්‍රම ගොචර කොට ඇත්තේ හෝ වේ ද; **උච්චාවචානි**, කුඩා මහත්; **කිඞ්කරණීයානි**, කුම් කෙරෙම් දැයි පිළිවිස කට යුතු කම්යෝ වෙද්ද; **න අනලසො**, අනලස් නො වේ ද; **තත්‍රූපායාය වීමංසාය**, එහි උපාය වූ විමසුම් නුවණින්;

## 79. පිට.

**න තිබ්බච්ඡන්දො හොති**, දැඩි වූ කැමැත්ත ඇත්තේ නොවේ ද; **තාසං ආදෙය්‍යාය**, ඔවුන්ගේ දැඩිකොට ගත් දෘෂ්ටියෙහි; **අනභිරද්ධො හොති**, නො පිරිපුන් සංකල්ප ඇත්තේ වේ ද; **අනාරාධනීයකම්මං**, වත නො පිරීමෙහි;

## 80. පිට.

**සඞ්ඝානතිකං**, සෙසු අඞ්ග ගලපන ප්‍රධාන ලක්ෂණය වේ. **උපජ්ඣායමූලකං**, උපාධ්‍යායයා ප්‍රධාන කොට; **භණ්ඩු කම්මාය**, ඉසකෙස් කැපීම පිණිස; **අපලොකෙතබ්බො**, අපලොකනය කට

යුත්තේ ය නොහොත් අසා බැලිය යුත්තේය; **අග්ගිකා ජටිලකා**, ගිනි පුදන්නාවූ ජටිලයෝ; **සාකියා**, ශාක්‍යවංශ ඇත්තෙක්; **ආවෙණිකං**, වෙනම; **පරිහාරං**, පරිහරණයක්;

**අඤ්ඤතිත්ථිය පුබ්බ කථා නිට්ඨිතා.**

---

**උප්පන්නා හොන්ති**, වැඩුනාහු වෙත්; **කුට්ඨං**, කුෂ්ඨය; **ගණ්ඩො**, ගඬය; **කිලාසො**, කිලස්ය; (කබරය) **සොසො**, ක්ෂයරෝගය; **අපමාරො**, අපස්මාරය; **ඵුට්ඨා**, මඩනා ලද්දාහු; **කොමාරභච්චං**, කුමාර අභයරාජයා විසින් පොෂිතවූ; **තිකිච්ඡාහිති**, පිළියම් කරවයි; **සාපතෙය්‍යඤ්ච**, ධනය ද;

81. පිට.

**යාචනබහුලා**, ඉල්ලීම් බහුල කොට ඇත්තාහු; **විඤ්ඤත්තිබහුලා**, ප්‍රත්‍යය ලබා ගැණීමට විතවීම් බහුල කොට ඇත්තාහු;

82. පිට.

**භණෙ**, කොලෙති; **පච්චන්තං**, පසල් දනව්ව; **උච්චිනථාති**, වඩිතය කරව් යයි; **මහාමත්තෙ**, මහා මාත්‍යයන්; **යුද්ධාභිනන්දිනො**, යුද්ධයෙහි සතුටුවූවාහු; **පසවාම**, රැස්කරම්හ; **වොහාරිකෙ**, විනිශ්චය ව්‍යවහාරයෙහි දක්ෂ වූ; **කිං පසවතීති**, කවරක් රැස් කෙරේ දැයි; **ඡෙත්තබ්බං**, සිඳිය යුතුයි; **උපඩ්ඪඵාසුකා**, අඩ යක ඉල ඇට; **භඤ්ජිතබ්බා**, බිඳ්ද යුතු යයි; **විහෙඨෙය්‍යුං**, වෙහෙසන්නාහු ය;

83. පිට

**උප්පජ්ජන්ති**, හයින් වලිත ද වෙත්; **උත්තසන්තිපි**, තැති ද ගණිත්; **අඤ්ඤෙනපි ගච්ඡන්ති**, අන් දෙසකිනුත් යෙත්; **මුඛං කරොන්ති**, මුහුණ පාති; **ඛජ බද්ධං චොරං**, දද බැඳි සොරහු; **චොරිකං කත්වා**, සොර කමක් කොට; **කාරාය බද්ධො හොති**, දඟගෙයි බඳනා ලද්දේ වේ; **කාරං භින්දිත්වා**, සිරගෙය බිඳ; **අයංසො**, මේ ඒ තෙම; **නෙමාති**, ගෙන යම් හයි; **අභයූවරා**, නිදහස ඇති; **අන්තො පුරෙ**, ඇතුළු නුවර; **හන්තබ්බා**, නැසිය යුත්තෝයි; **ලිඛිතො හොති**, (පොතෙහි) ලියනලද්දේ වෙයි; **හනාමාති**, නසම්හ යි;

84. පිට

**කසාහතො**, කසයෙන් තලන ලද්දා වූ; **කත දණ්ඩ කම්මො**, කරණලද දඬුවම් ඇති; **ලක්ඛණාහතො**, ලකුණු කෙටූ; **ඉණායිකො**, ණයගැතියෙක් තෙම; **ධනියා**, ධන හිමියෝ; **අයිරකා**, අයිතිකාරයෝ;

85. පිට.

**කම්මාර භණ්ඩු**, මුඩු හිස් ඇති රන් කරු පුතෙක්; **භණ්ඩිච්චා**, කලහ කොට ගෙණ; **අපි පස්සථාථ**, දක්නාහු දැයි; **භණ්ඩුකම්මාය**, හිසකේ කැපීම පිණිස; **අපලොකෙතුං සඞ්ඝං**, සඞ්ඝයාට අපලොකනය කරන්ට; **සත්තරස වග්ගියා දරකා**, සතළොස් දෙනෙකුන්ගේ වර්ගීය වූ දරුවෝ; **ලෙඛං සික්ඛෙය්‍ය**, ලියමන ඉගෙණ ගන්නේ ද; **ගණනං සික්ඛෙය්‍ය**, ගණන් ඉගෙණ ගන්නේ නම්; **අස්ස**, ඔහුගේ; **උරො**, ලය; **රූපං සික්ඛෙය්‍ය**, රූප ඇඳීම ඉගෙණ ගන්නේ නම්;

86. පිට

**යාව විහායති**, යම් තාක් එළිවන්නේ ද; **ආගමෙථ ඉති**, බලාපොරොත්තු වව්ය යි; **ඌහදන්ති අපි**, වර්චසින් ද කිලුටු කෙරෙත්; **උම්මිහන්තීති**, මූත්‍රයෙන් ද කිලුටු කෙරෙත්; **අක්ඛමො හොති**, නො ඉවසන්නේ වේ; **සමණානං**, සපශීයන්; **දුරුත්තානං**, නපුරු කොට කියන ලද්දා වූ; **දුරාගතානං**, නපුරුකොට ආවාවූ; **වචන පථානං**, වචන මාර්ගීයන්; **පාණිහරානං**, පණ හැර ගන්නා වූ; **අනධිවාසක ජාතිකො හොති**, නො ඉවසන සවභාව ඇත්තේ වේ;

87. පිට

**අභිවාතක රොගෙන**, මාරිරොගයෙන්; (විසවායු ලෙඩකින්); **උපඩ්ඪාවඩ්ඪා**, ලඟට දුව; **පොරාණකෙන ආචිණ්ණ කප්පෙන**, පරණ වූ පුරුද්දෙන්; **අපසාදෙන්ති**, ඉවත් කෙරෙත්; **නවිනයෙසස ශූනන්ති**, නොහසින්නාහුදැයි; **කාමෙ උඩ්ඩාපෙතුං**, කවුඩන් එළවන්ට; **උස්සහන්ති ඉති**, පොහොසත් වෙත් දැයි; **දූසෙසුං**, දූෂණය කළාහු ය;

88. පිට

**ආහුන්දරිකා**, සම්බාධ යහ; **න පකාසන්ති**, ප්‍රකාශ නො වෙත්; **අවාපුරණං**, යතුරු මූදුව; **දක්ඛිණාගිරිං**, දක්ෂිණා ගිරි ජනපදයට; **අනුපරිවෙණියං**, පිරිවෙණක් පාසා; **ඉතනරො** ම

**වාසො,** ස්වල්පමාත්‍ර වූ වාසයක් ද; **ලහුවිත්තතා,** සැහැල්ලු වූ සිත් ඇති බවක්; **ඔගගෙණෙන්,** ස්වල්ප ගණයා ඇති; **පච්චාගඤ්ජි,** ආපසු වැඩිසේක. **අනිස්සිතෙන,** නිස නැත්තහු විසින්;

**අභයූවර භාණවාරං නිට්ඨිතං.**

---

92. පිට.

**අතික්කන්තවරා ඛො,** ඉක්මවනලද වර ඇත්තෝ යයි; **යඤ්ච අනවජ්ජන්ති,** යමකුත් නිර්දෙෂ ද; **අනප්පකං දුක්ඛං,** බොහෝ වූ දුකක්; **අධිමත්තං,** ඊට වැඩිපමණ දුකක්;

93. පිට.

**පාහෙසි,** එවූසේක; **යාවතකො,** යම් පමණ ගෙණ දූන්; **අසභාග වුත්තිකා,** අසමාන පැවතුම් ඇත්තාහු; **දණ්ඩකම්මං කාතුං,** දඬුවම් කරන්ට; **පටිසඞ්ඛාති;** උත්සාහ කෙරේද; **අවාසාය,** නොවිසීම පිණිස;

94. 95. පිටු.

**ආවරණං කාතුං,** ඇවිරීම කරන්ට; **මුඛමාරිකං,** මූවදෙරට පැමිණි;

**දණ්ඩකම්ම වත්ථුං නිට්ඨිතං.**

---

**අපලාළෙන්ති,** චීවරාදියෙන් සඞ්ග්‍රහ කෙරෙත්;

**නස්ස,** නැසෙව; **විනස්ස,** වැනසෙව; **අපසාදෙන්ති,** ඉවත් කෙරෙත්; **මොළිගල්ලො,** ස්ථූල ශරීර ඇති (මෝල්හෙරණුන්) කරු; **හත්ථි භණ්ඩ,** ඇත්ගොව්වන් කරු ද; **ඛීණ කොලඤ්ඤා,** ක්ෂයවූ කුල නෑයන් ඇති; **ඵාතිකාතුං,** වැඩිකරන්ට හෝ; **පටියාදෙත්වා,** පිළියෙල කරගෙණ; **සංවසෙය්‍යං,** එකතුව වාසය කරන්නෙම් නම්;

96. පිට

**ඉධ,** එසේ වී නම්; **අනුයුඤ්ජියති,** අනුයෝගවතින් විභාග කරව යි; **අට්ටියති,** මිරිකෙයි; **හරායති,** ලජ්ජිත වෙයි; **ජිගුච්ඡති,** පිළිකුල් කෙරෙයි. **විස්සට්ඨො,** නිසැක වූයේ; **අභිනාපුණ්ණා,** නාගයාගෙන් පිරුණේය; **ඔහාරා,** දරණ වැල්; **නික්ඛමන්තා,** නික්මුනාහුය; **ඛවාටං,** දොර කවුළුව; **පනාමෙන්තා,** හරින්නේ; **වාතපානෙහි,** ජනෙල් වලින්; **විස්සරං අකාසි,** මහ හඬක් කෙළේය; **උපධාවිත්වා,** ළඟට දුව;

97. පිට

**අවිරූළ්හිධම්මො**. විරූහණය නොවන ස්වභාවය ඇත්තෙම් නොහොත් නොපිහිටන ස්වභාව ඇත්තෙම්; **සභාවපාතුකම්මාය**, ස්වභාවය පහළ කිරීම පිණිස; **විස්සට්ඨො**, හරණ ලද මනස්කාර ඇත්තේ හෙවත් නිර්ගීතවූයේ; **නික්ඛන්තිං**, නික්මීම හෙවත් නිදහස;

98. පිට.

**අච්ඡින්දිංසු**, පැහැර ගත්හ; **හනිංසු**, නැසූහ; **හඤ්ඤිස්සාමාති**, නසනු ලබම් හ යි;

**සඞ්ඝෙන උපජ්ඣායෙන**, සඞ්ඝයා උපාධ්‍යාය කරගැණීමෙන්;

99. පිට.

**ගණෙන උපජ්ඣායෙන**, ගණයා උපාධ්‍යාය කොට ගෙණ; **පණ්ඩකූපජ්ඣායෙන**, පණ්ඩක වූ උපාධ්‍යායයෙකු කරණ කොට ගෙන; **තිත්ථියපක්කන්තකෙන**, තීර්ථික ලබ්ධියට ගියා වූ;

100. පිට.

**අපත්තකං**, පාත්‍රය නැත්තහු; **හත්ථෙසු**, අත්වල; **නග්ගා**, නග්න වූවාහු; **යාචිතකෙන පත්තෙන**, ඉල්වා ගන්නාලද පාත්‍රයෙන් යුක්තවූවාහු; **පටිහරන්ති**, නැවත ගෙණ යත්.

**නඋපසම්පාදෙතබ්බක වීසතිවාරං නිට්ඨිතං,.**

---

101. පිට.

**හත්ථච්ඡින්නකං**, කපන ලද අත් ඇත්තහු; **අළච්ඡින්නකං**, කපන ලද මාපට ඇඟිලි ඇත්තහු; **ඵණහත්ථකං**, පෙණය වැනි අත් ඇත්තහු; **ඛුජ්ජං**, කුදු; **වාමනකං**, මිටි තැනැත්තහු; **ගලගණ්ඩිං**, ගල ගණ්ඩ රෝග ඇත්තහු; **කසාහතං**, දඬුවමින් නැගි කසපහර ඇත්තහු; **ලක්ඛණාහතං**, කෙටූ ලකුණු ඇත්තහු; **ලිඛිතකං**, රජගෙයි ලියන ලද්දහු; **සීපදිං**, බරවා ඇත්තහු; **පාපරොගිං**, පාපරෝග ඇත්තහු; **පරිසදූසකං**, විරූප බැවින් පිරිස දූෂණය කරණ පුද්ගලයා; **කාණං**, කණා; **කුණිං**, කුණුවූ අත් පා ඇත්තහු. **ඛඤ්ජං**, කොරා; **පක්ඛහතං**, අංසබාග ඇත්තහු; **ඡින්නිරියාපථං**, සුන් වූ ඊර්‍යාපථ ඇත්තහු(පිළා); **මූගං**, ගොළුවා; **අන්ධං**, දුස් කණා; **බධිරං**, බීරා; **අන්ධමූගං**, දුස්කණ ගොළුවා; **අන්ධබධිරං**, ජාත්‍යන්ධ බීරා; **මූගබධිරං**, ගොළුබීරා; **අන්ධමූගබධිරං**, දුස් අඳ ගොළු බීරා;

**දුතියභාණවාරං නිට්ඨිතං,.**

---

**අලජ්ජිනං**, අලජ්ජීන්; **චතුහ පඤ්චාහං**, සතර පස් දවසක්, **ආගමෙතුං**, බලාපොරොත්තුවන්ට; **නිස්සය කරණීයො අමහි**, කටයුතු නිස ඇත්තේ වෙමි; **අනිස්සිතෙන වත්ථුං**, නිස නැතුව වසන්ට;

103. පිට.

**ආගමජතු**, ආගමනය කෙරේවා; **ඉමං අනුසාවෙස්සතීති**, මොහුට කම් වාක්‍යය අස්වාව යි; **පෙරස්ස නාමං ගහෙතුං**, සථ්විර යන් වහන්සේගේ නම කියන්ට; **න උස්සහාමි**, නොපොහොසත් වෙමි; **මෙ ගරු ඉති**, මට ගුරු යයි වදළසේක; **එකානුසාවනෙ කාතුං**, එක ම අනුසාවන යෙහි ලා කරන්ට; **එකානුසාවනෙ කරොම ඉති**, එක කම් වාක්‍යයෙහි උපසම්පද කරම් හයි; **නානා උපජ්ඣායෙන**, නානාවිධ උපාධ්‍යාය යන් කරණ කොට ගෙණ; **න තු එව ඉති**, නො කට යුතු යයි; **ගබ්භවීසො**, ගැබ විසූ කාලය සමග විසි වයස් ඇත්තේ; **උපසම්පන්නො නු ඛො අමහි**, උපසපන් වූ යෙම් දෙ හෝ; **කුට්ඨකාපි**, කුෂ්ඨරෝග ඇත්තෝ ද; **ගණ්ඩිකාපි**, ගඩ රොග ඇත්තෝ ද; **කිලාසිකාපි**, කිලාස නම් කුෂ්ඨ රොග ඇත්තෝ ද; **සොසිකාපි**, සොස රොගීහු ද; **අපමාරිකාපි**, මීමැස්මොර ඇත්තෝ ද; **තෙරස අන්තරායිකො ධම්මෙ**, තෙළෙස් අන්තරාය කර ධර්මයන් **භුජිස්සොසි**, නිවහල් වූ යෙහි ද; **අනණොසි**, නය නැත්තෙහිද;: **නසි රාජභටොසි**, රාජභට යෙක් නො වෙහි ද;

104. පිට.

**අනනුසිට්ඨා**, අනුසාසනා නොකරණ ලද්දා වූ; **විත්ථායන්ති**, තද ගත් ඇත්තාහු වෙත්; (=ගල්ගැසෙත්) **මඞ්කූ හොන්ති**, තෙජස් රහිතා වෙත්; **විස්සජ්ජෙතුං**, විසඳන්නට; **උපජ්ඣං ගාහාපෙතබ්බො**, උපාධ්‍යායකු ග්‍රහණය කරවිය යුත්තේ ය; **දුරනුසිට්ඨා**, නපුරු කොට අනුසාසනා කරණ ලද්දා හු; **සුණසි**, අසන්නෙහි ද; **අයං තෙ සච්චකාලො**, මේ තට සත්‍ය කීමට කාලය යි; **භූත කාලො**, ඇත්ත කීමෙහි කාල යයි; **මා ඛො විත්ථාසි**, තද නො වෙව (ගල් නොගැහෙව);

**උපසම්පද කම්මං නිට්ඨිතං,**

---

106. පිට.

**ඡායා මෙතබ්බා**, සෙවනැල්ල (=පියවර) මැණීම කට යුතු යි නොහොත් කාලය ප්‍රමාණ කටයුතුයි; **උතුපමාණං**, ඍතුහුගේ ප්‍රමාණය; **සංගීති**, සංගීතිය නොහොත් මේ සියල්ලේ එකතුකිරීම;

එකකං බහාය, හුදකලාව හැර; සමාගඤ්ජි, සමාගම් වූයේ ය හෙවත් එක් වූයේ ය;

චත්තාරො නිස්සයා නිට්ඨිතා,.

---

107. පිට.

මෙථුනං ධම්මං, ග්‍රාම්‍ය ධර්මය; එවං චිරං අකාසි, මෙසේ කල් ගෙවූයෙහි දැයි; දුතියං දූතං, දෙවෙනි භික්ෂුවක් දෙන්නට;චත්තාරි අකරණීයානි, අකටයුතු සතර ද; අසක්‍ය පුත්තියො, ශාක්‍ය පුත්‍රයෙක් නොවේ; සීසච්ඡින්නො, සුන් හිස ඇත්තෙක්; සරීර බන්ධනෙන, ශරීර බන්ධනයෙන්; තං තෙ, එය තාවිසින්; තිණසලාකං උපාදය, තණ කූරක් පටන් කොට;ථෙය්‍ය සංඛාතං, සොර සිතින්, පාදං වා, කාර්ෂාපණ පාදයක් හෝ;පාදාරහං වා, කාර්ෂාපණ පාදයක් අගනා දෙයක් හෝ; අතිරෙක පාදං වා, කාර්ෂාපණ පාදයකට වැඩියක් හෝ; බන්ධනා පමුත්තො, තුවටුවෙන් මිදුනාවූ; පණ්ඩු පලාසො, ඉදුනාවූ පත්‍රයක්; හරිතත්තාය, තිල්වීම පිණිස; කුන්ථ කිපිල්ලිකං, කුරු කුහුඹුවන්; න වොරොපෙතබ්බො, නොර නොකට යුතුයි; ගබ්භ පාතනං උපාදය, ගැබ් හෙලීම පටන් කොට; මනුස්ස විග්ගහං, මිනිස් සිරුරක්; ද්වෙධා භින්නා, දෙකට බිදුනාවූ පුථුසිලා, මහත් ගලක්;අප්පටි සන්ධිකා හොති,ගැලපිය නොහැකි වේ ද; අභිරමාමි ඉති, ඇලෙමි කියා හෝ; න උල්ලපිතබ්බො, නොකිය යුත්තේ ය; ඉච්ඡා අපකතො, ආශාවෙන් මඩනා ලද්දේ; අසන්තං, තමාසන්තානයෙහි අවිද්‍යමානවූ; අභූතං, නූවූ; විමොක්ඛං වා, අෂ්ට විමොක්ෂයන් ගෙන් එක් විමොක්ෂයක් හෝ;සමාපත්තිං වා, අෂ්ට සමාපත්තීන් අතුරෙන් එක්සමාපත්තියක් හෝ; විරූළ්හියා,හටගැණීමට; අභබ්බො, අභව්‍ය වේද;

චත්තාරි අකරණීයානි.

---

108. පිට.

ආපත්තියා අදස්සනෙ, ඇවත නොදක්මෙහි; උක්ඛිත්තකො, උත්ක්ෂේපණීය කර්මය කරණ ලද්දේ;පස්සසි ස්සසි ඉති,දක්නෙහි දැයි; ඔසාරෙතබ්බො,සංඝයාට ඇතුලත් කටයුතු යි; සාමග්ගියා ලබ්භමානාය, සමගිය ලැබෙන කල්හි; උක්ඛිපිතබ්බො, උත්ක්ෂේණීය කර්මය කටයුතු යි; සම්භොගෙ, ප්‍රත්‍යය සම්භොග යෙහි ද; සංවු,

**කෙ,** සමාන සංවාස නම් යෙහි ද; **පටිනිස්සජ්ජාසි,** අත්හරින්නෙහි දැයි; **අප්පටිකම්මෙ,** ප්‍රතිකර්ම නොකිරීමෙහි; **පාපිකාය දිට්ඨියා,** ලාමක දෘෂ්ටිය; **අප්පටිනිස්සග්ගෙ,** නොහැරීමෙහි;

**මහාඛන්ධකො පඨමො.**

---

109. පිට.

**මහග්ඝෙසු**, විශාලවූ අර්ථ ඇති; **පෙසලානං**, ප්‍රියශීලි වූ භික්ෂූන්ට; **පාපිච්ඡෙ,** ලාමක ඊප්සා ඇත්තවුන්ට; **නිග්ගහානඤ්ච**, නිග්‍රහයෙහි ද; **පග්ගහෙපි ච,** දැඩිව ගැන්මෙහි ද; **සාසනාධාරණෙ ච එව,** සස්න දැරීමෙහි ද; **සබ්බඤ්ඤුජිනගොචරෙ,** සර්වඥ බුද්ධයන්ට ගොචර වූ; **අනඤ්ඤවිසයෙ,** අන්‍යයන්ට විෂය නුවූ; **ඛෙමෙ,** නිර්භයවූ; **ඛන්ධකෙ විනයෙච එව,** ඛන්ධක වූ විනයෙහි ද; **පරිවාරෙ,** ච, පරිවාර පාඨයෙහි ද; **මාතිකෙ,** මාතෘකා වෙහි ද; **යථාපත්තකාරී,** අර්ථවූ පරිදි ක්‍රියාකරන්නාවූ; **පමුඛම්හි,** මූලා වූ කල්හි ද; **තාවදෙ,** එසේම නැසුන කල්හි; **අවිනට්ඨම්හි,** නොනැසුන කල්හි; **සඞ්ගහනාහෙතු,** සඞ්ග්‍රහ කිරීමට හේතුවූ; **යථාඤ්ඤායං,** න්‍යාය වූ පිළිවෙළින්; **පවක්ඛාමි,** කියන්නෙමි; **ආපත්තිනයා,** ආපත්ති ක්‍රමයෝ ද; **පෙය්‍යාලමෙව ච,** පෙය්‍යාල ය ද, **අසෙසෙතුං,** නිරවශෙෂ කරන්ට;

**මහාඛන්ධකෙ උද්දානං නිට්ඨිතං.**

---

111. 112. පිටු

**අඤ්ඤතිත්ථියා,** මෙයින් අන් ලදි ගත්තෝ; **ධම්මං භාසන්ති,** කටයුතු නොකට යුතු කියත්; **මිගසූකරා සෙය්‍යථාපි,** මුව හූරෝ යම්සේ ද එමෙන්; **භාසිතබ්බා න තු නාම ඉති,** කියයුතු නම් නොවේ දැයි; **පාතිමොක්ඛුද්දෙසං,** පාමොක් උදෙසීම කොට; **සම්පජානමුසාවාදෙ,** දැන දැන බොරුකීම වේ; **අනුජානෙය්‍යං යන්නූන,** අනු දන්නෙම් නම් යෙහෙකි; **උපොසථකම්මං භවිස්සති,** පොහෝ කර්මය වන්නේ යයි; **පාතිමොක්ඛං ඉති,** ප්‍රාතිමොක්ෂ යන්නෙහි අර්ථය නම්; **එතං පමුඛං,** මේ ප්‍රධානයි; **එතං මුඛං,** මේ වාරයයි; **එතං ආදි,** මේ ආරම්භ යයි; **සාපත්තිකස්සාති වචනං,** දෙවූ බැව් සහිත නමකි; **පට්ඨපෙස්සාමි,** මූල්කොට පිහිටුවන්නෙමි;

113. පිට.

**විවරිස්සාමි**, විවෘත කරන්නෙමි; **විභජිස්සාමි**, බෙදන්නෙමි; **උත්තානි කරිස්සාමි**, උඩුකුරු කරන්නෙමි; **අට්ඨිං කත්වා**, අර්ථවත් කොට, **සබ්බචෙතසා**, මුළුහිතින්; **සමන්නාහරාම**, සම්කොට සිතට ගණුම්හ; **අවික්ඛිත්ත චිත්තා**, නොහරණ ලද සිත් ඇත්තාහු; **නිසාමෙම**, අසමු; **අසන්තීනාම ආපත්ති**, අවිද්‍යමාන ඇවත නම්; **අනජ්ඣාපන්නා වා හොති**, නොම අවන්නේ හෝ වේ ද; **න බ්‍යාහරිතබ්බං**, කථා නොකල යුතුයි; **එකො පුට්ඨො**, එකෙක් විචාරණ ලද්දේ; **දෙවසිකං**, දවසක් පාසා; **සබ්බා පුථුවි ඉති**, මුළු පොලව දැයි;

114. පිට.

**සාවතා එකාවාසො**, යම්තාක් එක ආවාසයක් වේ ද; **මද්දකුච්ඡිස්මිං**, දරුකුස මැඩි හෙයින් එනම් වූ; **නවා ගමෙස්සං වා**, නොයන්නෙම් දෝ හෝ;

115. පිට.

**පරමාය විසුද්ධියා**, උතුම්වූ විසුද්ධියෙන්; **න සක්කරියෙථ**, සත්කාර නොකරන්නහු නම්; **න මානෙයෙථ**, බුහුමන් නොකරන්නහු නම්; **කොචරහි**, එකල්හි කවරෙක් නම්; **මා නො අගමාසි**, තහමක් නොයව; **සීමං සම්මන්නිතුං**, සීමාවක් සම්මත කරන්ට; **නිමිත්තානි කිත්තෙතබ්බානි**, නිමිති කිතීනය කටයුතුයි; **සාවතා සමන්තා**, යම්තාක් හාත්පස; **අතිමහතියො සීමායො**, ඉතා මහත් සීමාවන්; **උද්දිස්සමානෙ**, උදෙසද්දී; **උද්දිට්ඨමත්තෙපි**, උදෙසූ සැටියේ ම; **අන්තරාපි පරිවසන්ති**, අතර ද පරිවාසය කෙරෙත්; (හෙවත් පාමොක් නිමවන කල අතරමග ද වෙසෙත්);

116. පිට

**වුය්හන්ති**, පාවෙත්, **ධුව නාවා වා**, නිබඳ තිබෙන නැවක් හෝ; **ධුවසෙතු වා**, නිබඳ තිබෙන හෙයක් හෝ; **අසංකෙතෙන**, ලකුණක් නොකොට; **අඩ්ඪයොගං වා**, ගරුඩ පක්ෂාකාර සෙවෙනි ඇති ගෙයක් හෝ, **හම්මියං වා**, සඳලු සහිත ගෙයක් හෝ; **එකං සමූහනිත්වා**, එකක් සමූහනනය කොට; **සමූහනෙය්‍ය**, උදුරන්නේ ය;

117. පිට.

**සමුග්ඝාතො**, මුලිනුපුටාලීම; **තදහු පොසථෙ**, එදවස් පැමිණි පොහොයෙහි; **සම්මන්නිත්වා**, සම්මතකොට; **අසම්මතාය භූමියා**, සම්මත නොකරණලද භූමියෙහි; **උපොසථපමුඛං**, පොහෝ ගෙට ආලින්දයක්,

118. පිට.

**එකජ්ඣං සන්නිපතිත්වා,** එකතැනකට රැස්ව; **නතු එව ඛො කාතබ්බා,** නොකට යුත්තේම ය; **අඩ්ඪකම්පා,** එනම් දතව්වෙන්; **මනං වූළ්හා,** මදකින් දියෙන් ගසාගෙණ යන ලද්දේ; **අල්ලානි,** තෙත් වූහ; **තිචීවරෙන අවිප්පවාසං,** තුන් සිවුරෙන් වෙන්ව වසන; **නික්ඛිපන්ති,** බහා තබත්; **නස්සන්තිපි,** නැසෙත්; **ඩය්හන්තිපි,** දැවෙත්; **උන්ද්‍රූරෙහිපි,** මීයන් විසින් ද; **ඛජ්ජන්ති,** කනු ලැබෙත්; **දුච්චොලා හොන්ති,** නපුරු කඩ ඇත්තාහු වෙත්. (නරක්වූ සිවුරු ඇත්තාහු වෙත්.); **ලූඛචීවරා,** රූක්ෂ චීවර ඇත්තාහු ද;

120. පිට.

**අගාමකෙ අරඤ්ඤෙ,** ගමක් නොවන කැලේ; **සත්තබ්භන්තරා,** අබතුරු සතක් වේ ද; **උදකුක්ඛෙපා,** ජලය ඉසීමෙන්; **සම්භින්දන්ති,** සඹෙහද කොට සම්මත කෙරෙත්; **අකුප්පං,** කම් කොප්‍ය නොවූ; **ඨානාරහං,** කාරණයට සුදුසුවූ; **අජ්ඣොත්ථරන්ති,** යටකෙරෙත්; **සීමන්තරිකං,** සීමාවට අතරක්; **අධම්මෙන වග්ගං,** අධර්මයෙන් වර්ගවූ; **සාවෙතබ්බං,** ඇස්විය යුතුයි;

121. පිට.

**පඤ්චමො,** පස්වෙනි පාමොක් දෙසීම; **සවර භයං,** වන වැසි මිනිසුන්ගෙන් බියක්; **වාළන්තරායො,** චණ්ඩමෘගයන්ගෙන් වූ අනතුරය; **සිරිංසපන්තරායො,** සර්පයන්ගෙන් වූ අනතුරය;

122. පිට.

**අනජ්ඣිට්ඨා,** ආරාධනා නොකරණ ලද්දාහු; **අජ්ඣෙසිතුං,** ආරාධනය කරන්ට; **ආඝාතං,** ක්‍රොධ; **වධෙන තජ්ජෙන්ති,** වධයෙන් තර්ජනය කෙරෙත්; **තුලයිත්වා,** ප්‍රමාණකොට;

123. පිට.

**අනොකාස කතං,** අවසර නොකරණ ලද්දාවූ (අවසර නොලැබූ මහණ); **ඔකාසං කාරාපෙත්වා,** අවකාශ කරවා; **පුරා,** සම්පාතාගතයෙහි හෙවත් නොබෝ කලකින්; **අකාරණෙ,** නොකරුණෙහි; **පටිකොසිතුං,** විරුද්ධව කථාකරන්ට;(වළක්වන්නට;)

124. පිට.

**නමෙතං ඛමති,** ඒ මට නොරුචි යි; **සඤ්චිච්ච,** දැන දැන; **න නසාවෙතබ්බං,** නො ඇස්විය යුත්තේ නොවේ; **කාකස්සරකො හොති,** කවුඩු හඬ ඇත්තේ වෙයි; **සගහට්ඨාය,** ගිහීන් සහිතවූ; **ථෙරාධිකං,** තෙරුන් අයත් කොට; **අනුජානාමි ඉති,** අනුදනිමි යි වදාළසේක;

**අඤ්ඤතිත්ථියභාණවාරං නිට්ඨිතං,**

**චොදනා වත්ථු**, චෝදනා වාස්තු නම් ග්‍රාමය; **තත්‍ර සුදං**, එකල්හි වනාහි;

125. පිට.

**තස්සාධෙය්‍යං**, ඔහුට අයිති කොට; **අපෙක්ඛිංසු**, ආරාධනා කළාහු ය; **නවත්තන්තීති**, පාඩම් නොපවතී යි, **සාමන්තා ආවාසා**, ආසන්නවූ ආවාස ය; **සජ්ජුකං**, එදා ම එන පිණිස; **පරියාපුණිත්වා**, පාඩම්කොට; **පච්චාගඤ්ඡි**, ආපසු හැරී ආවේය; **පක්ඛස්ස**, පක්ෂය සම්බන්ධ වූ;

126. පිට.

**කතමී ඉති**, කවරී දැයි; **පක්ඛගණනමත්තං අපි**, පක්ෂ ගණන් පමණකුත්; **කීවතිකා**, කොපමණ ද; **නාමග්ගෙන වා**, නම් වසයෙන් හෝ; **සලාකං වා**, කුසපත් හෝ; **ගාහෙතුං**, ගන්වන්ට; **කාල වතො**, කල් ඇතුව;

127. පිට.

**ඡමාය**, බිම; **ගත්තානිපි**, ශරීර ද; **පංසුකිතානි**, පස්වැකුනාහු; **දිසං ගමිකා**, දික් බලා යන්නෝ; **අපදිසෙය්‍යුං**, සඳහන් කළාහු නම්;

128. පිට.

**ආගතාගමො**, අවබොධ කළ ආගම ඇත්තාවූ; **මාතිකාධරො**, උභය මාතෘකා දරන්නාවූ; **අපලාපෙතබ්බො**, ප්‍රිය වචනයෙන් බිණිය යුත්තේ ය; **චුණ්ණෙන**, සුන්නෙන් ද; **මත්තිකාය**, ඇඟ ගාන මැටියෙන් ද; **සත්තාහකාලිකං**, සත් දවසකට කල් නියමකොට; **පාහෙතබ්බො**, යැවිය යුතුයි; **පාරිසුද්ධිං දතුං**, පිරිසිදු බව දෙන්ට;

129. පිට.

**ඨානා චාවෙස්සාම**, උන්තැනින් පහකරන්නෙමු නම්; **අභිවඩ්ඪිස්සති**, වැඩෙන්නේය; **විබ්භමති**, ගිහිවේ ද; **සාමණෙරො පටිජානාති**, සාමණේරය යි හඟවා ද; **ඛිත්තචිත්තකො**, වික්ෂිප්ත සිත් ඇති වූයේ යයි; **වෙදනට්ටො**, වේදනාවෙන් පීඩිතය යි; **උක්ඛිත්තකො**, උත්ක්ෂෙපණීය කර්මය කරණ ලද්දෙකැයි; **අනාහටො හොති**, නොගෙණෙන ලද්දේ වෙයි; **සඞ්ඝප්පත්තො**, සඞ්ඝයා කරු පැමිණියේ; **සුත්තො**, සයනය කෙළේ; **සමාපන්නො**, සමාධියට සමවන්නේ;

131. පිට.

**සන්ති කරණීයං**, කටයුතු ඇතැයි; **ගණ්හිංසු**, අල්වා ගත්හ; **ඉඞ්ඝ**, එසේ නම්; **මුහුත්තං මුඤ්චථ**, මොහොතකට මුදව්; **නිස්සීමං නෙථ**, සීමාවෙන් බැහැරගෙණ යව්; **භික්ඛුපච්චත්ථිකා**, පස මිතුරු භික්ෂූහු;

132. පිට.

**නපි සරති**, සිහි නොකරන්නේ ද වෙයි; **උම්මත්තක සම්මුතිං දාතුං**; උමතු සම්මුතිය දෙන්ට; **සාමන්තො භික්ඛු**, ලඟ සිටි මහණ තෙමේ;

137. පිට.

**පටිකරෙය්‍යුං**, ප්‍රතිකර්ම කරන්නාහු නම්; **අකාමා න වචනීයා ඉති**, නොකමැති නම් නොකිය යුතු යයි වදාළසේක,

**චොදනා වත්ථු භාණවාරං නිට්ඨිතං,**

---

**තදහුපොසථෙ**, එදවස් පැමිණි පොහෝ දිනයෙහි;

138. පිට.

**ධම්මසඤ්ඤිනො**, ධර්මය යන සංඥ ඇත්තාහු; **වග්ගා**, වර්ගී වූවාහු; **බහුතරා**, මීට වැඩිවූ; **සමසමා**, මොවුන්ට සමවූ; **උද්දිට්ඨං**, උදෙසන ලද්ද; **උද්දෙසකානං**, උදෙසුවන්ට; **ථොක තරා**, ටිකවූ; **උද්දිට්ඨමත්තෙ**, උදෙසූ කෙණෙහි;

139. පිට.

**අවුට්ඨිතාය පරිසාය**, පිරිස නොනැගිටි කල්හි; **එකච්චාය පරිසාය වුට්ඨිතාය**, ඇතම් පිරිසක් නැගිටි කල්හි;

**අනාපත්ති පණ්ණරසකං නිට්ඨිතං**

---

**වග්ගා වග්ගසඤ්ඤි පණ්ණරසකං නිට්ඨිතං**

---

142. පිට.

**කප්පති නු ඛො**, කැප දේ හෝ; **නනු ඛො කප්පතීති**, කැප නො වේ දේ හෝ යි; **වෙමතිකා**, විමති ඇත්තාහු;

**වෙමතික පණ්ණරසකං නිට්ඨිතං.**

---

143. පිට.

**කුක්කුච්ච පකතා**, කුකුසින් මඩනා ලද්දේ;

**කුක්කුච්ච පකත පණ්ණරසකං නිට්ඨිතං.**

---

### 144. පිට.

**නස්සෙන්ත තෙ**,(නස්සන්තු එතෙ)ඔහු නසිත්වා යි; **විනස්සන්තු එතෙ**, ඔහු වැනසෙත් වා යි; **කො අත්ථො ඉති**, කවර ප්‍රයෝජන දැයි; **භෙදපුරෙක්ඛාරා**, භෙදය පෙරටු කොට ඇත්තාහු; **ථුල්ලච්චයස්ස**, තුලසියක්හුගේ; **ආපත්ති ඉති**, පැමිණීම වේය යි වදාලසේක;

**භෙදපුරෙක්ඛාර පණ්ණරසකං නිට්ඨිතං.**

**පඤ්චවීසති තිකා නිට්ඨිතා.**

---

### 147. පිට.

**එකසත පඤ්චසත්තති තිකා**, තික එක්සිය පන් සැත්තෑව (175)කි; **සත්තතික සතානි**, තික සත් සියය(210)ක්; **ඔක්කමන්ති**, බසිත් ය යි; **අන්තො සීමං**, සීමාව තුලට; **පෙය්‍යාල මුඛෙන**, පෙය්‍යාලං ක්‍රමයෙන්; **අනුවත්තිතබ්බං**,අනුව පැවතිය යුතුයි;

### 148. පිට.

**පාටිපදෙ හොති**, පැළවිය වේ ද; **නිස්සීමං ගන්ත්වා**, සීමාවෙන් බැහැර ගොස්; **ආවාසිකාකාරං**, ආවාසික ආකාරය ද; **ආවාසිකලිඞ්ගං**, ආවාසික ලක්ෂණය ද; **ආවාසික නිමිත්තං**, ආවාසික වීමේ නිමිති ද; **ආවාසිකුද්දෙසං**, ආවාසිකයන්ගේ උද්දේශය ද; **සූපට්ඨිතං**; මනාකොට තබන ලද්දවූ; **සුසම්මට්ඨං**, මනාකොට හමදින ලද් දවු; **න විචිනන්ති**, නොසොයද්ද; **පාටෙක්කං**, වෙන්වසයෙන්;**පද සද්දං**, අඩිගැස්ම; **සජ්ඣාය සද්දං**, හදාරණ ශබ්දය ද; **උක්කාසිත සද්දං**, කැසිත හඬ; **ඛිපිත සද්දං**, කිඹිසිනා හඬ ද;

### 149. පිට.

**අඤ්ඤාතකං පත්තං**, නොහඳුනනා ලද පාත්‍රයක් ද; **පාදානං ධොතං**, පාසේදූ තැන් ද; **උදක නිස්සෙකං**, ජල වැගිරීම ද; **උපාහන පප්ඵොටන සද්දං**, වහන් පොළනා ශබ්දය ද; **නානා සංවාසකා**, නානා සංවාසක වූ; **සමානසංවාසක දිට්ඨිං**, සමානසංවාසකය යන මනස්කාරය;

### 150. පිට

**නාභිවිතරන්ති**, මඩනට නො හැකි වෙත්; **එකතො උපොසථං කරොන්ති**, එක් ව පොහොය කෙරෙත් ද;**සභික්ඛුකා ආවාසා**, භික්ෂූන් සහිත වූ ආවාසයෙන් පිටත් ව; **සඞ්ඝෙන අඤ්ඤත්‍ර**, සඞ්ඝයාගෙන් තොරව;**අන්තරායා අඤ්ඤත්‍ර**, අන්තරායකින් තොරව;

## 151. 152. පිට.

**ජානං**, දන්නේ ද; **පාරිවාසික පාරිසුද්ධි දානෙන**, පරිවාස කරණ ලද පාරිසුද්ධිය දීමෙන්; **අඤ්ඤත්‍ර අවුට්ඨිතාය පරිසාය**, නැගී නො සිටි පිරිස හැර; **අනුපොසථෙ**, පොහොය නැති දවස්හි;

**උපොසථක්ඛන්ධකං නිට්ඨිතං.**

---

## 153. පිට

**වස්සාවාසො**, වස්විසීම; **අප්පඤ්ඤත්තො හොති**, නො පණවන ලද්දේ වේ; **එකින්ද්‍රියං**, එක් ඉන්ද්‍රියයක් ඇත්තාවූ; **සඞ්ඝාතං ආපාදෙන්තා**, විනාසයට පමුණුවමින්;

## 154. පිට.

**ස්වාක්ඛාත ධම්මා**, තපුරුකොට ප්‍රකාශකරණ ලද ධර්ම ඇත්තාවූ; **අල්ලීයිස්සන්ති**, ඇලෙන්නාහු ය; **සඞ්කාසයිස්සන්ති**, තිබඳ වසන්නාහුය; **ඉමෙ හි නාම සකුන්තකා**, මේ කුරුල්ලෝ පවා; **කුලාවකානි**, කූඩු; **පුරිමිකා**, පෙරවස් එළඹීම ද; **පච්ඡිමිකා**, පසුවස් එළඹීම ද; **වස්සූපනායිකා**, වස්එළඹීම්; **ආසාළ්හියා**, ඇසළ පුණු පොහොය; **අපරජ්ජුගතාය**, අතික් දීනට ගිය කල්හි;(අවපෑළවිය ද,)**මාසගතාය**, මස ගිය කල්හි, **අන්තරවස්සං**, වසකින් අතර; **පුරිමං වා තෙමාසං**, පෙර තුන්මස හෝ; **පච්ඡිමං වා තෙමාසං**, පසු තුන් මස හෝ;

## 155. පිට.

**තදහු**, එදවස්; **අනුපගන්තුකාමා**, නොඑළඹෙනු කැමැත්තාහු; **උක්කඩ්ඪිතුකාමො**, උඩට අදිනු කැමැත්තෝ; **අයථා**, **ආයතී** යෝ; **ආගමෙ ජුණ්හෙ**, එන පුර පස ගිය කල්හි; **අනුවත්තිතුං**, අනුව පවත්නට; **ආගමෙන්තු**, බලාපොරොත්තු වේවා; (ඉවසාවා), **අවචායිකං**, ඉක්මන් වේ ද; **සත්තාහකරණීයෙන**, සතිකරණයෙන්; **අප්පහිතෙ**, පණිවුඩ නො එවූ කල්හි; **සන්නිවත්තො**, නැවතීම නොහොත් ආපසු පැමිණීම;

## 157. පිට.

**කප්පියකුටි**, කැප කිළියක්; **උදපානො**, ළිඳක්; **ආරාම වත්ථුං**, ආරාම වත්තක්; **සයනිඝරං**, සැතපෙන ගෙයක්; **උද්දොසිතො**, බඩුහලක්; **අට්ටො**, අට්ටාලයක්; **මාලො**, මාලකයක්; **ආපණො**, සල්පි

ලක්; රසවති, මුළුතැන් (කුස්සි) ගෙයක්; පුත්තස්ස වාරෙය්‍යං වා හොති, පුතෙකුගේ ආවාහ මගුලක් හෝ වේද; ධීතුයා වාරෙය්‍යං වා හොති, දුවකගේ විවාහ මගුලක් හෝ වේද; අභිඤ්ඤාතං, ප්‍රසිද්ධවූ; පුරා, තොඹබා් කලකින්; පබ්බජන්ති, නස්නේ ය සි;

160. පිට.

අනභිරතං, අනභිරති ඇත්තහු; වූපකාසාපෙස්සාමි වා, අන් තැනෙක පමුණුවන්නෙමි කියා හෝ; ගරු ධම්මං, ගරුකා පත්තියකට; උස්සුක්කං කරිස්සාමි, ඉක්මන් කරන්නෙමි; ගණ්පූර කො වා භවිස්සාමි, ගණ පූරක යෙක් වන්නෙමි කියා හෝ; මූලාය පටිකස්සනා රහො හොති, මූලට ඇදිය යුතු වේද; පරිණාමෙය්‍ය වා ඉති, පිරිණමන්නේ දේ හෝයි;

165. පිට.

භික්ඛුභත්තිකො, භික්ෂූන්ගේ බැලයෙක්; උද්‍රියති, දෙදරා ද; භණ්ඩං, දූව බඩු; ඡේදාපිතං, කප්පවන ලද්දේ; අවභාපෙය්‍යං, අද්ද වා ගන්නාහු නම්; දජ්ජාහං, මම දෙමි;

වස්සාවාස භාණවාරං නිට්ඨිතං.

---

165. පිට.

වස්සූපගතා, වස් එළඹුනාවූ; වාළෙහි, වල් මෘගයන් විසින්; උබ්බාළ්හා හොන්ති, පිඩාකරණ ලද්දාහු වෙත්;

166. පිට.

පරිපාතිංසුපි, මරා ද හෙලූහ; විළුම්පන්ති, වොලෝ ද ගණිත්; (කොල්ල කත්;) ආකොටෙන්තිපි, තැළීම ද කෙරෙත්; පිසාචෙහි, පිසසුන් විසින්; ආවිසන්ති, ආවේස ද වෙත්; ඔජම්පි හරන්ති, ඔජා ව ද පැහැර ගණිත්, මෙඩා භිජ්ජිත්, දෙපරිද්දකින් බිඳුනේ ය; යාවදත්ථං, ප්‍රයොජන ඇති තාක්; ලහුපරිවත්තං, වහා පෙරලෙන සවභාව ඇත්තකැයි;

167. පිට

ථුල්ලකුමාරි, වැඩිවිය පැමිණි කුමාරිකාවක්; අස්සාමිකං නිධිං, සවාමියෙකු නැති නිධානයක්; ගරුකො ඓා, බැරරුම් යයි; මයි සම්මුඛිභූතෙ, මා හමුවූ කල්හි;

### 168. 169. පිට

**සුසසූසිසසන්ති**, අසන්ට කැමති වන්නාහු ය; **සොතං ඔද-හිස්සන්තීති**, ඇසීමට කන් පිහිටුවන්නාහු ය; **වජෙ**, ගොපල්ලන් ගේ වාසස්ථානයෙහි; **සඞ්ඝට්ටන**, තවලමක් හා; **රුක්ඛ සුසිරෙ**, ගස් සිදුරෙහි; **පිසාචිල්ලිකා**, පිසාච පැටව්; **රුක්ඛවිටභියා**, රුක් වෙලෙප්හි;

### I70. පිට

**මිග ලුද්දකා**, මුව වැද්දෝ; **අජ්ඣොකාසෙ**, සෙවන නැති තන්හි; **නිම්බකොසම්පි**, පියසි කොළවරට ද; **අසෙනාසනිකා**, සෙනසුන් නැත්තාහු; **ඡවකුටිකාය**, සොහොන් පැලෙහි; **ඡවඩාහකා**, මිනී පුලුස්සන්නෝ; **ඡත්තෙන**, කුඩය යට; **චාටියා**, සැළියෙහි; **නත්තා**, මුනුබුරු තෙමේ; **පටිස්සුතො හොති**, ප්‍රතිවචන දෙන ලද්දේ (ගිවිස්සේ) වෙයි;

### 171. 173. පිට

**විසංවාදෙසීති**, වරදවා කීයෙහි ද; **ගරහිතො නනු**, නින්දා කරණ ලද්දේ නොවේ ද; **පටිස්සවෙ ච**, පොරොන්දුවෙහි ද; **බහිද්ධා**, පිට ආවාසයකදී; **සකරණීයො**, කටයුතු සහිතවූයේ; **ද්වීහ තීහං වසිත්වා**, දෙතුන් දිනක් වැස; **තං සත්තාහං**, ඒ සත් දවස; **බහිද්ධා වීතිනාමෙති**, පිටගෙවා ද; **අතෙනා සහති වතතං**, ඇතුලත නැවතීම; **පටිස්සවෙ**, ගිවිසීමෙහි; **සත්තාහං අනාගතාය**, සත් දවසකට නො පැමිණියා වූ; **කොමුදියා චාතුමාසිනියා**, ඉල්මස පසළොස්වක ඇතිකල්හි;

**වස්සූපනායිකක්ඛන්ධකං නිට්ඨිතං.** (තතියං)

---

### 176. පිට

**සන්දිට්ඨා**, සන්දෘෂට මිත්‍ර වූ; **සම්භත්තා**, භජනය කළ මිත්‍ර වූ; **සම්මොදමානා**, සතුටු වෙමින්; **ඵාසුකං**, ඵාසු වූ පරිද්දෙන්; **න ච ආලපෙය්‍යාම**, ආමන්ත්‍රණය ද නොකරන්නෙමු නම්; **න සල්ල-පෙය්‍යාම**, සමග කථා ද නොකරන්නෙමු[නම්;] **පිණ්ඩාය පටික්ක-මෙය්‍ය**, පිණ්ඩපාතයෙන් පස්සට හැරී එන්නේ ද; **අවක්කාර-පාතිං**, ඉඳුල් බඳුන; **ඔපිලාපෙය්‍ය**, පාකොට හරින්නේ නම්; **පටි-සාමෙය්‍ය**, තැන්පත් කරන්නේ නම්; **රිත්තං**, හිස් වූ; **තුච්ඡං**, ශූන්‍ය වූ; **පානීයඝටං වා**, පැන් කළය හෝ; **වච්චඝටං වා**, වැසිකිළි කළය හෝ; **උපට්ඨාපෙය්‍ය**, එලවා තබන්නේ නම්; **අවිසය්හං හොති**, නොහැකි වේ ද; **හත්ථ විකාරෙන**, අතින් ආකාර දක්වී-මෙන්; **හත්ථ විලඞ්ඝකෙන**, අත් වලගින් හෙවත් අත්පිට එසවීමෙන්;

176. 177. පිටු.

අත් විලංගුවෙන්; **නත්වෙව වාචං භින්දෙය්‍ය**, වාග්භෙදය නොකරන්නේ ම ය; **නකිලමෙය්‍යාම ඉති**, නො වෙහෙසෙන් නෙමුයි කියායි; **ආචිණ්ණං ඛො**, පුරුදු කරණ ලද්දේ මය; **ඛමනීයං**, ඉවසිය හැකි සැප ඇත්තේය; **යාපනීයං**, යැපිය හැකි ප්‍රත්‍යය ඇත්තේය; **සෙතුඝාතො**, මාර්ගයෙන් හේතු නැසීම වෙයි;

178. පිට.

**අඵාසුකඤ්ඤෙව වුත්ථා සමානා**, පහසු නැති පරිද්දෙන්ම වාසය කලාහු; **පසු සංවාසකඤ්ඤෙව**, සිවුපාවුන්ට සමානවූ වාසයක්ම; **එළක සංවාසකඤ්ඤෙව**, එළුවන්ට සමානවූ එක්වවිසීමක් ම;

179. පිට.

**සපත්තසංවාසකඤ්ඤෙව**, සතුරුවාසයක් ම; **මූගබ්බතං**, ගොළුවතක්වූ; **තිත්ථිය සමාදානං**, තීර්ථකයන්ගේ සමාදානයක්; **තීහි ඨානෙහි**, කරුණු තුණකින්; **දිට්ඨෙන**, දුටුදෙයින් ද; **සුතෙන**, ඇසූ දෙයින් ද; **පරිසඞ්කාය**, සැකකිරීමෙන් ද; **අඤ්ඤමඤ්ඤානුලොමතා**, ඔවුනොවුන්ට අනුලෝම බවද; **ආපත්ති වුට්ඨානතා**, ආපත්තියෙන් නැඟී සිටින බව ද; **විනය පුරෙක්ඛාරතා**, විනය පෙරටු කොටගෙණ වසන බව ද; **මං වදතු**, මට කියත්වා; **පස්සන්තො**, දොසය දක්නෙමි; **පටිකරිස්සාමි**, ප්‍රතිකර්ම කරන්නෙමි; **අවජානති**, හිඳිත්.

180. පිට.

**මුච්ඡිගතො**, මූසපත් වූයේ හෙවත් හටගත් මූර්ජා ඇත්තේ; **පපති**, වැටුනේය; **යාව පවාරෙති**, යම්තාක් පවාරණය කෙරේද; **තදනන්තරා**, ඒ අතර;

**පඨමක භාණවාරං නිට්ඨිතං.**

---

**අනාපත්ති පණ්ණරසකං නිට්ඨිතං; වග්ගාවග්ගසඤ්ඤිපණ්ණරසකං නිට්ඨිතං**

---

**වෙමතික පණ්ණරසකං නිට්ඨිතං; කුක්කුච්චපකත පණ්ණරසකං නිට්ඨිතං,**

---

## භෙදපුරෙක්ඛාර පණ්ණරසකං නිට්ඨිතං-පඤ්චවීසති තිකං නිට්ඨිතං,

---

201. පිට.

**පාරිවාසික පවාරණාදානෙන,** අතර පිරිවසන ලද්දවූ පවාරණය දීමෙන්; (=අවලංගු වූ පවාරණ දානයෙන්;) **අඤ්ඤත්‍ර අවුට්ඨිතාය පරිසාය,** පිරිස නොනැගී සිටිය තැන හැර; **නපවාරෙතබ්බං,** පවාරණය නොකට යුතුයි; **සඞ්ඝසාමග්ගියා අඤ්ඤත්‍ර,** සඞ්ඝසාමග්‍රිය හැර; **අපවාරණාය,** පවාරණය නැති කාලයෙහි; **නපවාරෙතබ්බං,** නොපැවරිය යුතුයි;

## දුතියක භාණවාරං නිට්ඨිතං,

---

201. පිට.

**සවරභයං,** වැද්දන්ගෙන් වන භයක්; **තෙවාචිකං,** තුන් තුන් යලක් කියා; **බාළ්හතරං,** ඉතා දූඩිවූ; **සමානවස්සිකං,** සමාන වූස් ඇත්තවුන් එකතුකොට; **ඛෙපිතා හොති,** ගෙවන ලද් දී වේ; **අප්පවාරිතොව භවිස්සති,** පවාරණය නොකෙළේම වන්නේය; **විභායිස්සති,** එළිවන්නේය; **එකවාචිකං,** එකවරක් කියා; **සුත්තන්තිකෙහි,** සූත්‍රධරයන්; **සඞ්ගායන්තෙහි,** සඞ්ගායනා කරන්නවුන් විසින්; **විනයං විනිච්ඡිනන්තෙහි,** විනය විනිශ්චය කරන්නවුන් විසින්;

202. පිට.

**ධම්මං සාකච්ඡෙන්තෙහි,** ධර්මසාකච්ඡා කරන්නවුන් විසින්; **අනොවස්සකං,** වැස්සෙන් නො තෙමෙන්නාවූ ඉඩම; **පරිත්තඤ්ච හොති,** සවල්ප ද වෙයි; **මහා ච මෙඝො,** මහත්වූ මෙඝයක් ද; **උග්ගතො හොති,** නැංගේ වෙයි;

203. පිට.

**ඔකාසං අකරොන්තස්ස,** අවසර නොකරන්නහුගේ (=නොදෙන්නහුගේ); **සංඝ මජ්ඣෙ උද්ධරිතබ්බං,** සඟමැද ගෙණහැර දක්විය යුතුයි; **පෙසලා භික්ඛූ,** ප්‍රිය ශීලී භික්ෂූහු; **පවාරණං ඨපෙන්ති ඉති,** පවාරණය තබත් යයි; **අවත්ථුස්මිං,** වස්තුවක් නැතිව; **ලපිතාය,** තෙපලූ කල්හි;

204. පිට.

**අනුයුඤ්ජියමානො**, කරුණු යොදා විචාරණු ලබන්නේ; **අනුයොගං දත්වා**, උත්තර දෙන්ට; **මා භණ්ඩනං**, ඩබර නොකෙරේවා; **මා විග්ගහං**, විවිධග්‍රහණය නොකෙරේවා; **මා විවාදං**, විවාද නොකෙරේවා; **ඛමද්ධිත්වා**, මදීනය කොට; **කිම්හි**, කවර වස්තුවෙක්හි; **සීලවිපත්තියා ඨපෙසි**, සීල විපත්තියෙහි තබන්නෙහි ද;

205. පිට.

**අන්තග්ගාහිකා දිට්ඨි**, උභයාන්තය ග්‍රහණය කරන්නාවූ දෘෂ්ටිය; **දිට්ඨෙන වා ඨපෙසි**, දක්නා ලද්දෙන් හෝ තබන්නෙහි ද;

206. 207 පිටු.

**අනනුවාදෙ**, චොදනා රහිතයෙකැයි; **අනුද්ධංසිතං**, චොදනාකරණ ලද්දයි; **එකමන්තං අපනෙත්වා**, එක් අවකාශයකට ඉවත්කොට; **උද්දහරෙය්‍ය**, ප්‍රකාශ කරන්නේය; **වත්ථුං පඤ්ඤායති**, ඇවතකට වස්තුවක් පෙණේ;

208. පිට.

**කලලං**, සුදුසුයි; **උක්කොටෙති**, උක්කොටනය කෙරේද; (නැවත විනිශ්චයට ගණීද;) **සාමන්තා**, සමීපයෙහි; **භස්සකාරකා**, කොලාහල ඇතිවන කථා කරන්නාවූ; **අධිකරණකාරකා**, තඩු ඇතිකරන්නාවූ; **ලහුං ලහුං**, වහ වහා; **අසංවිහිතා**, සංවිධාන නැත්තාහු;

209. පිට.

**අනිස්සරා මො**, අධිපති නොවන්නහුය; **අනුවසෙය්‍යුං**, අනුව වසන්නහු නම්; **ආගමෙ ජුණ්හෙ**, ලබන පුර පසළොස්වක්හි; **චාතුමාසිනියා**, සාරමාසය අවසන්වූ ඉල් පසළොස්වක්හි; **අකාමා පවාරෙතබ්බා**, නොකැමැත්තෙන් ද පැවරිය යුතුයි; **අනනුයොගක්ඛමො**, අනුයොගක්ෂම නොවන්නේයයි; **ආගමෙති**, බලාපොරොත්තු වෙව;

210. පිට.

**සමනුයුඤ්ජිත්වා**, කරුණු යොදා විචාරා; **සමනුගාහිත්වා**, කරුණු ගන්වා; **සමනුභාසිත්වා**, ධර්මයෙන් කියා; **පවාරණාසඞ්ගහං**, පවාරණය කල් දැමීම; **පරිබාහිරා භවිස්සාම**, බැහැරවූවෝ වන්නෙමු;

**පවාරණක්ඛන්ධකං නිට්ඨිතං**

## 212. 213 පිටු.

**ඉස්සරියාධිපච්චං,** ඓශ්වර්‍ය්‍ය හා අධි පති බව ඇති; **මා ඛො අභිප්පසාරෙය්‍යාසි,** දිගු නොකරව; **හනෙ,** කොලෙනි; **අනුසාසියන්ති,** අවවාද කරන්නේය; **පයිරුපාසථ,** ආශ්‍රය කරව්; **සම්පරායිකා,** පරලොව වියයුතුවූ; **ඉධූපසංඛානනාණි,** මෙහි එලඹියාහුය; **නාව බුභුනනං,** එතෑක් මෙං හොතක්; **ඉධෙව හොථ,** මෙහි ම වසව්; **පුරතො පෙක්ඛමානානං,** ඉදිරියෙහි බලා සිටියදීම; **පාචිනාය,** සඳහඩ පහණෙහි; **නිමුජ්ජිත්වා,** ගිලී; **උම්මුජ්ජිත්වා,** නැගී; **විහාර පච්ඡායායං,** විහාර පිටිපස සෙවනෙහි; **සමනුනාහරන්ති,** කල්පනා කෙරෙත්; **භියොසො මත්තාය,** බොහෝ සෙයින්;

## 214. 215. පිටු.

**සඞ්ඛලිඛිතං,** ලියනලද සකක්මෙන්; **පාදා භිජ්ජිංසු,** පතුල් බිදුනාහුය; **ඡුවෙඨා හොති,** පහස්නාලද්දේවෙයි; **ගවඝාතනං,** ගෙරින් මරණ ස්ථානය; **සංවිජ්ජන්ති ඛො පන,** ඇත්තාහු ම ය; **වීණාය,** වීණාවෙහි; **තන්තිස්සරෙ,** තත් හැඬවීමෙහි;

## 216 පිට.

**අච්චායතා,** අධික කොට අදනා ලද්දාහු; **සරවතී වා හොති,** හඩ ඇත්තී හෝ වේද; **කම්මඤ්ඤා වා ඉති,** කර්‍මයට යොග්‍ය වූවා හෝවේ දැයි; **එතං හොති ඉති,** මෙය නැතැයි කී; **නාති සිථිලා හොන්ති,** ඉතා ලිහිල් නොවෙත් ද; **නෙව අච්චායතා හොන්ති,** අධික කොට අදනා ලද්දාහු නොවෙත් ද; **කොසජ්ජාය,** කුසීත බව පිණිස; **විරිය සමතං,** වීර්‍ය්‍යසමත්වය; **අධිට්ඨහ,** ඉටාගනුව; **ඉන්ද්‍රියානං ච සමතං,** ඉඳුරන්ගේ සමභාවය ද; **පටිවිජ්ඣ,** ප්‍රතිවෙධ කරව; **අධිමුත්තො හොති,** ප්‍රත්‍යක්‍ෂකොට සිටියේ වේ; **නෙක්ඛම්මාධිමුත්තො හොති,** නෛෂ්ක්‍රම්‍යය විශ්වාස කළේ වෙයි; **පවිවෙකාධිමුත්තො හොති,** අතිශය විවේකය ප්‍රතිවෙධකොට සිටියේ වෙයි; **අබ්‍යාපජ්ඣාධි මුත්තො හොති,** ව්‍යාබාධ රහිත භාවයවූ රහත්බව පිළිවිද සිටියේ වෙයි. **උපාදානක්ඛයාධි මුත්තො හොති,** කාමාදි උපාදානයන්ගේ ක්‍ෂය සඞ්ඛ්‍යාත අර්හත්වය ප්‍රත්‍යක්‍ෂ කොට සිටියේ වෙයි; **තණ්හක්ඛයාධිමුත්තො හොති,** තෘෂ්ණා ක්‍ෂය සඞ්ඛ්‍යාත රහත් බව පිළිවිද සිටියේ වේ; **අසම්මොහාධි මුත්තො හොති,** මුළා නොවීම වූ රහත් බව පිළිවිද සිටියේ වේ;

## 217. පිට.

**අසමනුපස්සන්තො,** නොදක්නේ; **පතිචයං,** නැවත වැඩීමක්; **ලාභසක්කාරසිලොකං,** ලාභසත්කාර කීර්තියක්; **නිකාමය**

**මානො,** කැමතිවෙමින්; **සීලබ්බත පරාමාසං,** සීලව්‍රතයන් පරාමර්ශනය කිරීම; **සාරතො පච්චාගච්ඡන්තො,** සාරභාවයෙන් දන්නේ; **භුසාඅපි,** බලවත්වූද; **චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා,** චක්ෂුරින්ද්‍රියයෙන් හැඳිනිය හැකි රූපයෝ; **ආපාථං,** හමුවට; **නෙව පරියාදියන්ති,** හාත්පසින් තොම අල්වා ගණීත්; **අමිස්සීකතමෙව,** මිශ්‍ර නොකරණ ලද්දේ ම; **ආනෙඤ්ජප්පත්තං,** අකම්ප්‍යබවට පැමිණියේ වේ; **වයං ච,** විනාසය ද; **අච්ඡිද්දො,** සිදුරු නැත්තාවූ; **අසුසිරො,** කුහර නැත්තාවූ; **එකග්ඝනො,** එකට ඝනවූ; **වාතවුට්ඨී,** වාත මෙඝයක්;

218. පිට.

**නෙව සඞ්කම්පෙය්‍ය,** කම්පා නොකරන්නේද; **න සම්පවෙධෙය්‍ය,** නොසොල්වන්නේද;

56. **නෙක්ඛම්මං,** කෙලෙසුන් කෙරෙන් නික්මීම වූ නෛෂ්ක්‍රම්‍යය; **අධිමුත්තස්ස,** අවබොධ කොට සිටියාවූ; **චෙතසො,** චිත්තයාගේ; **පවිවෙකඤ්ච,** ප්‍රකෘෂ්ට විවේකය ද අවබොධකොට සිටියාවූ; **අබ්‍යාපජ්ඣාධිමුත්තස්ස,** අව්‍යාපාද භාවය අවබොධ කොට සිටියාවූ; **උපාදානක්ඛයස්ස ච,** උපාදානයන්ගේ ක්ෂයභාවය අවබොධ කොට සිටියාවූ;

57. **තණ්හක්ඛයා'ධිමුත්තස්ස,** තෘෂ්ණාක්ෂය දැන සිටියාවූ; **චෙතසො,** චිත්තයාගේ; **අසම්මොහං,** නුමුළාබව දැන සිටියාවූ; (උත්තම පුද්ගලයා ගේ); **ආයතනුප්පාදං,** ආයතනයන්ගේ උත්පත්තිය; **දිස්වා,** දැක; **සම්මා,** මනාකොට; **චිත්තං,** සිත; **විමුච්චති,** කෙලෙසුන් කෙරෙන් මිදෙයි;

58. **සම්මා විමුත්තස්ස,** අර්හත්මාර්ගයෙන් මොනවට මිදුනා වූ; **සන්තචිත්තස්ස,** සන්සුන් සිත් ඇත්තාවූ; **තස්ස භික්ඛුනො,** ඒ භික්ෂූහු විසින්; (නොහොත්) ඒ භික්ෂූහට; **කරණීයං,** උපාදානයන්ගේ ව්‍යයීභාවය පිණිස නැවත කටයුත්තෙක්; **නත්ථි,** නැත; **කතස්ස,** කරණ ලද්දහුගේ; **පතිචයො,** නැවත කිරීමක්; **නත්ථි,** නැත්තේයි;

59. **එකග්ඝනො,** එකඝන වූ; **සෙලො,** ශෛලමය පර්වතයක් තෙමේ; **යථා,** යම් සේ; **වාතෙන,** වාතය කාරණකොටගෙණ; **න සමීරති,** කම්පා නොවේ ද; **එවං,** එපරිද්දෙන් ම; **කෙවලං,** හුදකලාවූ; **රූපා,** රූපයෝය; **රසා,** රසයෝය; **සද්දා,** ශබ්දයෝය; **ගන්ධා,** සුගන්ධයෝය; **ඵස්සා ච,** ස්පර්ශයෝය යන මොහු ද;

60. **ඉට්ඨා ධම්මා**, මෙබඳු ඉෂ්ටාරම්මණයෝ (නොහොත්) කමනීය කාරණයෝ ද; **අනිට්ඨා ච**, අනිෂ්ටාරම්මණයෝ ද; **තාදිනො**, තාදී ගුණ ඇති ක්ෂීණාශ්‍රවයන්; **නප්පවෙධෙන්ති**, කම්පා නොකෙරෙත්; **ඨිතං චිත්තං**, ස්ථායි වූ චිත්තය ද; **විප්පමුත්තං**, මිදුනේය; (එබැවින්) **අස්ස**, ඒ චිත්තයාගේ; **වයඤ්ච**, විනාශය ද; **අනුපස්සති**, දකී; **අනූපනීතො**, නො පමුණුවන ලද්දේය; **හසමානකා මඤ්ඤෙ**, සිනාසෙන්නවුන් මෙන්; **අඤ්ඤං**, අර්හත් ඵලය; **විඝාතං**, වෙහෙසට; **ඒකපලාසිකං**, එක් පටක් ඇත්තාවූ; **උපාහනං**, වහනක්; **අසීති සකටවාහෙ**, ගැල් වාහ අසූවක් (නොහොත් එකසිය හැටක් ගැල් බර); **හිරඤ්ඤං**, අමු රන්ද; **සත්ත හත්ථිකං ආණීකං ච**, ඇතුන් සත්දෙනෙකුගෙන් යුක්තවූ ඇණියක්ද; **ඔහාය**, හැර; **සජ්ජතා ඉති**, ඇලුනේය යි;

219. පිට.

**ද්විගුණා උපාහනා**, දෙපට වහන්; **තිගුණා**, තුන්පට; **ගණඞ්ගණූපාහනා**, සමූහයක් පට ඇති වහන්; **සබ්බනීලිකා**, සියල්ල නීලවර්ණ වූ, **සබ්බපීතිකා**, සියල්ල පීතවර්ණ වූ; **ලොහිතිකා**, ලෝහිතවර්ණ වූ; **මඤ්ජෙට්ඨිකා**, මදටවන් වූ; **කණ්හා**, කලු වූ; **මහාරඞ්ගරත්තා**, මහා රජනයෙන් රඳනලද්ද වූ; **මහානාමරත්තා**, මහානාම නම් රජනයෙන් රඳනා ලද්දවූ; **නීලකවද්ධිකා**, නීල වර්ණ වැටි ඇත්තා වූ; **ඛල්ලකබද්ධා**, විලුම් වැසුම් තබා බඳිනා ලද්ද වූ; **පුටබද්ධා**, (යොන් වහන්) මූළ බඳනා ලද්ද වූ; **පාලිගුණ්ඨිමා**, උඩුපතුල වෙළා කරණ ලද්ද වූ; **තූලපුණ්ණිකා**, පුළුන් පුරවන ලද්ද වූ; **තිත්තිරපත්තිකා**, තිත්වටුවන්ගේ පියාපත්වැනි වැටි ඇත්තාවූ; **මෙණ්ඩවිසාණ බද්ධිකා**, එළු අඟ වැනි වැටි ඇත්තා වූ; **අජවිසාණ බද්ධිකා**, තිරෙළු අඟ වැනි වැටි ඇත්තා වූ; **විච්ඡිකාලිකා**, ගෝනුසු තගුටු වැනි වැටි ඇත්තා වූ; **මොරපිඤ්ඡ පරිසිබ්බිතා**, මොනර පිලෙන් මහන ලද්ද වූ;

220. පිට.

**චිත්‍රා**, විසිතුරු වූ; **සීහචම්මපරික්ඛටා**, සිංහ සමෙන් අවට සදන ලද්ද වූ; **දීපි චම්ම**, දිවි සමින්; **අජිනචම්ම**, අඳුන් දිවි සමින්; **උද්දචම්ම**, දියබලු සමෙන්; **මජ්ජාරචම්ම**, බළල් සමින්; **කාලක**, ලෙහෙන; **උලූක**, බකමූහුණු; **ඛඤ්ජමානො**, කොරගසමින්; **පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි**, පිටිපසින් පිටිපසින් ලුහු බැන්දේය; **ආරොහිත්වා**, නැගී; **ඔරොහිත්වා**, බැස; **ඔලීනාති**, පැලු නාහු යයි; **ඔමුක්කං**, ගලවා ඉවත්කරණ ලද;

221. පිට.

**ඔදාතවසනා**, සුදුරෙදි අඳනා වූ; **ආසිජීවනිකස්ස**, ජීවත් වීමට සුදුසු වූ; **සිප්පස්ස කාරණා**, ශිල්පයාගේ කාරණයෙන්; **සප්පතිස්සා**, ආදර සහිත වූවාහු; **සභාගවුත්තිනො**, සමාන පැවතුම් ඇත්තාහු; **ආචරිය මත්තෙසු**, ආචාර්‍ය්‍ය ප්‍රමාණ වූවන් කෙරෙහි ද; **අජ්ඣාරාමෙ**, ආරාමය තුළ; **පාදඛීලාබාධො**, පාදයෙහි මස්දලු එන්නාවූ ආබාධය; **පරිග්ගහෙත්වා**, අල්ලාගෙණ; **උච්චාරං අපි**, මල ද; **නික්ඛාමෙන්ති**, පහකරවත්;

222. පිට.

**සහනිසජ්ජම්පි**, රුස්ව හිඳිනා තැනට ද; **බාහුම්පි**, කණු ද; **කණ්ටකම්පි**, කටු ද; **අක්කමන්ති**, මඩිත්; **උක්කං**, ගිනිහුලු ද; **කත්තර දණ්ඩන්ති**, සැරයටිය ද යන මොවුන්; **ධාරසිතුං**, දරන්ට; **කට්ඨපාදුකායො**, ලී වහන්; **තිරච්ඡාන කථං**, ස්වර්ගමොක්ෂ බාධක කථාව; **කුම්භට්ඨාන කථං**, දිය කෙළිනා තැන් පිළිබඳ කථාය; තො හොත් කළමිඩියන් පිළිබඳ කථාය. **පුබ්බපෙත කථං**, මළවුන් පිළිබඳ කථාය;

**නානත්තකථං**, නානාවිධ කථාය; **ලොකක්ඛායිකං**, ලොක නිර්මාණය පිළිබඳ කථාය; **සමුද්දක්ඛායිකං**, මුහුදෙහි උත්පත්තිය පිළිබඳ කථාය; **ඉති භවාභව කථං**, මෙසේ වෘඩිය මෙසේ හානිය යන භව විභව කථාය; **කීටකම්පි**, පනුවන් ද; **චාවෙන්ති**, පහකෙරෙත්;

223. පිට.

**තාලතරුණෙ**, තල් පැල; **තාලපත්ත පාදුකායො**, තල් පත් පාදුකාවන්; **ජීවසඤ්ඤිනො**, ප්‍රාණීය යන සංඥ ඇත්තෝය; **පාදුක මණ්ඩනානුයොගමනු යුත්තා**, පාදුකා සැරසීමෙහි යෙදුනා හු; **මුඤ්ජපාදුකං**, මුදු තණින් කරණ ලද පාදුකා; **බබ්බජ පාදුකං**, බබුස් තණ පාදුකා; **හින්තාල පාදුකං**, කිතුල්පත් පාදුකා;

224. පිට.

**කමල පාදුකං**, කමල තෘණ පාදුකා; **කම්බලපාදුකං**, කම්බිලි පාදුකා; **පීළෙන්ති**, හිස් කෙරෙත්; **කංසමයා**, ලොහයෙන් කරණ ලද්දා වූ; **කාචමයා**, කදුමැටියෙන් කරණ ලද්දා වූ; **තිපුමයා**, ඊයමින් කරණ ලද්දා වූ; **සීසමයා**, කළු ඊයමින් කරණ ලද්දා වූ; **සඞ්කමණීයා**, ගෙනයාමට හැකි වූ; **කාචිපාදුකා**, කිසි පාදුකාවක්;

225. පිට.

**ධුවට්ඨානියා**, නිබඳ තිබිය යුතු වූ; **අසඞ්කමණීයායො**, ගෙන නොයා යුතු වූ; **වච්ච පාදුකං**, වර්චස් පාදුකාවය; **පස්සාව පාදුකං**, මූත්‍ර පාදුකාවය; **ආචමන පාදුකන්ති**, සේදීමේ පාදුකාව යයි; **නර නාරීනං**, එතරවන්නා වූ; **විසාණෙසු අපි**, අගින් ද; **ජෙප්පාසපි**, නගුටින් ද; **රත්තචිත්තාපි**, රාගයෙන් රත්වූ සිත් ඇත්තාහු ද; **අඞ්ගජාතං**, රහසඟ; **ඵුසන්ති**, ස්පර්ශ කෙරෙත්; **වච්ඡතරිම්පි**, කුඩා වැස්සියද; **ඔගාහෙත්වා**, ගිල්වා; **ඉත්ථියුත්තෙනාපි**, දෙනුන් යොදන ලද්දවූ ද; **පුරිසන්තරෙන**, පිරිමි රියැදුරෙකු ඇති; **පුරිසයුත්තෙනාපි**, පුරුෂ සතුන් යොදන ලද්ද වූ; **ඉත්ථන්තරෙන**, ස්ත්‍රී සාරථිය ගෙන් යුක්ත වූ; **යානෙන**, යානාවකින්; **යායන්ති**, ගමන් කෙරෙත්; **සෙය්‍යථාපි ගඞ්ගාමහියායාති**, ගඞ්ගා පූජෝත්සව ක්‍රීඩාවෙහි යම්සේ නම් එසේ යයි කියායි;

226. පිට.

**හත්ථවට්ටකං**, අතින් අදනා හෝ තල්ලුකරණ යාන ද; **යානුග්ඝාතෙන**, යානාව ගැස්සීමෙන්; **සිවිකං**, සිවිකාව ද; **පාටඞ්කින්ති**, රෙද්දෙන්කරණලද පල්ලැක්කිය ද; **ආසන්දිං**, ප්‍රමාණාතික්‍රාන්ත දික් හඟලා පුටුව; **පල්ලඞ්කං**, පාදයන්හි ව්‍යාල රූප තබා කළ පර්‍ය්‍යඞ්කය; **ගොණකං**, දික් ලොම් ඇති මහා කොඳු පලසය; **චිත්තකං**, වීමෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය; **පටිකං**, ඌර්ණමය සුදු ඇතිරිය; **පටලිකං**, ඝණ පුප් එළුලොම් ඇතිරිය; **තූලිකං**, පුළුන් ඇතිරිය; **විකතිකං**, සිංහ ව්‍යාඝ්‍රාදී රූපයෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය; **උද්දලොමිං**, එක පිටෙක නැගි ලොම් ඇති එළු ලොම් ඇතිරිය; **එකන්තලොමිං**, දෙපිට නැගි ලොම් ඇති එළු ලොම් ඇතිරිය; **කට්ටිස්සං**, රන්කසු කම්කොට කැටි තිඹිරිහුයින් කළ පසතුරුණුය; **කොසෙය්‍යං**, රන්කසු කම්කළ තිඹිරි පසතුරුණුය; **කුත්තකං**, සොළොස් නළඟනකට නැටිය හැකි එළු ලොම් ඇතිරිය; **හත්ථත්ථරං**, ඇතුපිට එලන ඇතිරිය; **අස්සත්ථරං**, අසු පිට එලන ඇතිරිය; **රථත්ථරං**, රියෙහි අතුරන ඇතිරිය; **අජිනප්පවෙණිං**, අඳුන්දිවි සමින් ඇඳන් පමණ කොට කළ ඇතිරිය; **කාදලිමිගපවර පච්චත්ථරණං**, කෙසෙල් මුව සමින් කළ උතුම් පස තුරුණුය; **සඋත්තරච්ඡදං**, රතු උඩුවියන් සහිත; **උභතො ලොහිත කූපධානං**, හිස පය දෙපසින් ඇඳ දෙපැත්තේ තැබූ ලේවන් කොට්ටය; **අඤ්ඤෙනාපි මඤ්චෙව**, ඇඳ ඇතුළෙහි ද;

227. පිට.

**සෙය්‍යථාපි දීපිච්ඡාපො,** දිවිපැටියෙක් යම්සේ ද එබඳු වූ; **වච්ඡකො හොති,** වස්සෙක් වේ; **උපනිජ්ඣායති,** අවට බලයි; **චම්මං විධුනිත්වා,** සම ගසා; **වච්ඡගිද්ධිනි,** වස්සා කෙරෙහි ගිජුවූ; **මක්ඛිතා හොති,** වැකුනී වේ;

228. පිට.

**චම්මවිනද්ධානි,** සම්වද්දන ලද්දාහු; **චම්මොනද්ධානි,** සමින් වසන ලද්දාහු; **ඝිඝි විඛම්භං,** ගිගින් සනාතක ඇඳ පුටු; **අභිනිපජ්ජිතුං,** නිසා හෝනට; **අභිනිසීදිතුං,** නිසා හිඳිනට; **චම්මවෙටෙකි;** සම්වැටියෙන්; **ඔගුම්ඵියන්ති,** වෙළා බඳිනු ලැබෙත්; **අවන්තීසු,** අවන්ති ජනපදයන්; **කුරර ඝරෙ,** කුරර ඝර නම් නුවර; **පපාතෙ පබ්බතෙ,** පපාත නම් පර්වතයෙහි; **ඒකසෙය්‍යං,** එක සයන ඇත්තාවූ;

229. පිට.

**පබ්බජ්ජාභිසඞ්ඛාරො,** පැවිද්ද කෙරෙහි හටගත්තාවූ උත්සාහයෙක් වූයේ ද; **උත්තම දමථ සමථං,** උතුම් වූ දමථයට හා සමථයට නොහොත් කායයාගේ සංසිඳීමට ද චිත්තයාගේ සංසිඳීමට ද; **දන්තං,** දැමුනාවූ; **ගුත්තං,** ගොපිතවූ; **යතින්ද්‍රියං,** සංයත ඉන්ද්‍රියන් ඇති; **නාගං,** පව් නැති;

230. පිට.

**කණ්හුත්තරා,** කළු මැටි අධික කොට ඇත්තීය; **ගොකණ්ටක හතා,** ගෙරින්ගේ කුරයෙන් මඩනා ලද්දීය; **නහාන ගරුකා,** නෑම ගරුකොට ඇත්තෝය; **ධුව නහානා,** නිබඳ නෑම; **එරගු,** එනම් තණය; **මොරගු,** මෝරගු නම් තණය; **මජ්ජාරු,** මජ්ජාරු නම් තණය; **ජන්තු,** ජන්තු නම් තණය; **චම්මානි අත්ථරණානි,** සම් ඇතිරිලි වෙත්; **බහුදෙව රත්තිං,** රාත්‍රියෙහි බොහෝ කාලයක් ම;

231. පිට.

**අට්ඨකවග්ගිකානි,** 'සූත්‍රනිපාතයේ අෂ්ටකවර්ගීයෙහි වූ සූත්‍රයෝ (16); **සුමනසිකතානි,** මනාකොට මෙනෙහි කරණ ලද්දාහුය; **සූපධාරිතානි,** මනාකොට දරණ ලද්දාහුය; **විස්සට්ඨාය,** විහිදුනා වූ; **අනෙලගලාය,** කෙලතොලු නොවූ; **අත්ථස්ස විඤ්ඤාපනියා,** අර්ථය හඟවන්නා වූ; **සරභඤ්ඤං,** මිහිරි හඬින් බිණීම;

61, **ලොකෙ,** සංස්කාර ලෝකයෙහි; **ආදීනවං,** අනිත්‍යතා දොෂය; **දිස්වා,** දැක; **නිරූපධිං,** උපධි රහිතවූ; **ධම්මං,** නිර්වාණ

ධම්මය; **ඤත්වා**, දැන; **පාපෙ**, පාපයෙහි; **අරියො**, ආය්‍යතෙමේ; **න රමති**, අභිරමණය නොකෙරෙයි; **සුචි**, පවිත්‍ර ස්වභාව ඇති තැනැත්තේ; **පාපෙ**, පාපයෙහි; **න රමති**, නොඇලෙයි;

**පටිසම්මොදති**, පිළිසඳර කථා කරණසේක; **පරිදස්සිති**, දක්වූ සේක් ද; **නිස්සීමගතානං**, සීමාවෙන් බැහැර ගියාවූ;

232. පිට.

**පච්චන්තිමා**, ප්‍රත්‍යන්ත ජනපදයෝයි; **ඔරතො**, මෑත භාගයෙන්; **ගණනූපගං**, තමන්ගේ ගණනට නොපැමිණියේ;

**චම්මක්ඛන්ධකං නිට්ඨිතං, (පඤ්චමං)**

---

233. පිට.

**සාරදිකෙන ආබාධෙන**, සරත්කාලයෙහි වූ පිත්තාබාධ රෝගයෙන්; **ඡුට්ඨානං**, පහස්නා ලද්දාවූ; **පීතා**, බොන ලද්දාවූ; **උග්ගච්ඡන්ති**, වමනයට යෙයි; **කිසා හොන්ති**, කෘශ වෙත්; **ලූඛා**, රූක්ෂ වෙත්; **උප්පණ්ඩුප්පණ්ඩුකජාතා**, ඉතා පඬුවන් ශරීර ඇත්තාහු වෙත්; **ධමනිසන්ථතගත්තා**, නහර වැල් ඉල්පුණාවූ ශරීර ඇත්තාහු වෙත්;

234. පිට.

**ආහාරත්ථං** ච, ආහාර කෘත්‍යය ද; **ඵරෙය්‍ය**, සිද්ධකරන්නේ ද; **න ච පඤ්ඤායෙය්‍යාති**, නොපෙනෙන්නේද; **ඵාණිතං**, ඛණ්ඩ ශකීරය; **පාකතිකානි**, ප්‍රකෘතියෙන් පවත්නාවූ; **නච්ඡාදෙන්ති**, තුරුස්සත්; **සෙනෙසිකානි**, සිතිදු භොජනයෝ;

235. පිට.

**ඉමිනා ච භත්තච්ඡාදකෙන**, මේ බත් අරුචි කරණ රෝගයෙන් ද; **වසෙහි භෙසජ්ජෙහි**, වසා බෙහෙතින්; (වුරුණු තෙල් බෙහෙතින්) **අච්ඡවසං**, වලස්තෙල්ය; **මච්ඡවසං**, මත්ස්‍යතෙල් ය; **සුසුකාවසං**, කිඹුල් තෙල්ය; **සූකරවසං**, ඌරුතෙල්ය; **ගද්‍රභවසං**, කොටඑතෙල්ය; **නිපක්කං**, උණු කරණලද්දේ; **සංසට්ඨං**, අන්‍ය ද්‍රව්‍යයන් හා කැලතූ; **මූලෙහි භෙසජ්ජෙහි**, මුල් බෙහෙතින්; **හලිද්දිං**, කහය; **සිඞ්ගිවෙරං**, ඉඟුරුය; **වචං**, වදකහය; **වචත්ථං**, හෙල වදය; **අතිවිසං**, අතිඋඩයන්ය; **කටුකරොහිණිං**, කුළුරුණය; **උසීරං**, සුවඳ හොටය; **භද්දමුත්තකං**, වංමුතුය; **සතිපච්චයෙ**, හේතුවක් ඇති කල්හි; **නිසදං**, දගලක් (ඇඹරුම් ගලක්) ද; **නිසද**

**පොතකං**, දරුගලක්ද; **කසාවෙහි භෙසජ්ජානි**, කසාය බෙහෙතින්; **නිම්බකසාවං**, කොසඹ කසාය ද; **කුටජකසාවං**, කෙළිඳ කසාය ද; **පග්ගවකසාවං**, (හගුළු) කුණු කරඳ කසාය ද; **නත්තමාලකසාවං**, කරඳ කසාය ද;

236. පිට.

**පණ්ණානි භෙසජ්ජානි**, පත්‍ර බෙහෙතින්; **නිම්බපණ්ණං**, කොසඹ පත්‍රය; **කුටජපණ්ණං**, කෙළිඳපත්‍රය; **පටොල පණ්ණං**, දුම්මැල්ල පත්‍රය; **තුලසි පණ්ණං**, තලාපත්‍රය; **කප්පාසි පණ්ණං**, කපු පත්‍රය; **ඵලානි භෙසජ්ජානි**, පල බෙහෙතින්; **විලඞ්ගං**, වල ගසහල්ය; **පිප්පලිං**, තිප්පිලිය; **මරිචං**, ගම්මිරිස්ය; **හරීටකං**, අරළුය; **විභීටකං**, බුළුය; **ආමලකං**, නෙල්ලිය; **ගොට්ඨඵලං**, ගොටු ඵලය, (පුවක් ඵලය); **ජතූනි භෙසජ්ජානි**, මැලියම් බෙහෙතින්; **හිඞ්ගු**, සුහුය (පෙරුංකායම්ය=එනම් හිඞ්ගුවෘක්‍ෂයෙන් වැගුරුණු ලාටුය); **හිඞ්ගුජතු**, සුහුදඹුපතුරු තම්බා කළ ලාටුය; **හිඞ්ගු සිපාටිකං**, සුහුකොළ තම්බා කළ ලාටුය; **තකං**, ලාකඩය;(=කරටියෙන් නික්මුනු ලාටුය;) **තකපත්තිං**, කොළවලින් නික්මුනු ලාටුය; **තකපණ්ණිං**, කොළබිඳකළ ලාටුය; **සජ්ජුලසං**, දුම්මලය; **ලොණානි භෙසජ්ජානි**, ලුණුබෙහෙතින්; **සාමුද්දං**, මුහුදු ලුණුය; **කාළලොණං**, කළු ලුණුය; **සින්ධවං**, සෛන්ධව ලුණුය; **උබ්භිදං**, උද්භිද ලුණුය; **බිලාලං**, බළල් ලුණුය; **ථුල්ලකච්ඡාබාධො**, මහත් කැසීම් රොගයක්; **ලසිකාය**, සැරවෙන්; **ලග්ගන්ති**, ඇලෙත්; **අපකඩ්ඪන්ති**, ඉවත් කෙරෙත්; **සෙනාසන චාරිකං ආහිණ්ඩන්තො**, සෙනසුන් චාරිකා වෙහි ඇවිදින්නේ;

237. පිට.

**කණ්ඩුවා**, කැසුමක් හෝ වේද; **පිළකා වා**, පිළිකාවක් හෝ වේද; **අස්සාවො වා**, සැරව වැගිරීමක් හෝ වේද;**ඡකනං**, ගොම ද;**රජනනිප්පක්කං**,පඬු පිසීමෙන්වූ බොර ද; **උදුක්ඛල මුසලං**, වංගෙඩි මොහොල් ද; **චාලිනෙහි**, සලන ලද්දාවූ; **චුණ්ණචාලිනිං**, සුණුසලන පෙණේරයක්; **සණ්හෙහි**,සිලුටුවූසුනුවලින්; **දුස්සචාලිනිං**, රෙදි පෙණේරයක්; **සූකරසූනං**, ඌරන් මස්කරණ තැනට; **ආමකමංසං ච**, අමුමස්ද; **අමනුස්සිකාබාධො**, යක්ලෙඩ; **උච්චාරං අපි**, වසුරුද; **අඤ්ජනං**, අඳුන්; **කාළ අඤ්ජනං**, කළුඅඳුන්; **සොතඤ්ජනං**, හෝ අඳුන්; **රසඤ්ජනං**, රසඳුන්; **ගෙරුකං**, සිවං ගුරුය; **කපල්ලකං**, අඳුන් දූලිය; **තගරං**, තුවරලාය; **අඤ්ජනූපපිංසනෙහි**,අඳුන් පිණිස සුණු කරණ ද්‍රව්‍ය වලින්; **කාළානුසාරියං**, කළු අගිල්ය; **තාලීසං**,

තලිස් පතුරුැය; **භද්දමුත්තකං**, වංමුතුය(කලාදුරුැය;)**පිට්ඨානි අඤ්ජනානි**, පිටි අඳුන්; **ථාලකෙසු අපි**, තලිවලද; **සරාවකෙසුපි**, මලාවලද; **තිණචුණ්ණෙහිපි**, තණසුණුවලින්ද; **අඤ්ජනිං**, අඳුන්කුලාවක්;

238. පිට.

**උච්චාවචා**, කුදුමහත්; **නළමයං**, බටදත්ඩෙන් කරණලද; **වෙළුමයං**, උණ දණ්ඩෙන් කරණලද; **කට්ඨමයං**, දඬුමුවා; **ජතුමයං**, ලාකඩින් කරන ලද්ද; **ඵලමයං**, පලයෙන් කරණ ලද්ද; **ලොහමයං**, ලොහයෙන් කරණ ලද්ද; **සඞ්ඛනාභිමයානි**, සක්නැබින් කරණලද්දදූයි; **අපාරුතා**, නොවසන ලද්දාහු; **අපිධානං**, පියනක්; **අපිධානං නිපතති**, පියන වැටෙයි; **ඔකිරීයන්ති**, ගැවසිගණිත්; **සූචකෙන**, හුයින්; **අඤ්ජනියා බන්ධිතුං**, අඳුන් කුලාවෙහි බඳින්ට; **අඤ්ජනි ඵලති**, අඳුන්කුලාව පැලෙයි; **සිබ්බෙතුන්ති**, මහන්ට; **අඤ්ජනිසලාකාය**, අඳුන්කූරු; **සලාකොධානියං**, තෙලි කොපුවක්; **අඤ්ජනිත්ථවිකං**, අඳුන් පසුම්බියක්; **අංසබද්ධකො**, අස්වැටියක්; **බන්ධන සුත්තකන්ති**, බඳිනා හුය ද; **සීසාභිතාපො**, හිස දැවිල්ලක්; **මුද්ධනි තෙලකං**, හිසගල්වන තෙලක්; **නත්ථුකම්මං**, නස්‍යකිරීම; **නත්ථු ගලති**, නස්‍යය වැගිරෙයි; **නත්ථු කරණිං**, නස්‍ය කරණ හැන්දක්;

239. පිට.

**නත්ථුවිසමං ආසිඤ්චියන්ති**, නස්‍යය විසම ව වැගිරෙයි; **යමකං**, යුගලවූ; **ධූමං පාතුං**, දුම්බොන්ට; **වට්ටිං ආලිම්පෙත්වා**, වැටිය අලෙව් කොට; **කණ්ඨො ඩහති**, උගුර දැවෙයි; **ධූමනෙත්තං**, දුම්කෝවයක්; **පාණකා පවිසන්ති**, පණුවෝ ඇතුල් වෙත්; **ධූමනෙත්තත්ථවිකං**, දුම්කෝව පසුම්බියක්; **එකතො සංඝසන්ති**, එක් පසෙකින් ගැටෙයි; **යමකත්ථවිකං**, යුග්මවූ පසුම්බියක්; **මජ්ජං පක්ඛිපි තබ්බං හොති**, මද්‍ය බැහිය යුතු වෙයි; **අති පක්ඛිත්ත මජ්ජානි**, බොහෝකොට වත් කළ මද්‍ය ඇති; **අබ්භඤ්ජනං**, ඇඟ ගල්වන තෙලක් කොට;

240. පිට.

**තීණි තුම්බානි**, තිඹ තුණක්; **ලොහතුම්බං**, ලොහ සැළිය; **ඵලතුම්බං**, ඵල සැළිය; **අඞ්ගවාතො හොති**, අවයවයන්හි පැතුරුණාවූ වාතයක් වෙයි; **සෙදකම්මං**, වේදු ඇල්ලීම; **සම්භාරසෙදං**, සම්භාරයෙන් කළ වේදුවක්; **භඞ්ගොදකං**, කොළ තැම්බූ ජලය;

**මහාසෙදං**, මහාස්වේද කර්මය; **උදකකොට්ඨකං**, දිය කොට්ටුවක්; **පබ්බවාතො හොති**, පුරුක් වාතයෙක් වෙයි; **ලොහිතං මොචෙතුං**, ලේහරින්ට; **විසාණෙන ගහෙතුං**, අඟකින් ගන්නට; **පාදා ඵාලිතා**, පාදයෝ පැලුනාහු; **පාදබ්භඤ්ජනං**, පයගල්වන තෙලක්; **පජ්ජං අභිසඞ්ඛරිතුං**, පයට හිතවූ බෙහෙතක් සකස්කරගන්නට; **සත්ථකම්මං**, ශස්ත්‍රකර්මය; **කසාවොදකෙන**, කහට වතුරෙන්; **තිලකක්කෙන**, තල කල්කයෙන්; **කබලිකාය**, (බේතටත් බඳිනා පටියටත් අතර තබන අත්තික්කා කොළ ආදි)වැස්මකින්; **වණබන්ධනචොළකෙන**, වණය බඳින කඩකින්; **වණො කණ්ඩුවති**, වණය කසයි; **සාසපකුඩ්ඩෙන**, අබකුඩින්; **ඵොසිතුං**, උලන්ට; **කිලිජ්ජිත්ථ**, තෙත්විය; **ධූමං කාතුං**, දුම්කරන්ට; **වඩ්ඪමංසං**, වැඩෙන මස්; **ලොණසක්ඛරිකාය**, ලුණුපුපුරකින්; **වණො න රූහති**, වණය ගොඩ නොවේ; **තෙලං ගලති**, තෙල් වැගිරෙයි; **විකාසිකං**, තල්කාදිය ගෑ වණ වැටියක්; **අහිනා**, සර්පයකු විසින්; **චත්තාරි මහාවිකටානි දාතුං**, මහාවිකෘත සතරක් දෙන්ට; **ගූථං**, මලය; **මුත්තං**, මූත්‍රය; **ඡාරිකං මත්තිකං**, උණු අළුය මැටිය යන; **පටිග්ගාහාපෙතුං**, පිළිගන්වාගන්ට;

241. පිට.

**ගූථං පායෙතුං**, වසුරු පොවන්ට; **ඝරදින්නකාබාධො**, වසීකරණ පැනකින්(හිත්ගැණීමට දුන් බීමකින්)හටගත් රෝගයක්; **සීතාලොළිං**, හීවැලෙහි ඇලුනු පස්; **ආමිසඛාරං**, බත් වේලා පුලුස්සන ලද කාරම; **මුත්තහරීතකං**, ගොමූත්‍රයෙහි බහනලද අරළු; **ඡවිදොසාබාධො හොති**, චර්මදෝෂාබාධයක් (කුෂ්ඨරෝගයක්); **අභිසන්නකායො හොති**, දෙස් කිපුනා වූ කය ඇත්තෙක් වෙයි; **අච්ඡකඤ්ජියා**, බත් නැති කැඳ වතුරෙන්; **අකටයූසෙන**, නොතැම්බූ මූං යූසෙන්; **කටාකටෙන**, කළ නොකළ යූසෙන්; **පටිච්ඡාදනීයෙන**, මස් රසයෙන්; **පබ්භාරං සොධාපෙති**, ගුහාවක් ශුද්ධ කරවයි;

242. පිට.

**වියසරිත්වා**, අමතකව; **සබ්බත්ථකං**, සාර්ත්‍රික වූ හෙවත් හැම කටයුත්තෙහි අධිකාරීවූ; **විගණෙත්වා**, ගණන්කොට; **පාටියෙක්කා**, වෙනම; **තිට්ඨි**, පිහිටියේය; **මාලාකිතා**, පැලඳි මාලා ඇත්තාහු; **තස්ස ආරාමිකිනියා**, ඒආරාමික භාර්‍ය්‍යාවගේ;

243. පිට.

**අඤ්ඤතරං තිණණ්ඩුපකං**, එක් තණ සුඹුළුවක්; **අධිච්චි**, ඉටුයේය; (සිතීය) **අභිහරිංසු**, එළවූවාහුය;

244. පිට.

**බාහුලිකා හොති,** බහුලව ඇත්තීවේ; **කොලම්බෙපි,** මහ සැළිද; **පටිසාමෙති,** තැන්පත්කරයි; **ඔලීනවිලීනානි,** වැගිරි වැගිරී; **ඔකිණ්ණවිකිණ්ණා,** සර්වප්‍රකාරයෙන් ගැවසුනාහු; **පටිසායනීයානි,** රසවිඳැයුතුවූ;

**භෙසජ්ජ අනුඤ්ඤාත භාණවාරං නිට්ඨිතං (පඨමං)**

---

**ගුළකරණං,** උක්සකුරු කරණ ශාලාවකට; **ඔක්කමිත්වා,** ප්‍රවිෂ්ටව; **සාමිසො,** ආමිස සහිතය; **සොනාඛං මඤ්ඤන්ති,** ඇසියයුතු කොට සිතත්ද;

245. පිට.

**ලොණසොවීරකං,** ලුණුකාඩියක්; **උදකසම්භින්නං,** ජලයෙන් මිශ්‍ර ලුණුකාඩි; **තෙකටුලාය යාගුයා,** ත්‍රි කටු යාගුයෙන්; **විඤ්ඤාපෙත්වා,** විනවාගෙණ; **අන්තො වාසෙත්වා,** ආරාමය තුළ තබා; **සාමං පචිත්වා,** තමන් පිසත්ව; **අන්තො වුත්ථං,** ඇතුළත තබන ලද්දාවූ ද;

246. පිට.

**පුනපාකෙ,** නැවත පිසීමෙහි; **බහි වාසෙන්ති,** පිට තබවත්; **උක්කපිණ්ඩකා අපි,** බිලාල මූසිකාදීහු ද; **දමකාපි,** විඝාසාදයෝද; **අවිස්සත්ථා,** එකඟ නුවූවාහු (විශ්වාස රහිතවූවාහු); **උග්ගහිත පටිග්ගහිතකං,** නගාගෙන නැවත පිළිගන්වා ගන්නාලද්දක්;

247. පිට.

**පමුට්ඨා,** අමතක කරණ ලද්දාහුය; **භුත්තාවිනා,** අනුභව කොට අවසන් කළාවූ; **පවාරිතෙන,** පවාරණය කළහු විසින්; **අනතිරිත්තං,** ඉතිරි නොකළ භොජනය;

248. පිට.

**කායඩාහාබාධො හොති,** කයෙහි දූවිල්ලක් ඇති රොගයක් වෙයි; **භිසෙහි ච,** නෙළුඹලින් ද; **මුළාලිකාහි ච,** නෙළුම් දඬුවලින් ද;

249. පිට.

**අබ්භාහෙත්වා,** උපුටාගෙන; **සුවික්ඛාලිතං විකඛාලෙත්වා,** මනාව සෝදන ලද්දක් කොට සෝද; **භණ්ඩිකං,** පොට්ටනියක්; **පටිග්ගාහාපෙත්වා,** පිළිගන්වාගෙණ; **වනට්ඨං,** වනයෙහි හට ගත් දෙය; **පොක්ඛරට්ඨං,** නෙළුම් ගස්හි හටගත් දෙය; **උස්ස**

**තතං හොති,** බහුල වෙයි; **අබීජං,** පැලනොවෙන්නාවූ; **ගොධාමුඛං,** තලගොයි කටක් වැනිවූ; **නිබ්බට්ටබීජං,** උපුටා හරිණ ලද බීජ ඇති ඵල ද;

250. පිට.

**සම්බාධෙ,** සම්බාධස්ථානයෙහි; **සුඛුමා ඡවි,** සියුම් සිවිය වෙයි; **දූරොපයො,** දුකසේ රොපණය කටයුත්තේ වේ; **දුප්පරිහාරං,** දුකසේ පරිහරණය කටයුත්තේය; **වත්ථිකම්මං,** වස්ති කිරීම; **පටිච්ඡාදනියෙන,** මස්රසයෙන්; (මස්සුප්); **පවත්තමංසං,** සල්පිලෙහි විකිණීමට පැවැත්තාවූ මාංසය;

251. පිට.

**මාඝාතො ඉති,** ප්‍රාණඝාතය තහනම් යයි; **න හරාපෙය්‍යං,** නොහැරියෙම් නම්; **පොත්ථනිකං,** මස් කපන කැත්ත; **ඌරුමංසං,** කලවා මාංසය; **උක්කන්තිත්වා,** කපා; **ජෙ හන්ද,** එහෙනම් කෙල්ල; **පටිවෙදෙසි,** දන්වව; **ඔවරකං පවිසිත්වා,** ගබඩාවට වැද; **පරිගණ්හෙත්වා,** ඔසවාගෙන; **රූළ්හො අහොසි,** ගොඩ වූයේය; **සුවච්ඡවි,** මනා සිවි ඇත්තේ; **ලොමජාතො,** හටගත් ලොම් ඇත්තේය;

252. 253. 254. පිටු

**පටිවෙක්ඛි ඉති,** පරීක්ෂාකෙළෙහි දැයි; **අභිමංසං,** නයිමස්; **ලුද්දකා,** වැද්දෝ; **භික්ඛූ පරිපාතෙන්ති,** භික්ෂූන් නසත්;

**සුප්පිය භාණවාරං දුතියං (නිට්ඨිතං,).**

---

**අඩ්ඪතෙළසහි භික්ඛුසතෙහි,** භික්ෂූන් එක්දස් දෙසිය පණසක්; **පටිපාටිං ලභිස්සාම,** පිළිවෙළ ලබන්නෙම් නම්; **පඤ්චමත්තානි විඝාසාදසතානි,** පන්සියයක් පමණ ඉඳුල් කන්නෝ; **අධිකානි වා දෙවමාසානි,** දෙමසකට වැඩියක් ඉක්මුනේය; **බහූ ච ඝරාවාසත්ථා,** බොහෝ ගිහිගෙයි කටයුතු ද; **භායති,** පිරිහෙයි; **භත්තගෙහං,** බත්බුදින තැන (දන්සැල);

255. පිට

මධු **ගොළකං ච,** මී මිශ්‍ර කරණලද අග්ගලා ද; **පටියාදෙය්‍යං,** පිළියෙල කරන්නෙම් නම්; **ආමාවසෙසං,** නොපැසවූ ආහාරය;

62. **යො,** යමෙක් තෙමේ; **සඤ්ඤතානං,** සංයත චක්ඛාදි ඉන්ද්‍රියන් ඇති; **පරදත්තභොජිනං,** මෙරමාදුන් බත් අනුභව කරන්නාවූ(භික්ෂූන්ට;) **කාලෙන,** සුදුසු කාලයෙහි; **සක්කච්චං,** සකසා;

සාගුං, කැඳ, දදාති, දේද; (හෙතෙමේ) දස ඨානානි, දශවිධ ආනිසංසයන්; අස්ස, ඒ පිළිගන්නාට; අනුප්පවෙච්ඡති, දෙන්නේයි; ආයුඤ්ච, දීර්ඝායුෂ ද; වණ්ණඤ්ච, ශරීර වර්ණය ද; සුඛං, සැපය ද; බලඤ්ච, කායබලය ද (දෙයි).

63. අස්ස, ඔහට; පටිභාණං, ප්‍රතිභානය; තතො, ඒ නිමිත්තෙන්; උපජායතෙ, හටගණී; ඛුද්දං, බඩසය ද; පිපාසං, පවසද; වාතං, වාතයද; ව්‍යපනෙති, පහකෙරෙයි; වත්ථිං, මූත්‍රමාර්ගය ද; සොධෙති, ශොධනය කරයි; භුත්තං, වළඳන ලද්ද; පරිණාමෙති, දිරවයි එතං, මෙය; සුගතෙන, තථාගතයන් වහන්සේ විසින්; වණ්ණිතං, වර්ණනා කරණලද; භෙසජ්ජං, බෙහෙදකි;

64. තස්මා හි, එබැවින් ම; දිබ්බානි සුඛානි, දිව්‍යසැප; පත්ථයතා, පතන්නාවූ; මනුස්ස සොභග්‍යතං වා, මිනිස් සුබැගි බව; ඉච්ඡතා වා, කැමැත්තාවූ හෝ; සුඛත්ථිකෙන, සැප කැමැත්තාවූ; මනුස්සෙන, මනුෂ්‍යයා විසින්; නිච්චං, අනවරතයෙන්; යාගුං, හුළුකැන්; දාතුං, දෙන්ට; අලං, සුදුසු වේ;

256. පිට.

කාලස්සෙව, උදෑසන ම; භොජ්ජ යාගුං, තලප කැඳ; ධාතා, බඩපිරුණාහු; විතක්කරූපං, කැමති පරිද්දෙන්; තරුණප්පසන්නෙන, අලුත පැහැදුනාහු; මහාමත්තෙන, මහාමාත්‍යයා විසින්; අඩ්ඪතෙළසානි මංසපාතිසතානි, මස්තලි එක්දහස් දෙසිය පණහක්; පරිවිසති, වළඳවයි; ආසාදනාපෙක්ඛො, නින්දා කිරීමෙන් ගැටීම අපෙක්ෂා කොට ඇත්තේ;

257. පිට.

කුක්කුච්චං අහු එව විප්පටිසාරො අහු, කුකුස් වූයේ ම ය විපිළිසර වූයේ ම ය; යදග්ගෙන, යම් කොණකින්; තදග්ගෙන, ඒ කොණින්; එකමෙකං සිත්ථං, එක එක බත්හුළ; තං අග්ගෙන, එපමණකින්; ආරද්ධාති, සතුටු කරණ ලද්දහුයයි; අඤ්ඤදත්‍ර නිමන්තිතෙන, අන්තැනෙක්හි පවරණ ලද්දහු; අඞ්ගක විඥං, අඞ්ග කවිඥ ජනපදය කරා; ගුළකුම්භ පූරෙති, උක්සකුරු කලයෙහි පුරවන ලද්දාවූ;

258. පිට.

සන්නපෙසති ඉති, සතප්පවයි; පිටකානිපි, පෙට්ටිවල ද; උච්ඡඩෙසපි, ඔඩොක්කුවල ද;

259. පිට.

**සන්ධූපායති**, දුම්ගසයි; **සම්පධූපායති**, විශේෂයෙන් දුම්ගසයි; **දිවසසන්තත්තො**, දවසක් තවතලද්දාවූ; **ථාලො**, හිවැල (තගුල් තලයක්;) **උදකෙ පක්ඛිත්තො**, ජලයෙහි බහන ලද්දේ; **උස්සන්නො හොති**, බහුල වෙයි;

260. පිට.

**ගුළොදකං**, උක්සකුරෙන් කල ජලය; **ආවසථාගාරං**, ලැගුම් ගෙය; **සබ්බසන්ථරිං**, සියල්ල ඇතිරීම ඇතිව; **උදකමණිකො**, දියසැලක්; **මජ්ඣිමං ථම්භං නිස්සාය**, මැද කණුව ඇසුරු කොට; **පමාදාධිකරණං**, ප්‍රමාදය කාරණා කොට;

261. පිට.

**මහන්තිං භොගජානිං**, මහත්වූ භොගහානියකට; **මඞ්කුභූතො**, නිස්තේජස්ක වූයේ;

262. පිට.

**වජ්ජීනං පටිබාහාය**, ලිච්ඡවි රජුන් පසුබැස්වීම පිණිස; **වත්ථූනි පරිග්ගණ්හන්තියො**, ගෙබිම් පරිග්‍රහණය කරන්නාවූ; **අරියං ආයතනං**, ආර්‍ය්‍යභූමිය වේද; **වණිප්පථො**, වෙළඳුන්ගේ මාර්‍ගය; **පුටභෙදනං**, පොදි ලිහන තැන; **මිථුභෙදා**, ඔවුනොවුන් බිදුවීමෙන්; **යස්මිං පදෙසෙ**, යම් පෙදෙසෙක්හි; **වාසං කප්පෙති**, වාසය කෙරේද; **එත්ථ**, මෙහි; **සඤ්ඤතෙ**, ඉන්ද්‍රියසංයම ඇති; **බ්‍රහ්මචාරයො**, ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යා ඇත්තාවූ; **සීලවන්තෙ**, සීලවන්තයන්; **භොජෙත්වා**, වළඳවා;

66, **තත්ථ**, ඒ ස්ථානයෙහි; **යා දෙවතා**, යම්බඳු දෙවී කෙනෙක්; **ආසුං**, වූ ද; **තාසං**, ඔවුන්ට; **දක්ඛිණං**, දක්ෂිණාව; **ආදිසෙ**, දෙන්නේය; **තා**, ඔහු; **පූජිතා**, තුමූ පුදනලද්දාහු; **පූජයන්ති**, නැවත පිදුව ඔහු පුදත්; **මානිතා**, බුහුමන් කරණලද්දාහු; **මානයන්ති**, ඔහුට බුහුමන් කෙරෙත්;

67. **තතො**, ඒ හෙතුවෙන්; **මාතා**, මවු තොමෝ; **ඔරසං පුත්තං ඉව**, ඖරස පුත්‍රයෙකුට මෙන්; **නං**, ඔහුට; **අනුකම්පන්ති**, අනුකම්පා කෙරෙත්; **දෙවතානුකම්පිතො**, දෙවියන් විසින් අනුග්‍රහය කරණලද; **පොසො**, ඒ පුරුෂතෙමේ; **සදා**, හැමකල්හි; **භද්‍රානි**, ලාභසත්කාරාදී ඉෂ්ටවිපාකයන්; **පස්සති**, දකියි;

263. පිට.

**සමතිත්තිකා**, ඉවුර සමව ගැලුවාවූ; **කාකපෙය්‍යා**, කවුඩන් විසින් පිය යුතුවූවා; **ඔරං**, මෙතරින්; **උළුම්පං පරියෙසන්ති**, පසුරු සොයත්; **කුල්ලං බන්ධන්ති**, පසුරු බඳිත්;

68. යෙ, යම්කෙනෙක්තුමූ; අණ්ණවං, සාගරයද; සරං, ගඞ්ගාවද; පල්ලලානි, ජල බහුල භූමීන්; විසජ්ජ, හැර; සෙතුං කත්වාන, හෙයක් කොට; තරන්ති, තරණය කෙරෙත්ද, ජනො, ඒ ලෞකික ජනතෙමේ; කුල්ලං, පහුර; පබන්ධති, බඳියි; මෙධාවිනො ජනා, බුද්ධාදී ප්‍රඥාවත් ජනයෝ, තිණ්ණා ති, මහත්වූ සංසාර සාගරය තරණය කළාහුමය;

264. පිට.

69. චතුන්නං අරියසච්චානං, චතුරාර්‍ය්‍යසත්‍යයන්; යථාභූතං, තතුසේ; අදස්සනා, නොදැකීමෙන්; දීඝං අද්ධානං, දීර්ඝකාලයක් මුළුල්ලෙහි; තාසු තාසු ජාතිසු එව, ඒ ඒ ජාතීන්හි ම; සංසිතං, සැරිසැරීම වීය;

70. තානි එතානි, ඒ මේ චතුරාර්‍ය්‍යසත්‍යයෝ; දිට්ඨානි, දක්නාලද්දහ; භවනෙත්ති, සුදු යයි නම්ලද තෘෂ්ණාව; සමූහතා, නසනලද්දීය; දුක්ඛස්ස, වතීදුඃඛයාගේ; මූලං, මුල; උච්ඡින්නං, සිඳිනලදි; ඉදානි, දැන්; පුනබ්භවො, සසර නැවත ඉපදීමක්; නත්ථි, නැත්තේය; පත්තිකාව, පයින් යන්තියක්ව ම;

265. 266. පිටු.

නීලාලඞ්කාරා, නිල්ආභරණ ඇත්තාහු; ඊසාය ඊසං, රිය හිසෙන් රිය හිස ද; යුගෙන යුගං, වියදණ්ඩෙන් වියදණ්ඩද; චක්කෙන චක්කං, රියසකෙන් රියසක ද; අක්ඛෙන අක්ඛං, රථාක්ෂයෙන් රථාක්ෂය ද; පතිවට්ටෙසි, ගටා පෙරලීය හෙවත් දැක්කුවාය; ජෙ අම්බපාලි, එම්බල අම්බපාලිය; සාහාරං, ජනපද සහිතවූ; අම්බකාය, අම්බපාලිය ගෙන්; අධිවුත්ථාම්හි, ඉවසුවේ වෙමි; නාදිකෙ, නාදිකනම් දනව්වෙහි; ගිඤ්ජකාවසථෙ, එනම් විහාරයෙහි; උපසංහරථ, සිතවගෙන බලව්; පරිවෙසනා, වළඳනස්ථානය;

ලිච්ඡවිභාණවාරං නිට්ඨිතං.

---

සන්ථාගාරෙ, සභාශාලාවෙහි; නිස්සංසයං ඛො, සැකනැතුවම චනාහි; කිරියවාදෙ සමණො, ක්‍රියාවාද ඇත්තෙක් වන්නේ;

267. පිට.

අපලොකිතා වා, දන්වතලද්දවූ හෝ; වුත්තවාදිනො, කීදෙය කියන්නෝ ද; න ච අබ්භාචික්ඛන්ති, අභ්‍යාඛ්‍යානය නොකෙරෙද්ද; වාදානුපාතො, වාදයක්හුගේ හෙළීමක්; පරියායො අත්ථි, ප්‍රකාරයක් ඇත්තේය; තපස්සිතාය, තාපකරණ ස්වභාව පිණිස; අපගබ්භතාය, පහවූ ගබ් ඇතිබව පිණිස;

268. 269. පිටු.

**අස්සපොතෙ**, අස්වැසුතෝය; **උපච්ඡෙදං**, **මත්තෙහි සිඳීම**; **පරමෙන අස්සාජෙන**, උත්තමවූ අස්වැසීමෙන්;

270. පිට.

**අනුවිච්චකාරං හො**, පරීක්ෂාකොට කිරීම වනාහි; **ඤාතමනුස්සානං**, ප්‍රසිද්ධ මිනිසුන්ට; **අභිරද්ධො**, ඇළුණේ වෙමි; **පටාකං පරිහරෙය්‍යුං**. ධවජ නංවා වසන්නාහුය; **දීඝරත්තං හො**, **බොහෝ කලක්** වනාහි; **ඔපානභූතං**, පැන්සාලාවක් මෙන් වූයේය; **උපගතානං**, එළඹියාවුන්ට; **මඤ්ඤෙය්‍යාසීති**, හඟින්නෙහි ය යි;

271. පිට

**රථියා රථියං**, වීථියෙන් වීථියෙහි; **සිංඝාටකෙන සිංඝාටකං**, සතරමංසන්ධියෙන් සතරමංසන්ධියෙහි; **ථූලං පසුං වධිත්වා**, **මහත්වූ** සිවුපාවෙකු මරා; **උද්දිස්සකතං**, උදෙසාකළ; **පටිච්චකම්මං**, උදෙසා කළ මස් කෑමෙන් වන ප්‍රාණඝාත කර්ම ඇති; **උපකණ්ණකෙ**, කණමුල; **ශෙගස ජානෙය්‍යාසි**, අහවම් දන්නෙහිද; **අලං අය්‍යා**, කම්නැත ආර්‍ය්‍යයෙනි; **අසනා**, අවිදූමාතාවූ;

272. පිට.

**අපරිසඞ්කිතං**, සැකනොකරණලද්දාවූ; **තිකොටිපරිසුද්ධං**, තුන් කොළවර පිරිසිදුවූ; **පගගහෙත උඤ්ඡෙන**, පාත්‍රය **ගෙණ කරණ** පිඬු සිඟීමෙන්, **බහාරාමකොට්ඨකෙ**, **බිහිඅරම් කොටුවේ**; **සකටපරිවත්තං කරිත්වා**, ගැල් පිරිවැටුම **කොට**;

273. පිට.

**පච්චන්තිමං**, පසුපසෙහිවූ; **කප්පියභූමිං**, කප්පිය **භූමියක්කොට**; **සම්මන්නිත්වා**, සම්මත කොට; **වාසෙත්වා**, තබත්වා; **මංසානි කොට්ටෙන්ති**, **මස් කපත්**; **කාකොරවසද්දං**, **කවුඩන්ගේ මහත් හඬ**; **උස්සාවනන්තිකං**, උස්සාවනන්තිකා නම් කප්පිය කුටිය; **ගොනිසාදිකං**, ගොනිසාදිකා නම් කප්පිය කුටිය; **ගහපතිනති**, **ගහපති නම්** කප්පිය කුටිය දූයි; **උක්කපිණ්ඩකාපි**, මී බළල් ආදි **සත්වයෝද**;

**සීහභාණවාරං චතුත්ථං**,

---

**බහිද්වාරෙ**, **බිහිදොර**; **ධඤ්ඤස්ස ඛාරිං**, **ධාන්‍ය ඛාරියක්**; **පපතිත්වා**, වැටී;

274. පිට.

**ආළ්හකථාලිකං උපනිසීදිත්වා**, ලාහකින් **පිසූ බත් තලිය ළඟ හිඳ**; **සූපසිඤ්චනකං**, ව්‍යඤ්ජන ඇතිලියක් ද; **සහස්සත්ථවිකං**, **මහු**

දහසක් බැඳි පියල්ලක්; **ජම්බොශිකං වෙඨනං**, සමසක පඞ්, **සුණ්ණිසාය**, යෙහෙලියගේ; **චතුද්දොණිකං පිටකං**, ද්‍රොණසතරක් පිරවූ පෙට්ටියක්; **ඛසඝානස්ස**, සාත්තහුගේ; **සතනසිනාරෙසො**, හිවිටිසතක්;

275,278. පිටු.

**ජාතිශාවකන**, ස්වයංජාතඋයනෙහි; **උසූයනති**, ඊෂ්‍යීංකෙරෙත් යයි; **ධාරුණෙණකන** බිරෙහි, දෙවුකොණෙහිවූ උණුසුමෙන් යුත් කිරෙන්; **සමභාවෙසි**, හමුවිය, **උපතිට්ඨඨ**, උපස්ථාන කරවී;

279. පිට.

**මාසප්පිකෙන**, මැවලින් ප්‍රයෝජන ඇත්තහු විසින්; **අපෙපාදකා**, වතුර නැති; **මගතානං කතතාරෙ**, වේද කතෘවූ; **අපපභකඛා**, බත්නැති; **අපාටෙයෳන**, මගවියදම් නැතිව; **සම්භිතං**, කල්පනා කරණලද; **පුරාණං මනතපදං**, පුරාණ වේද පදය; **හරණපයානති**, ගෙන්වාගෙණ යම්දූයි; **තදනුගායනති**, ඒ අනුව කියද්ද; **වාචිතමනුවාචෙනති**, කියවනලද්ද අනුව කියවද්ද; **අටටකො**, එනම් ඇත්තාය; **භගු**, එනම් ඇත්තාය;

280. පිට.

**රතතුපරතා**, රාත්‍රියෙහි භොජනයෙන් වැලැක්කාහුය; **කාජෙකි**, කදින්; **මොචපානං**, ඇට කෙසෙල් පැන්; **මොචපානං**, මස් කෙසෙල් පැන්; **මධු**, මී පැන්; **මුද්දික**, මිදි පැන්; **සාලූක**, ඕලු පැන්; **ඵාරුසක**, බොරලු දමනු පැන්; **ධඤ්ඤඵලරසං**, ධාන්‍ය ඵල රසය; **ධාකරසං ඨපෙතවා**, පලාරසය හැර; **මධූකපුප්ඵරසං**, මී පුප් රසය; **උච්ජුරසං**, උක්රසය;

281. පිට.

71. **යඤ්ඤා**, යාගයෝතුමූ; **අග්ගිහුතතමුඛා**, අග්නිහෝමය ප්‍රමුඛකොට ඇත්තාහ; **ජඤෙසා**, ජන්දසට හෙවත් වෙදයට; **සාවිතති**, සාවිත්‍රි නම් ජන්දස; **මුඛං**, ප්‍රධානයි; **මනුසසානං**, මිනිසුන්ට; **රාජා**, රජතෙමේ; **මුඛං**, ප්‍රධානයි; **නදීනං**, ගඞ්ගාවන්ට; **සාගරො**, සයුර; **මුඛං**, ප්‍රධානයි;.

72. **නකඛතතානං**, තාරකාවන්ට; **චඤෙදා**, චන්ද්‍රතෙමේ; **මුඛං**, ප්‍රධානයි; **තපතං**, බබලන්නවුන් අතුරෙන්; **ආදිචෙචා**, සූය්‍ය්‍යී තෙමේ; **මුඛං**, ප්‍රධානයි; **පුඤ්ඤං**, පින්; **ආකඞ්ඛමානානං**, කැමති වන්නාවූ; **යජතං**, දන් දෙන්නවුන්ට; **සඞ්ඝො**, සඞ්ඝ තෙමේ; **වෙ**, ඒකාන්තයෙන්; **මුඛං**, ප්‍රධානයි;

**සඞ්ගරං අකංසු**, පොරොන්දුවක් කළාහුය; **රොජමල්ලො**, රෝජනම් මල්ලද;

282.-283. පිටු.

**එරිත්වා**, පතුරුවා; **තරුණවච්ඡා**, ලදරුවස්සෙකු ඇත්තාවූ; **සංවුතමාරෙ**, වසන ලද දොර ඇත්තාවූ; **අතරමානො**, ඉක්මන් නොවෙමින්; **ආළින්දං පවිසිත්වා**, පුමුඛයට ඇතුල්ව; **උක්කාසිත්වා**, කාරා; **අග්ගළං**, යතුරු අගුල; **ආකොටෙසි**, කොටව; **පිට්ඨඛාදනීයඤ්ච**, පිටිකැවිලි ද, **ආතුමා**, ආතුම නම් ජනපදය;

284. පිට.

**නහාපිතපුබ්බො**, පෙර කරනැවැමියෙක් වූ; **මඤ්ජුකා**, මධුර වචන කියන්නාවූ; **පරියොදාතසිප්පා**, නිර්දෝෂ ශිල්ප ඇත්තාවූ; **ඛුරභණ්ඩං ආදාය**, කරනැවැමි බඩු ගෙණ; **නාළියා**, කුලාවෙන් ද; **ආවාපෙනත**, සහල් ආදිය බහාලන බඳුනකින් ද යුක්තව; **අනුඝරකං**, ගෙයක් පාසා; **භුසාගාරෙ**, භූසාගාර නම් ආවාසයෙහි;

285. පිට.

**සඞ්ඛිතානි බීජානි**, සහසතු බීජයන්; **භාගං දත්වා**, දසයෙන් කොටසක් දී; **අකප්පියං අනුලොමෙති**, නොකැපද්දේට අනුවයේ ද; **යාමෙ**, යාමයෙහි; **යාමාතික්කන්තෙන**, පශ්චිම යාමය ඉක් මුනු කල්හි; **සත්තාහාතික්කන්තෙන**, සත්දවස ඉක්මුනු කල්හි; **යාවකාලිකං**, පෙරවරු කාලයට සුදුසු; **යාමකාලිකං**, අරුණ නගින තෙක් සුදුසු; **සත්තාහකාලිකං**, සත්දවසකට සුදුසු; **යාවජීවිකං**, දිවිඇතිතාක් සුදුසු;

**භෙසජ්ජක්ඛන්ධකං නිට්ඨිතං.**

---

287. පිට.

**පාථෙය්‍යකා**, පාථෙය්‍ය රටවාසීවූ; **තිංසමත්තා භික්ඛූ**, තිසක් පමණ භික්ෂූහු; **උපකට්ඨාය වස්සූපනායිකාය**, වස් එළඹීම එළඹ සිටි කල්හි; **සම්භාවෙතුං**, සම්බවෙන්ට; **උක්කණ්ඨිතරූපා**, කල කිරුණ සවභාව ඇත්තාහු; **දෙවෙ වස්සන්තෙ**, වැස්ස වසින කල්හි; **උදකසඞ්ගහෙ**. ජලයෙන් ජලය සඞ්ග්‍රහ වූ කල්හි හෙවත් වතුර ගැලූ කල්හි; **උදකචික්ඛල්ලෙ**, ජලයෙන් මඩවූ කල්හි; **ඔකපුණ්ණෙහි**, ජලයෙන් පිරුණාවූ; **කිලන්තරූපා**, කලාන්තවූ සවභාව ඇත්තාහු;

288. පිට.

**අනත්ථතකඨිනානං වො**; අතුරණ ලද කඨින ඇත්තාවූ තොපට; **පඤ්චකප්පිස්සන්ති**, පසක් කැපවන්නාහුය; **අනාමන්තචාරො**, ආරාමයේ භික්ෂූන්ට ආමන්ත්‍රණය නොකොට හැසිරීමය; **අසමාදානචාරො**, ඉටාගත් සිවුරු නොගෙණ හැසිරීමය; **ගණභොජනං**, අකප්පිය වොහාරයෙන් සමූහව වැළඳීමය; **යාවදත්ථචීවරං**, කැමැති පමණ සිවුරු ඉවසීමය; **තත්ථ**, ඒ කඨින අතුල උපචාර සීමාවෙහි; **යො ච චීවරුප්පාදො**, යම් සිවුරු ඉපදීමක් වේ ද; **අත්ථතං හොති**, අතුලේ වේ; **උල්ලිඛිතමත්තෙන**, ඉරි ඇදි (පමණ ගැණීම්) පමණකින්; **ධොවනමත්තෙන**, කඨිනවස්ත්‍රය සේදූ පමණකින්; **චීවරවිචාරණමත්තෙන**, කඩඅතු වෙන්කිරීමෙන් චීවර විචාරණය කළ පමණකින්; **ඡෙදනමත්තෙන**, ඡෙදනය කළ පමණකින්; **බන්ධනමත්තෙන**, හුයෙන් බැදි පමණකින්; **ඔවට්ටිකරණමත්තෙන**, මොසසුත්‍රානුසාරයෙන් දික් මැහුම් මැසූ පමණකින්; **කණ්ඩුසකරණමත්තෙන**, මුද්‍රිකා පත්‍ර බැන්ද පමණකින් නොහොත් - අමුතු වස්ත්‍ර පත්‍රයන්ගේ බැඳීම් පමණකින්; **දළ්හීකම්මකරණමත්තෙන**, දෙපට එකට ගළපා මැසූ පමණකින්; **අනුවාතකරණමත්තෙන**, පිට නුවාව ඇල්ලූ පමණකින්; **පරිභණ්ඩකරණමත්තෙන**, ඇතුල්නුවාව ඇල්ලූ පමණකින්; **ඔවද්ධෙය්‍යකරණමත්තෙන**, ආගන්තුක රෙදිපටක් ආරොපනය කළ පමණකින්; **කම්බලමද්දනමත්තෙන**, එකවරක් පඬුපෙවූ මැදි පමණකින්; **නිමිත්තකතෙන**, චීවර ලාභයට නිමිත්තකළ වස්ත්‍රයෙන්; **පරිකථාකතෙන**, ආනිසංස කථා කියා ලබන ලද්දෙන්; **කුක්කුකතෙන**, තාවකාලික වශයෙන් ගන්නාලද වස්ත්‍රයෙන්; **සන්නිධිකතෙන**, ලැබුනු දවස් සන්නිධි කොට තබනලද වස්ත්‍රයෙන්; **නිස්සග්ගියෙන**, රාත්‍රීන් පහකොට නිසගි කරණ ලද වස්ත්‍රයෙන්; **අකප්පකතෙන**, කප් බිඳු නොකරණ ලද්දෙන්; **සඞ්ඝාටියා අඤ්ඤත්‍ර**, සගල සිවුරකින් විනා; **අඤ්ඤත්‍ර උත්තරාසඞ්ගෙන**, උතුරු සළු සිවුරෙන් විනා; **අඤ්ඤත්‍ර අන්තරවාසකෙන**, අඳනයෙන් විනා; **තදහෙව**, එදවස්හි; **සඤ්ඡින්නෙන**, කඩකපන ලද; **සමණ්ඩලිකතෙන**, මැඩිලි සහිත කරණලද; **පඤ්චකෙන වා**, කඩඅතු පසකින් හෝ; **අඤ්ඤත්‍ර පුග්ගලස්ස අත්ථාරා**, පුද්ගලයෙකුගේ ඇතිරීමෙන් තොරව, **නිස්සීමට්ඨො**, උපාචාර සීමාවෙන් බැහැර සිටි පුද්ගලයෙක්;

289. පිට.

**අහතෙන**, පරිභොග නොකරණ ලද වස්ත්‍රයෙන්; **අහතකප්පෙන**, පරිභොග නො කරණ ලද්දකට සමාන වස්ත්‍රයකින්; **පිලොතිකාය**, කඩරෙද්දෙන්; **පංසුකූලෙන**, පංශුකූලික අඞ්ග වශයෙන් ලද වස්ත්‍රයෙන්; **පාපණිකෙන**, ආපණද්වාරයෙහි දමන ලද වස්ත්‍රයෙන්; **අනිමිත්තකතෙන**, නිමිති කොට නොලත් වස්ත්‍රයෙන්; **අපරිකථාකතෙන**, ආනිසංස නොකියා ලද වස්ත්‍රයෙන්; **අකුක්කුකතෙන**, තාවකාලික වශයෙන් නොගත්තා ලද වස්ත්‍රයෙන්; **අසන්නිධිකතෙන**, සන්නිධිකොට නො තබන ලද වස්ත්‍රයෙන්; **අනිස්සග්ගියෙන**, රාත්‍රි කාලයන් ගෙවා නිසගි නොවූ වස්ත්‍රයෙන්; **කප්පකතෙන**, කප් බිඳු කරණ ලද්දෙන්; **සඤ්ජිතෙනන**, කඩකපන ලද්දා වූ; **උබ්භතං**, උදුරණ ලද්දේ; **කඨිනස්ස උබ්භාරාය**, කඨිනයාගේ උද්ධරණය පිණිස; **පක්කමනන්තිකා**, සීමාවෙන් බැහැරයාම අන්තකොට ඇත්තීය; **නිට්ඨානන්තිකා**, චීවරයාගේ නිෂ්ඨාව අන්තකොට ඇත්තීය; **සන්නිට්ඨානන්තිකා**, සන්නිටු හන අන්තකොට ඇත්තීය; **නාසනන්තිකා**, නැසීම අන්තකොට ඇත්තීය; **සවණන්තිකා**, ශ්‍රවණය අන්තකොට ඇත්තීය; **ආසාවච්ඡෙදිකා**, ආසාව සිඳීම ඇත්තීය; **සීමාතික්කන්තිකා**, සීමාව ඉක්මවීම ඇත්තීය; **සහුබ්භාරන්ති**, උද්ධරණය සමගවූවා යයි; **අත්ථතකඨිනො භික්ඛු**, අතුලාවූ කඨින ඇති මහණ තෙම; **න පච්චෙස්සන්ති**, නැවත මේ සීමාවට නොයෙන්නෙමියි; **පක්කමති**, බැහැර යේ ද; **උබ්භතං කිර කඨිනං**, කඨිනය උදුලේ යයි; **පච්චෙස්සං පච්චෙස්සන්ති**, නැවත එන්නෙමි නැවත එන්නෙමියි; **කඨිනුද්ධාරං**, කඨිනුද්ධාර කාලය; **වීතිනාමෙති**, ඉක්මවා ද;

290. පිට.

**සම්භුනාති**, පැණෙන්නට හැකියි; **සහ භික්ඛූහි**, කඨිනොද්ධාරක භික්ෂූන් හා සමග;

**ආදූශ සනනකං නිට්ඨිතං.**

---

291. පිට.

**විප්පකතං චීවරං**, අඩාල කරණ ලද සිවුර;

**ආදූශ ජක්කං නිට්ඨිතං**

---

292. පිට.

**අනධිට්ඨිතෙන**, ඉටා නොගැන්මෙන්; **නෙවහොති**, සිතක් නො වෙයි;

**ආදූශ භාණවාරං නිට්ඨිතං.**

---

295. පිට.

**චීවරාසාය**, චීවර ආසාවෙන්; **පයිරුපාසති**, ආශ්‍රය කෙරේද; **අනාසාය**. ආසා නොකිරීමෙන්; **ආසාවච්ඡෙදිකා**, ආසාව සිඳීම ඇති;

**අනාසාවාදසකං නිට්ඨිතං.**

---

300. පිට.

**චීවරපටිවිංසං**, සිවුරු කොටස; **අපවිනයමානො**, පහමින්; **දිසඞ්ගතං**, දිසාචාරිකාවට ගියහු;

**අපවිනය නවකං නිට්ඨිතං**

---

303. පිට.

**පලිබොධා**, පළිබෝධයෝ; **සාපෙක්ඛො වා**, අපෙක්ෂා සහිතව හෝ; **අකතං වා හොති**, පිරියම් නොකරණ ලද්දේ හෝ වේද; **අනුපවජ්ජිතනා වා**, සුන් නොවූවා හෝ වේ ද; **වනෙතන**, හරින ලද සිතින්; **වනෙතන**, පිටකරණ ලද සිතින්; **මුනෙතන**, මූදන ලද සිතින්; **අනපෙක්ඛො**, අපෙක්ෂාරහිතවූයේ;

**කඨිනක්ඛන්ධකං නිට්ඨිතං.**

---

305. පිට.

**ඉද්ධා චෙව හොති**, සමෘධ ද වෙයි; **ඵීතා ච**, ධාන්‍යාදියෙන් පිරුණාද වෙයි; **ආකිණ්ණමනුස්සා ච**, ගැවසුනා වූ මිනිසුන් ඇත්තී ද වෙයි; **සුභික්ඛා ච**, සුලභ භික්ෂා ඇත්තී ද; **සත්තච පාසාද සහස්සානි**, ප්‍රාසාද සත් දහසක් ද;

306. පිට.

**කූටාගාර**, කුළුගෙවල්; **දස්සනීයා**, දැකුම් කළුය; **පාසාදිකා**, ප්‍රසාද එළවන්නීය; **පරමාය වණ්ණපොක්ඛරතාය**, උතුම් වර්ණ සම්පත්තියෙන්; **වාදිතෙ ච**, වාද්‍යකිරීමෙහි ද; **පදක්ඛිණා**, හැඩහුරු වූ; **අභිසටා**, පැමිණෙන ලද්දීය; **අත්ථිකානං අත්ථිකානං**, කැමැති කැමැති වූ; **පඤ්ඤාසාය ච**, වස්තූන් පණසකින් ද; **රත්තිං ගච්ඡන්තිං**, රැයකට යන්නාවූ; **සිඝොසොමත්තාය**, අතිශයින්; **උපසොභිතා**, හොබනාවූ; **නෙගමො**, නියම් ගම් අධිපතියෙක් තෙමේ; **නීරෙත්වා**, නිශ්චයකොට; **පච්චාගච්ඡි**, ආපසු හැරී ආයේය; **වුට්ඨාපෙය්‍යාම**, නගා සිටුවන්නෙමු නම්; **ගණිකං**, ගණිකාවක් කොට;

307. පිට.

**පවිසන්තෙන ච**, දවස්පතා වස්තු සියයකින් ද; **මා පාවිසි**, ප්‍රවිෂ්ට නොවෙව; **පරිපාකමන්වාය**, මුහුකිරීමට පැමිණ; **කත්තරසුප්පෙ**, කසලකුලෙලක්හි; **නීහරිත්වා**, බැහැරකොට; **සඞ්කාර කූපෙ**, කසලගොඩෙහි; **ඡඩ්ඩෙන්ති**, දමවයි; **කාකෙහි සම්පරිකිණ්ණං**, කවුඩන් විසින් වටකරණ ලද්දාවූ; **ධාතීනං**, කිරි මවුන්ට; **පොසාපිතොසි**, පොෂණය කරණ ලද්දේ නුයි. **අසිප්පෙන**, ශිල්පරහිතයෙකු විසින්; **උපජීවිතුං**, ජීවත්වන්ට;

308. පිට.

**ලහුකම්ප ගණ්හාති**, වහා ද උගණී; **උපධාරෙති**, දරන්නේද වෙයි; **නපම්මුස්සති**, මුළා නොවෙයි; **අධිසනනස්ස**, හදාරන්නාවූ; **ඛණිත්තිං ආදාය**, බිම කනින හුලක් ගෙණ(කුන්තාතියක් ගෙණ); **අප්පභක්ඛා**, ස්වල්පවූ ආහාර ඇත්තාහුය; **අපාථෙය්‍යන**, මාර්ගෝපකරණ නැත්තකු විසින්; **පාවද**, කියව; **සීසාබාධො**, හිසරුජාව;

309. පිට.

**අය්‍යෙ**, ස්වාමිදුව; **තං දමඤ්ඤාමො ඉති**, තී දකිණු තැමැත්තේ යයි; **හරෙණ දෙවාරිකා**, තොල ද්වාරපාලය; **දහරකො වෙජ්ජා**, තරුණ වෙදෙක්; **පුරෙ කිඤ්චි**, පළමුකොට කිසිවක්; **අරොගා හොසි**, නිරෝගි වන්නෙහි ද; **විකාරං සල්ලක්ඛෙත්වා**, රොගය සලකා; **පසතෙන**, පතක් පමණවූ; **නිපජ්ජිත්වා**, පිස; **උත්තානං නිපජ්ජාපෙත්වා**, උඩුකුරුකොට හොවා; **නත්ථුතො අදාසි**, නාසිකාවෙන් දුන්නේය (නස්‍යකර්ම වශයෙන් දුන්නේය); **උග්ගඤ්ඡි**, පිටවූයේය; **නිට්ඨුභිත්වා**, කාරා දමා; **පිචුනා**, කපු පුළුනෙන්; **අයං ඝරණී**, මේ ගෘහිණීය; **ගාව ලුද්ධා**, යම්තාක් ලොභොබී ද; **යත්ථි නාම**, යම් ස්ත්‍රියක් නම්; **ඡඩ්ඩනීය ධම්මං**, බැහැරදැමිය යුතු ස්වභාවය ඇත්තාවූ; **කිඤ්චි දෙය්‍යධම්මං**, කිසි දිය යුත්තක්;

310. පිට.

**කිස්ස**, කුමක් පිණිස; **විමනොසි ඉති**, විකාර සිත් ඇතිවූයේ දැයි; **අගාරිකා නාම**, ගිහිගෙයි වැසියෝ නම් වම්හ; **උපජ්ඣානාම**, දනුම්හ; **එතස්ස සංයමස්ස**, මේ හික්මීමේ ගුණ; **පාදබන්ධනං**, පය හැල්වීමක් හෝ; **ආසිත්තං**, ඉසිනා ලද්දේ; **නභාසිස්සති ඉති**, ගිතනොවන්නේ ය යි; **අපක්කමි**, බැහැර කළේය; **සුණිසා**, යෙහෙළිය; **මම සස්සු**, මාගේ නැන්දනිය; **පොසාවනිකං**, පොෂණය කර

ගැණීමට සුදුසු මිල; **භගන්දලාබාධො**, භගන්දරාබාධය; **උතුනී**, ඔසප් ඇත්තිය; **පුප්ඵං උප්පන්නං**, මල්වර උපන; **උප්පණ්ඩෙන්ති**, කවට කම් කෙරෙත්; **මඞ්කු හොති**, නිස්තෙජස්ක වේ; **තිකිච්ඡෙය්‍ය**, පිළියම් කරන්නේ ද; **භද්‍රෙඛො**, යහපත් ශිල්ප ඇත්තේය;

311\. පිට.

**ආලෙපෙන**, පැලැස්තරයකින් ම; **භූසාපෙත්වා**, සරසවා; **ඔමුඤ්චාපෙත්වා**, මුදවා; **පුඤ්ජකං කාරාපෙත්වා**, ගොඩක් කරවා; **අධිකාරං**, කරණලද උපකාරය;

312\. පිට.

**සබ්බං සාපතෙය්‍යඤ්ච**, සියලු ධනය ද; **නිපජ්ජිතුං**, හෝනට; **මඤ්චකෙන සම්බන්ධිත්වා**, ඇඳ සමග බැඳ; **සීසච්ඡවිං**, හිසේ සිවිය; **සිබ්බනිං**, හිස්කබල් මැසීම; **විනාමෙත්වා**, වෙන්කොට; **ද්වෙ පාණකෙ**, පණුවන් දෙදෙනෙකුන්; **නීහරිත්වා**, බැහැරකොට; **එකං ඛුද්දකං**, කුඩා එකෙකු ද; **දිට්ඨො**, දක්නාලද්දේය; **මත්ථලුඞ්ගං**, හිස් මොල; **පරියාදියිස්සති**, ක්ෂය කරන්නේය; **පරියාදානා**, ක්ෂයවීමෙන්; **සම්පටිපාදෙත්වා**; ප්‍රකෘතිමත්කොට; **ආලෙපං අදාසි**, ආලෙපයක් දුන්නේය; **නතු ඛො පටිස්සුණී**, ශිව්ස්සේ නොවෙහි ද; **ඤාතො අසි**, දන්නා ලද්දෙහි ය;

313\. පිට.

**මොක්ඛචිකාය කීළන්තස්ස**, කත්තත්ගුරුවා පැනීමෙන් කෙළින්නා වූ; (කරණම් ගහන්නා වූ;) **අන්තගණ්ඨාබාධො**, බඩවැලෙහි ගැටයක් වූ රෝගයක්; **න පගුණො**, ප්‍රගුණ නොවේ;

314\. පිට.

**ජනං උස්සාරෙත්වා**, ජනයා පහකරවා; **තිරොකරණිං පරික්ඛිපිත්වා**, තිරයකින් වටකරවා; **ථම්භෙ උපනිබන්ධිත්වා**, ටැඹෙක්හි බැඳ; **උප්පාටෙත්වා**, උපුටා; **අන්තගණ්ඨිං**, බඩවැලෙහි වූ ගැටය; **අන්තානි**, අතුණු; **පටිපවෙසෙත්වා**, නැවත ඇතුල්කොට; **උදරච්ඡවිං**, බඩ සම; **සිබ්බෙත්වා**, මසා; **පිවිස්සතීති**, බොන්නේ දැයි; **ජෙගුච්ඡං**, අප්‍රියය; **පටිකූලන්ති**, පිළිකුල්ය යි; **කසාවවණ්ණං**, කසායක වර්ණය ඇත්තා වූ; **පරිණාමෙන්තං**, පැස වන්නේ; **උද්දෙකං**, ඔක්කාරය; **ඝාතාපෙය්‍යාපි**, මරවනුත් හැක්කේය; **ආපුච්ඡෙය්‍යන්ති**, අවසර ගන්නෙම් නම්;

315. පිට.

**මයං ඛො වෙජ්ජා නාම**, අපි නම් වෙදහු ය; **තාදිසෙන මුහුත්තෙන**, එබඳු වූ මුහූර්තයකින්; **සංහරාම**; එකතුකරම්හ; **වාහනාගාරෙසු ච**, වාහන ශාලාවන්හි ද; **ද්වාරෙසු ච**, ද්වාරස්ථානයන්හි ද; **භද්දවතිකා නාම හත්ථිනිකා**, භද්‍රවතී නම් ඇතින්න; **පඤ්ඤාසයොජනිකා හොන්ති**, පනස් යොදුනක් යන ගමන් ඇත්තී වෙයි; **නිපපති**, පිට පැන්නේය; **පරිණාමෙන්තං සප්පි**, පැසෙන්නාවූ ගිතෙල; **පායිතො අම්හි**, පොවන ලද්දේ වෙමි; **විචිනථාති**, සොයව්යයි; **අමනුස්සෙන ජාතො**, අමනුෂ්‍යයෙකු කරණකොට ගෙණ උපන්නේය; **මාපටිගණ්හෙසි ඉති**, නො පිළිගනුව යි; **පාතරාසං**, උදෑසන භොජනය; **භෙසජ්ජං බලුමෙපසවා**, බෙහෙතක් ගන්වා; **ආමලකඤ්ච**, නෙල්ලි ද; **කිංචි පාපකං හොතුං**, කිසි නපුරක් වන්ට;

316. පිට.

**උපඩ්ඪාමලකං**, නෙල්ලි පලුවක්; **නිච්ඡාරෙසි**, බැහැර කෙළේය; **සකාපෙය්‍යාපි**, මරවනුත් හැකි වෙයි; **සිවෙය්‍යකං දුස්සයුගං**, උතුරුකුරු දිවයිනෙන් ලැබුනාවූ නොහොත් සිවිරට උපන්නාවූ 'සීවෙය්‍ය'' නම් වස්ත්‍ර යුගමයක්; **මොක්ඛඤ්ච**, ප්‍රමුඛ ද වෙයි; **න පච්චාරහති**, සුදුසු නොවෙයි; **දෙසාභිසන්නො හොති**, දෙසින් උත්සන්න වූයේ වෙයි; **සිනෙහෙථ ඉති**, මෘදු කරව් යයි නොහොත් තෙල් අභ්‍යඞ්ග කොට මෘදු කරව් ය යි;

317. පිට.

**ඔළාරිකං**, ඖදාරික වූ; **තීණි උප්පල හත්ථානි**, මහනෙල් මිටි තුනක්; **පරිභාවෙත්වා**, භාවිත කොට (පරිවාසය කොට); **උපසිඞ්ඝතු**, ඉඹිනාසේක්වා; **විරිත්තො**, විරේචනය කළා වූ;

318. පිට.

**පකතත්තො හොති**, ප්‍රකෘති ස්වභාවය ඇති වේද; **යූස පිණ්ඩපාතෙන**, යූෂ සහිත පිණ්ඩපාතයෙන්; **ඉතරීතරෙනපි**, කුදු මහත් අගය ඇති පසයෙන් ද;

319. පිට.

**පාවාරො**, පොරෝණා සළුවක්; **කොජවං**, කොඳු පලසක්;

**පඨමක භාණවාරං නිට්ඨිතං,**

**උපඩ්ඪකාසිනං**, අඩකාසියකට හෙවත් පන්සියයකට; **බහුමානං**, පොහොනාවූ; **කම්බලං**, කම්බිලියක්; **උච්චාවචානි චීවරානි**, බොහෝ හෙදවූ සිවුරු; **ඛොමං**, කොමු පිළිය; **කප්පාසිකං**, කපුපිළිය; **කම්බලං**, ලොමින් කළ වස්ත්‍රය; **සාණං**, හණ වැහැරියෙන් කළ වස්ත්‍රය;; **භඞ්ගං**, පස්වාකාර නූලෙන් කළ වස්ත්‍රය යි;

320–321. පිට.

**නාගමෙන්තානං**, බලා නොසිටිනාවුන්ට; **ආගමෙසුං**, බලා පොරොත්තු වූහ;

**පටිග්ගාහකං**, පිළිගන්නෙකු; **පටිහරන්ති**, පෙරළා ගෙණයත්; **පරිත්තං උප්පජ්ජති**, ස්වල්පව උපදී; **ගහිතාගහිතං ච**, ගත් නොගත් දෙය ද; **උජ්ඣිත්වා**, දමා; **පක්කමන්ති**, බැහැර යෙත්; **චීවර නිදහකං**, සිවුරු තබන්නෙකු කොට; **නිහිතානිහිතඤ්ච**, තැබූ නොතැබූ දෙය ද; **මණ්ඩපෙපි**, මඩුවෙහි ද; **නිම්බකොසෙපි**, පියසි කෙළවර ද; **චීවරං නිදහන්ති**, සිවුරු බහා තබත්; **උන්දූරෙහිපි**, මීයන් විසින් ද; **උපචිකාහිපි**, වේයන් විසින් ද;

322. පිට.

**අගුත්තා**, නොරැකුණේ; **වුට්ඨාපෙන්ති**, නැගිටුවත්; **උච්චිනිත්වා**, තෝරා; **තුලයිත්වා**, වටිනාකම පිරිසිඳ; **වණ්ණාවණ්ණං කත්වා**, සමකොටස් කොට; **වග්ගං බන්ධිත්වා**, වගී බැඳ; **උපඩ්ඪපටිවිංසං**, කොටස් භාගයක්;

323. පිට.

**උත්තරිතුකාමො හොති**, එතරව යනු කැමැත්තේ වේ; **අතිරෙකභාගෙන**, වැඩි භාගයකින් යුක්තව; **අනුක්ඛෙපෙ දින්නෙ**, වැඩි වටිනාකමට දියයුතු අන්‍ය භාණ්ඩයක් දුන් කල්හි; **කථං නු ඛො දාතබ්බො**, කෙසේ නම් දිය යුතු ද; **යථා බුඩ්ඪන්ති**, මහලු පිළිවෙලින් දෙ යි; **විකාලකෙ**, විකාලවූ සිවුරු හෝ පුද්ගලයන්; **කුසපාතං කාතුං**, කුසපත් හෙළීම කරන්ට; **ඡකණෙනපි**, ගොමෙන් ද; **පණ්ඩුමත්තිකායපි**, පඬු මැටියෙන් ද; **චීවරං රජෙන්ති**, සිවුරු පඬු පොවයි; **මූලරජනං**, මුල් පඬුය; **ඛන්ධරජනං**, දඬු පඬුය; **තච රජනං**, පොතු පඬුය; **පත්තරජනං**, පත් පඬුය; **පුප්ඵරජනං**, මල් පඬුය; **ඵලරජනං**, ඵල පඬුය; **සීතුන්දිකාය**, නොපැසුනු පඬුයෙන්; **රජනං පචිතුං**, පඬු පිසන්ට; **චුල්ලං රජන**

**කුම්භිං**, පඬු සැළියක් ද ලිපක් ද; **උත්තරිස්සති**, ඉතිරෙයි; **උත්තරාළුම්පං**, වටවූ ආධාරයක්; **පත්තං වා**, පැසුතාවූ හෝ; **නඛපිට්ඨිකාය වා**, නියපිට හෝ; **ථෙවකං දාතුං**, බිඳුවක් දෙන්ට; **ඔරොපෙන්තා**, බාන්නාහු; **කුම්භිං ආවිඤ්ජන්ති**, සැළිය නමත්; **කුම්භි පභිජ්ජති**, සැළිය බිඳෙයි; **රජනුළුඞ්කං**, පඬු කිනිස්සක්; **දණ්ඩකථාලිකං**, ලී හැන්දක්; **රජනකොළම්බං**, පඬු බඳුනක්; **පාතියාපි**, තැටියෙහි ද; **චීවරං සම්මද්දන්ති**, සිවුර මඩිත්; **දොණිකං**, ඔරුවක්; **චීවරං පප්ඵරන්ති**, සිවුර දිගහරිත්; (=වනත්) **වංසං**, උණ දණ්ඩක්; **රජ්ජුං**, රැහැනක්; **මජ්ඣෙන ලග්ගෙන්ති**, මැදින් එල්ලත්; **උභතො ගලන්ති**, දෙකොනින් ගිලිහෙයි; **කණ්ණෙ බන්ධිතුන්ති**, කොණෙහි බඳින්ට;

324. පිට.

**කණ්ණසුත්තකන්ති**, කොණ බඳින හුයක්; **එකතො ගලන්ති**, එක් පසකින් ගිලිහෙයි; **සම්පරිවත්තකං සම්පරිවත්තකං**, පෙරල පෙරලා; **අවස්සිතෙන ථෙවෙ**, පොද නුසුන් කල්හි; **පත්ථින්නං හොති**, තද වෙයි; **උදකෙ ඔසාරෙතුං**, දියෙහි ගිල්වා තබන්ට; **ඵරුසං හොති**, රළු වෙයි; **පාණිනා ආකොටෙතුන්ති**, අතින් තට්ටු කරන්ට; **දන්තකාසාවානි**, දත්මෙන් කහවන් ඇත්තාවූ; **අච්ඡින්නකානි**, කඩ නොකපනලද සිවුරු; **අච්චිබද්ධං**, සතරැස් ලියදි බඳිනා ලද්දා වූ; **පාළිබද්ධං**, පෙළ බඳිනා ලද්දාවූ නොහොත් දිගු පුළුලින් නියර බඳිනා ලද්දාවූ; **මරියාදබද්ධං**, අතරතුර කොට නියර බඳින ලද්දාවූ; **සිඞ්ඝාටකබද්ධං**, නියරින් නියර වීතිවිද ගිය තන්හි සන්ධි බඳනා ලද්දා වූ; **සංවිදහිතුං**, කරවන්නට; **උස්සහසි**, හැකිවන්නෙහි ද? **කුසිම්පි නාම**, තුවා ආදි දික් පටි ද; **අඩ්ඪකුසිම්පි නාම**, අතරතුර අඩපත් නමුදු; **මණ්ඩලම්පි නාම**, මහ මැඩිලි ද; **අඩ්ඪමණ්ඩලම්පි නාම**, කුඩා මැඩිලි ද; **විවට්ටම්පි නාම**, වස් අත්ත නමුදු; **අනුවිවට්ටම්පි නාම**, ඇලඅත්ත නමුදු; **ගීවෙය්‍යකම්පි නාම**, ග්‍රීවය වෙළන තැන දූඩි කරණ පටි ද; **ජඞ්ඝෙය්‍යකම්පි නාම**, කෙණ්ඩයට පැමිණෙන තැන දූඩි කරණ පත් ද; **බාහන්තම්පි නාම**, තුවා අත්ත ද; **ඡින්නකඤ්ච භවිස්සති**, කපන ලද්දේ ත් වන්නේය; **සත්ථලූඛං**, ශස්ත්‍රරූක්ෂ කරණ ලද්දේ ද; **පච්චත්ථිකානඤ්ච**, සතුරන්ට ද; **උබ්භණ්ඩිකෙ**, ඔසවනලද පොදි ඇත්තාවූ; **චීවරභිසිං කරිත්වා**, සිවුරු බිස්සක් කොට; **ඛන්ධෙපි**, උරහිසෙහි ද; **කටියාපි**, උකුලෙහි ද; **අතිලහුං ඛො**, ඉක්මනට; **චීවර බාහුල්ලාය**, සිවුරු බහුල බව පිණිස;

325. පිට.

**ආවත්තා**, හැරුනාහුය; **මරියාදං ඨපෙය්‍යන්ති**, සීමාවක් තබන්නේ නම්; **නන්දිමුඛියා රත්තියා**, වටින් ගොඩින් එලිය වැටෙන රැයෙහි; **උද්ධස්තෙ අරුණෙ**, අරුණ නැගි කල්හි;

**සීතාලුකා**, ශීතප්‍රකෘති ඇත්තාවූ; **සීතභීරුකා**, ශීතයෙන් භය වන්නාවූ; **දිගුණං සංඝාටිං**, දෙපට සඟළ සිවුර ද; **එකච්චියං අන්තරවාසකං දාති**, තනිපට අඳනය දී සි;

326. පිට.

**නහානං ඔතරන්ති**, නෑමට බසිත්; **කිච්චිරං පන**, කොපමණ දීර්ඝ කාලයකින් වනාහි; **දසාහපරමං**, දස දවසක් පරම කොට ඇති; **විකප්පෙතුං**, විකල්පනය කරන්ට; **ඡිද්දො හොති**, සිදුරු ඇතිවෙයි; **අග්ගළං**, අන්ඩයක්; **අච්ඡුපෙය්‍යං**, අල්ලන්නෙම් නම්; **එකච්චියනාති**; එකපටයයි;

327. පිට.

**අහතානං**, නොසේදූ (=අළුත්); **අහතකප්පානං**, එක වරක් සෝදන ලද්දාවූ; **දුස්සානං**, වස්ත්‍රයන් සම්බන්ධවූ; **උතුද්ධටානං**, දීර්ඝ කාලයකින් ගන්නා ලද; **පාපණිකෙ**, සල්පිල් අතර වැටුනු කඩ රෙද්දෙහි; **තුන්නං**, නූලෙන් එලලීම; **ඔවට්ටිකං**, වැටිකොට මැසීම; **කණ්ඩුසකං**, මුද්‍රිකාපත්‍රය ද (කෑලිපිට කෑලි ඇල්ලීම ද); **දළ්හීකම්මං**, වස්ත්‍ර පට තොම උදුරා ඇලවීම් කිරීම ද; **චාතුද්දීසිකො**, සතර දිවයිනට වසින්නාවූ; **ඔවස්සාපෙථ**, තෙමව්;

328. පිට.

**සිථිලං කරිත්වා**, සිහිල්කොට; **කල්ලකායා**, නිරොගිවූ ශරීර ඇත්තාවූ; **කොට්ඨකෙ**, කොටුගෙයි; **උදකසාටිකං**, ජලසාටිකාව;

329. පිට.

**නග්ගියං**, නග්නභාවය; **න ගොචරකුසලො**, ගොදුරු හම් දැනීමෙහි දක්ෂ නොවේ; **සත්ථා වා**, ගැලෙන් හෝ; **විහායිස්සති**, පසුවන්නේය; **උපගච්ඡිස්සති**, එලඹෙන්නේ ද; **උස්සූරෙ**, දවල්වූ කල්හි; **භත්තං නීහරිස්සති**, බත්ගෙණ එන්නේය; **භත්තච්ඡෙදකං**, බත් සිඳීම: **විචරණෙන**, හැසිරීමෙන්; **උපසෙණ්ඩසුං**, කාවටකම් කළාහුය;

330. පිට.

(73) **පමොදිතා**, ප්‍රමොදයට පැමිණියාවූ; **සීලූපපන්නා**, ශීලයෙන් යුක්තවූවාහු; **සුගතස්ස**, සුගතයන් වහන්සේගේ; **සාවිකා**, ශ්‍රාවිකා වූ; **සා**, යම් ස්ත්‍රියක් තොමෝ; **අන්නපානං**, ආහාර පාන යන්; **දදාති**, දේද; (ඕතොමෝ) **සොවග්ගිකං**, සවර්ගීය පිණ්ඩ

පවත්නාවූ; සොකනුදං, ශොක පහකරන්නාවූ; සුඛාවහං, සැප එලවන්නාවූ; දුනං, දුනය; මච්ජරං, මාත්‍සය්‍ය‍්‍ය; අභිභුය්‍ය, විශෙෂයෙන් මැඩ; දදාති, දෙයි;

(74) සා, ඕතොමෝ; දිබ්බං බලං, දිව්‍යමය බලය ද; ආයුං, දිව්‍යමය ආයුෂය ද; ලභතෙ, ලබාම ය; විරජං, රාගාදි රජස් රහිත වූ; අනඞ්ගණං, කෙලෙශධූලි නැත්තාවූ; මග්ගං ආගම්ම, සෝවාන් මාර්ගය නිමිතිකොටගෙණ; පුඤ්ඤකාමා, පින් කැමැත්තාවූ; සුඛිනී, නිතර සුඛාභිලාෂී වූවා, අනාමයා, නිරාමය වූවා; චිරං; බොහෝ කලක්; සග්ගම්හි කායම්හි, ස්වර්ගලොකයෙහි; පමොදති, සතුටුවන්නීය;

### විසාඛ භාණවාරං නිට්ඨිතං.

---

### 331-332. පිට.

මුඤ්ඤසතීනං, මූලා සිහිය ඇත්තාවූ; ඔකාසියති, වැසේ; නොහොත්, කිලුටු වේ;

කාය ගුත්තියා, කාය ගොපනය පිණිස; පච්චත්ථරණං, පස තුරුණක්; උලලකාච්ඡාබාධො, මහත් කැසුම් රෝගයක්; ලසිකාය, සැරවයෙන්; ලග්ගන්ති, ඇලෙත්; අපකඩ්ඪන්ති, බැහැර කෙරෙත්; කණ්ඩුවා, කැසුමක් හෝ; අස්සාවො වා, සැරව වැගිරීමක් හෝ; කණ්ඩු පටිච්ඡාදිං, කැසුම් වැස්මක්; මුඛ පුඤ්ඡන චොලකං, මුව පිස්නා කඩරෙදක්; බොම පිලොතිකා, කොමු පිළියක්;

### 333. පිට.

විස්සාසං ගහෙතුං, විශ්වාස වශයෙන් ගන්ට; සන්දිට්ඨො ච හොති, දක්නාලද්දේත් වේ ද; සම්භත්තො ච, දැඩභක්තය ඇත් තේත් වේ ද; ආලපිතො ච, කථාකරණ ලද්දේත් වේද; පරික්ඛාර චොළකං, පරිෂ්කාර චොලය; විකප්පෙතබ්බානීති, විකල්පනය කටයුත්තාහු දේ හෝ; සුත්තලූඛං කාතුං, නූලෙන් රූක්ෂ කරන්ට; (එලලීම කරන්ට) විකණ්ණො හොති, විෂම වූ කොන් ඇති වේ; උද්ධරිතුං, උදුරන්ට; සුත්තාඔකිරියන්ති, නූල් වැගි රෙත්; අනුවාතං, නුවාව; පරිභණ්ඩං, පිරිබඩ කිරීම; සඞ්ඝාටියා පත්තා, සඟල සිවුරේ පත්‍රයෝ; ලුජ්ජන්ති, ගිලිහෙත්; අට්ඨපදකං කාතුං, අෂ්ටපදක ආකාරයෙන් කරන්ට;

334. පිට.

**අඤ්ඤාතකම්පි**, ආගන්තුක පත්‍රයක් ද; **න ච විනිපාතෙතබ්බං**, විනිපාතනය නොකට යුතුයි; **සන්තරුත්තරෙන**, අඳනය හා පොරෝණය පමණකින්; **අවහරිංසු**, සොරකම් කළාහුය; **අසනියා**, සිහිමුළාවෙන්; **වස්සිත සංකෙතං වා**, වැසි වස්නා සලකුණු ඇත්තේ හෝ වේ ද නොහොත් වැසි සාරමස හෝ වේද; **නදීපාරගතං වා**, ගංගාවෙන් පරතෙරට ගමනක් හෝ වේ ද; **අගගල ගුත්ති විහාරො වා**, අගුලෙන් ගෝපනය කටයුතු විහාරයක් හෝ;

335–337. පිට.

**පච්ඡිමා සඞ්ඛාති**, අන්තිම සඞ්ඛ්‍යායයි; **උතුකාලං**, ඍතු කාලයෙහි; **ගාමකාවාසං**, ග්‍රාමයෙහි වූ ආවාසයකට;

**එකාධිප්පායං**, එක කොටසක්; **උපඩ්ඪං වසති**, අඩ කාලයක් වෙසේ ද; **උපඩ්ඪා චීවරපටිවිංසා**, උපාඩියක්වූ සිවුරු භාගය; **කුච්ඡිවිකාරාබාධො**, කුසරුජාවක්වූ රෝගයක්; **පළිපන්නා**, ගැලුනේ;

335. පිට.

**මං උපට්ඨහන්තස්ස**, මාගේ අවවාදය කරන්නේ ද; **දූපට්ඨො හොති**, උපස්ථාන කරන්ට දුෂ්කර වෙයි; **අසප්පායකාරී හොති**, අසත්ප්‍රාය ක්‍රියා කරන්නේ වේ; **අභික්කමන්තං වා**, වැඩෙන්නාවූ හෝ රෝගය; **පටික්කමන්තං වා**, බැහැර වන්නාවූ රෝගය හෝ; **අනධිවාසක ජාතිකො හොති**, නොඉවසන ස්වභාව ඇත්තෙක් වේ ද;

339. පිට.

**සප්පායාසප්පායං**, පථ්‍යාපථ්‍ය දෙය; **ආමිසන්තරො**, ආමිස ලබන සිත් ඇත්තේ; **නීහාතුං**, බැහැර දමන්ට;

340. 341. පිටු.

**සමකං පටිවිංසං දාතුං**, සමභාගයක් දෙන්ට; **අවිස්සජ්ජිකං**, දීමය නොකට හැක්කාවූ; **අවෙභඞ්ගිකං**, බෙදීම නොකට හැක්කාවූ; **කුසචීරං**, කුසතණින් කරණ ලද වස්ත්‍රයක්; **වාකචීරං**, වැහැරි සිවුරක්; **ඵලකචීරං**, පෝරුකඩ සිවුරක්; **කෙසකම්බලං**, කෙස් කම්බිලියක්; **වාලකම්බලං**, වාලකම්බිලියක්;

උලූකපක්ඛං, බකමූහුණු පිහාටු වලින් කළ වස්ත්‍රයක්; අජිනක්ඛිපං, අඳුන් දිවි සමක්; අක්කනාලං, එරාවැහැරි; පොත්ථකං, නියඳින් කළ වස්ත්‍රයක්;

342. පිට.

සබ්බමහාරඞ්ගරත්තානි, සියල්ල මහා රඞ්ග රජනයෙන් පඬුපොවන ලද්දවූ; අච්ඡින්නදසානි, නොකපන ලද දවලු ඇති; පුප්ඵදසානි, මල්කම් කල දවලු ඇති; ඵණදසානි, පෙණගොබ වැනි දවලු ඇති; කඤ්චුකං, සැට්ටය; තිරීටකං, කිහිරිපිළි; වෙඨනං, හිස්වෙළුම;

343–345–346. පිටු.

ගාහකො සන්තො, පිළිගන්නෙකු ඇති කල්හි; සොධිවසිතං, මනාකොට ඉවත ලද්දේ වේ; ආදිස්ස දෙති, නියම කොට දේ; ධුවකාරා, නිතර කරන්නාවූ සත්කාරයෝ;

චීවරක්ඛන්ධකං නිට්ඨිතං

---

348. පිට.

තන්තිබද්ධො, කවයුතු පරම්පරාවෙහි බැඳුනේ; උස්සුක්කං ආපන්නො, උත්සාහයට පැමිණියේ;

349. පිට.

කුප්පෙන වා, කොප්‍ය කර්මයෙන් හෝ; ඨානාරහෙන වා, කාරණයට සුදුසුවූ හෝ; අනුස්සාවණ සම්පන්නං, අනුස්සාවණ සම්පත්තියෙන් යුක්තවූ; ඤත්තිවිපන්නම්පි, ඤත්තියෙන් විපත්තියට පැමිණියාවූ ද; පටික්කුට්ඨකතම්පි, විරුද්ධව කියන ලදුව කරණ ලද්දාවූ ද;

355. පිට.

පටික්කොසන්ති, විරුද්ධව කථා කෙරෙත්;

චතුවග්ගකරණීං,

---

359. පිට.

පාරිවාසිකචතුත්ථො, පිරිවෙස් පුරන්නා සතරවෙනි කොට ඇත්තේ; මානත්තචාරිකචතුත්ථො, මානතෙහි හැසිරෙන්නා සතරවෙනි කොට ඇත්තේ;

360. පිට.

**අනතික්ඛස්සාපි**, ලඟ ම වුන්නාවූ ද; **නිස්සාරණා**, බැහැර කිරීම; **සුනිස්සාරිතො**, මනාකොට බැහැර කරණ ලද්දේ; **අනාපන්නො**, ආපත්ති පරිච්ඡේද රහිත වූයේ; **අනනුලොමිකෙහි**, සාසනයට අනුලොම් නොවූ; **ඔසාරණං**, ඇතුළත් කර ගැණීම;

361. පිට.

**අළච්ඡින්නො**, මහපට ඇගිල්ල කපන ලද්දේ; **කණ්ඩරච්ඡින්නො**, මහ නහර කපන ලද්දේ; **සිපදිකො**; බරවා ඇත්තේ; **කුණී**, අත් පා කුණුවූයේ; **මූගො**, ගොළුවූයේ;

**වාසභගාම භාණවාරං පඨමං.**

---

**පටිනිස්සජ්ජනා**, හැරිය යුතුවූ;

364. පිට.

**පටිඤ්ඤාය කරණීයා**, ප්‍රතිඥාවෙන් කටයුතු වූ; **සතිවිනයාරහස්ස**, සති විනය දිය යුත්තාට; **පරිවාසාරහං** පිරිවෙසට සුදුස්සා; **මූලායපටිකස්සති**, මූලාය පටිකස්සනයෙන් අදී ද; **සාතිසාරො හොති**, දොස් ඇති වෙයි;

**උපාලිපුච්ඡා භාණවාරං දුතියං.**

---

368. පිට.

**භස්සකාරකො**, බොහෝ කථා කරන්නෙක් වේද;

373. පිට.

**ලොමං පාතෙන්ති**, ලොමු හෙළාද(=යටත්ව පවතීද); **නෙත්ථාරං වත්තන්ති**, කර්මනිස්තරණයට හිතවූ වතෙහි පවතී.

**චම්පෙය්‍යක්ඛන්ධකං නිට්ඨිතං.**

---

391. පිට.

**අනුක්ඛිත්තොම්හි**, උක්ෂිප්ත නොවූයේ වෙමි;

393. පිට.

**මාඅනුපරිවාරෙථ**, අනුව නොපිරිවරව්; **විග්ගහො**, විවිධ ග්‍රාහයක්; **සඞ්ඝරාජි**, සඞ්ඝයා බිඳීමෙහි ඉරි වැටීමක්; **සඞ්ඝවවත්ථානං**, සඞ්ඝයා වෙන්කිරීමක්; **භෙදගරුකෙහි**, භෙදය ගරුකොට සිතන්නාවූ;

394. පිට.

**එකබ්‍යඤ්ජනෙන**, එක සෙව්ලි ඇති හෙයි; **මමං වා කාරණා**, මා පිළිබඳ කරුණකින් හෝ; **අඤ්ඤං කාරණා**, අනුන් පිළිබඳ කරුණකින් හෝ;

395. පිට.

**පරෙසමපි සද්ධාය**, අනුන්ගේ විශ්වාසයෙන් ද; **අප්පටිනිස්සග්ගෙන වා**, බැහැර නොකිරීමෙහි හෝ;

396. පිට.

**උපදංසෙස්සන්ති**, එළවත්; **අධම්මියමානෙ**, අධර්ම කම් කරණ කල්හි; **අසම්මොදිකාය වත්තමානාය**, නො සතුටු සිත් උපදවන ක්‍රියා පවත්නා කල්හි; **ආසනන්තරිකාය**, අස්නක් අතර තිබීමෙන්;

397. පිට.

**ආගමෙතු**, ඉවසා වදරණ සේක්වා; **පරිපුණ්ණකොසකොට්ඨාගාරො**, පිරුණාවූ රත්න කොෂ හා කොෂ්ඨාගාර ඇති; **දීඝිතිං කොසලරාජානං**, "දීඝිති" නම් කොසොල් රජු කරා; **අබ්භුය්‍යාසි**, යුද්ධ පිණිස ගියේය; **එකසඞ්ඛාතමපි**, එක ම යුද්ධ ප්‍රහාරයකුත්; **සහිතුං**, ඉවසන්ට; **දෙහලො**, දෙලදුනෙක්; **නිප්පතොය්‍යාති**, පැනයන්නෙම් නම්; **අභිවිජිය**, ජයගෙණ;

398. පිට.

**සන්නද්ධං**, යුද්ධායුධයෙන් සන්නද්ධ වූ; **වම්මිතං**, සැට්ට ලන ලද්දවූ; **අවිමනා හොති**, නොසතුටු සිත් ඇත්තී නොවෙව; **ලච්ඡසි**, ලබන්නෙහිය යි;

399. පිට.

**පරිබ්බාජකබ්‍යඤ්ජනෙන**, පරිබ්‍රාජක ව්‍යාජයෙන්; **දළ්හාය රජ්ජුයා**, දැඩිරැහැනින්; **පච්ඡාබාහං**, පිටිපස්සට අත් ඇතිකොට; **ඛුරමුණ්ඩං කරිත්වා වා**, කර කැත්තෙන් හිස මුඩු කොට; **ඛරස්සරෙන**, කෘර හඬ ඇත්තා වූ; **පණවෙන**, බෙරයකින් යුක්තව; **සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං**, සතර මං සන්දියෙන් සතර මං සඳියව; **පරිණෙන්තෙ**, ගෙණ යන්නවුන්; **දීඝං පස්ස**, දීඝීකොට බලව;

400. පිට.

**මා රස්සං**, හ්‍රස්වකොට නොබලව; **විභාවෙස්සතීති**, කල්පනා කරන්නේය යි; **ගුම්බං ඨපෙත්වා**, රැකවල් තබා; **පඤ්ජලිකං**, ඇඳිලි බැන්දවූ; **අනාපථෙනා**, (අනාපෙථා අතො) මොහුගෙන් අනතුරෙක් වෙයි;

### 401. පිට.

**ආරාධනාපෙක්ඛො**, ආරාධනාව අපේක්ෂා කොට ඇත්තේ; **පුබ්බුට්ඨායී**, පෙරටුව නැගී සිටින්නෙක්; **පච්ඡා නිපාතී**, පසුව සයනය කරන්නෙක්; **කිඞ්කාරපටිස්සාවී**, කුමක් කරන්නෙම්දැයි අස්වන්නෙක් වීය; **වෙරං අප්පෙසයන්ති**, වෛරය පිරිමසන්නෙම් නම්;

### 402. පිට.

**නිබ්බාති**, ඇද්දේය; **උබ්බිග්ගො**, භයින් චකිතවූයේ; **උස්සංකී**, අතිශයින් සැක ඇත්තේ; **අද්දූභාය**, ද්‍රොහ නොකිරීම පිණිස, **සපථඤ්ච අකංසු**, දිව්රීමක් ද කළාහුය;

### 403. පිට.

**පෙමනීයං**, පිය සන්තතාවූ;

### 404. පිට.

**ආදින්නදණ්ඩානං**, ගත්තාලද දඬු ඇති; **ඛන්ති සොරච්චං**, ක්ෂාන්තියක් හා සුරත භාවයක්; **පටිසාදිත්තරූපා ඛො**, ක්ෂය වූ ලක්ෂණ ඇත්තාහු ම ය;

දීඝාවු භාණවාරං පඨමං.

---

74. **පුථුසද්දො**, මහත් හණ්ඩන ශබ්ද ඇත්තා වූ; **සමජනො**, සමාන ජනයා වූ; **නකොචි**, කිසිවෙක්; **බාලො**, මම අඥානයෙමියි; **න මඤ්ඤථ**, නො සිතූහ; (සියල්ලෝම පණ්ඩිතමානීහුම වූහ.) **භිය්‍යො**, වඩාත්; **සඞ්ඝස්මිං භිජ්ජමානස්මිං**, සඞ්ඝයා බිඳෙන කල්හි; **අඤ්ඤං**, 'අප නිසා සඞ්ඝයා බිඳේ'ය යන අනික් කරුණකුත්; **අමඤ්ඤරුං**, නො සිතූහ.

76. **පරිමුට්ඨා**, මූළා සිහි ඇත්තා හු; **පණ්ඩිතා භාසා**, පණ්ඩිතයින්ට බඳු වචන ඇත්තා හු; **වාචාගොචරා**, වචන ම ගොචර කොට ඇත්තාහු; **භාණිනො**, කථා කරන්නාහු; **යාව**, යම්තාක්; **මුඛායාමං**, මුව විදහාලීම; **ඉච්ඡන්ති**, කැමැත්තාහු නම් එපමණට මුඛ විදහාලන්නාහු; **යෙන**, යම් කලහයෙකින්; **නීතා**, මේ නිර්ලජ්ජීභාවයට පමුණුවන ලද්දාහු නම්; **තං**, ඒ කාරණය; **න විදූ**, මෙතෙක් දෝෂ ඇතැයි නො දනිති.

81. **අට්ඨිච්ඡිදා**, ඇට සුන්කරන්නා වූ; **පාණහරා**, ජීවිත ච්ඡේදය කරන්නා වූ, **ගවාස්සධනහාරිනො**, ගව අස් ධන පැහැ

ර ගන්නා වූ; **තෙසං අපි**, ඒ රජුන්ගේ ද; **සඞ්ගති හොති**, එක් වීම වෙයි; **කස්මා**, කුමක් හෙයින්; **තුම්හාකං**, තොපගේ; **නො සියා**, සමගියෙක් නො වන්නේ ද?

405. පිට.

**පාචීන වංස දායො**, පාචීන වංස නම් වූ මුව වනය; **දාය පාලො**, උයන්පල් තෙම; **දායං**, වනයට; **අත්තකාම රූපා**, ආත්මකාරී සවභාව ඇත්තාහු; **අභික්ඛණං**, බැහැරයේවා.

406. පිට.

**ආවි චෙව**, ප්‍රකාශයෙන් ද;

407. පිට.

**පඤ්චාහිකං ඡබා පන**, පස් දවසකට අයිති කොට වනාහි; (පස්වෙනි දවසට පැමිණියා වූ) **හත්ථි කලභෙහි**, හත්ථි පොතක යන් විසින් ද; **හත්ථිච්ඡාපෙහි**, ලදරු ඇත්පැටවුන් විසින් ද; **ඡින්නග්ගානි චෙව**, සිඳින ලද අග ඇත්තා වූ ද; **ඔභග්ගොභග්ගඤ්ච**, බිඳින බිඳින ලද්දා වූ ද; **සාඛා භඞ්ගං**, අතු කැබැලි; **ඔගාහා ච**, තොටුපලෙන් බැසීමෙන් ද; **උත්තිණ්ණස්ස**, ගොඩනැංගා වූ, **උපනිඝංසන්තියො**, ගටමින් (ඇඟ උලමින්);

408. පිට.

**යූථා**, ඇත් සමූහයා කෙරෙන්; **අපහරිතඤ්ච**, තණ ඉවත් කිරීම ද;

85. **සං**, යම් හෙයකින්; **එකො**, හුදකලාවූයේ; **වනෙ**, වනයෙහි; **රමති**, සිත් අලවා වෙසේ ද; (එහෙයින්) **ඊසාදන්තස්ස**, රිය වියග වැනි දත් ඇති; **නාගස්ස**, ශ්‍රෙෂ්ඨ වූ; **හත්ථිනො**, හස්ති හුගේ; **එතං**, මේ චරිතය; **නාගෙන**, බුඩ නාගයා සමග ද; **චිත්තං**, ඔහුගේ සිත; **චිත්තෙන**, සර්වඥයන් වහන්සේගේ සිත හා ද; **සමෙති**, සම වෙයි; **උබ්බාළ්හො**, පීඩා කරණ ලද්දාවූ; **අසක්කාර පකතො**, සත්කාර නො කිරීමෙන් වෙන් කල;

409. පිට.

**සාවසෙසා ආපත්තිති**, අවශෙෂයක් සහිත වූ ඇවැතක් ය යි;

412. පිට.

**පටිබාහෙය්‍ය**, පසුබැස්සූයේ නම්;

414. පිට.

**නිහතා**, නසන ලද්දීය;

415. පිට.

**අත්ථාපෙතා**, අර්ථයෙන් තොර වූ; **ව්‍යඤ්ජනූපෙතා**, අක්‍ෂර සම්පත්තියෙන් යුක්ත වූ;

86. **සඞ්ඝෙසු කිච්චෙසු**, සඞ්ඝයා පිළිබඳ කටයුතු උපන් කල්හි ද; **මන්තනාසු ච**, විනය මන්ත්‍රණයන්හි ද; **අත්ථෙසු ජාතෙසු**, අර්ථ කාරණයන් පැමිණි කල්හි ද; **විනිච්ඡයෙසු ච**, විනිශ්චය කිරීම්හි ද; **මහත්ථිකො**, මහත් උපකාර ඇත්තාවූ; **නරො**, පුද්ගල තෙම; **ඉධ**, මේ ශාසනයෙහි; **කථං පකාරො හොති**, කෙසේවේ ද? **පග්ගහාරහො**, පිටිවහල්වීමට යොග්‍යවූයේ; **ඉධ**, මෙහි; **කථං හොති**, කෙසේ වේද?

87. **පඨමෙන**, පළමුවෙන් ම; **සීලතො**, ශීලයෙන්; **අනනුවජ්ජො**, උපවාද රහිතවූයේ; **අවෙක්ඛිතාචාරො**, උපපරීක්ෂිත ආචාර ඇත්තේ; **සුසංවුතින්ද්‍රියො**, මොනවට සංවරවූ ඉඳුරන් ඇත්තේ වේ ද; (ඔහට) **පච්චත්ථිකා**, පසමිතුරෝ; **ධම්මතො**, කරුණුවශයෙන්, **නොපවදන්ති**, දොස් නොකියත්; **යෙන**, යම්හෙයකින්; **තං**, ඔහුට; **වදෙය්‍යුං**, කියත් ද; **අස්ස**, ඔහට; **තං**, ඒ අපවාදය; **නති හොති**, නොම ඇත්තේ වෙයි.

88. **තාදිසො**, එබඳුවූ; **සීල විසුද්ධියා ඨිතො**, ශීලවිශුද්ධියෙහි පිහිටියාවූ; **සො**, හෙතෙම; **විසාරදො හොති**, විශාරද වෙයි; **විසය්හ**, මෙරමා අභිභවනයකොට; **භාසති**, කියයි; **පරිසගතො**, පිරිස අතරට ගියේ; **නච්ඡම්භති**, තැති නොගණියි; **නවෙධති**, නොවෙවුලයි; **අනුයුත්තං**, අනුදන්නාලද්දක්; **භණං**, කියන්නේ; **අත්ථං**, අර්ථය; **න හාපෙති**, නො හසයි.

89. **තථා එව**, එපරිද්දෙන් ම; **පරිසාසු**, පිරිස්හි; **පඤ්හං**, ප්‍රශ්න; **පුච්ඡිතො**, විචාරණ ලද්දේ; **නච එව පජ්ඣායති**, සිතිවිලි නොම සිතයි; **න මඞ්කු හොති**, මකු නො වෙයි; **කාලාගතං**, සුදුසු කල්හි පැමිණි; **බ්‍යාකරණාරහං**, ව්‍යාකරණයට සුදුසුවූ වචන; **වචො**, කියන්නාවූ; **සො විචක්ඛණො**, ඒ නුවණැත්තේ; **විඤ්ඤුපරිසං**, නුවණැති පිරිස; **රඤ්ජති**, සතුටුකරයි.

90. වුඩ්ඪතරෙසු භික්ඛුසු, අතිශයින් වෘද්ධ භික්ෂූන් කෙරෙහි; සගාරවො, ගෞරව සහිතවූ; සකෙ ආචරියකෙ, තමන් ඇදුරු වාදයෙහි; විසාරදො, විශාරද වූ; පමෙතුං, විමර්ශනය කරන්ට; අලං, සමර්ථවූ; පගුණො, කෘත පරිචය ඇත්තාවූ; කථෙතවෙ, කියයුතුවූ; පච්චත්ථිකානං, ප්‍රතිවාදීන්ගේ; විරද්ධකොවිදො, විරොධස්ථාන දැකීමෙහි දක්ෂවූ;

91. පච්චත්ථිකා, ප්‍රතිවාදීහු; යෙන, යම් කථාවකින්; නිග්ගහං, නිග්‍රහයට; වජන්ති, යෙද්ද; මහාජනො, මහාජන තෙමේ සඤ්ඤාපනං, අවබොධයට; ගච්ඡති ච, යේ ද; සකං ච ආදාය සමයං, ස්වකීයාචාර්‍ය්‍ය වාදය ත්; න රිඤ්චති, හිස් නොකෙරේ ද; සො, හෙතෙම; අනුපඝාතිකං, හිංසා රහිත වූ; පඤ්හං, ප්‍රශ්න; බ්‍යාකරං, ප්‍රකාශ කරන්නේ වෙයි;

92. දූතෙය්‍ය කම්මෙසු, සඞ්ඝ දූත කර්මයෙහි; අලං, සමර්ථ වූ; ආහුනං, ආහුති පිණ්ඩය; යථා, යම්සේ පිළිගණී ද; (එපරිද්දෙන්) සඞ්ඝස්ස, සඞ්ඝයාගේ; කිච්චෙසු, කෘත්‍යයන්හි; සමුග්ගහො, ඉගෙණීම් හෝ පිළිගැණීම් ඇත්තා වූ; වචොකරං, වචන ලෙස කරන්නා වූ; ගණෙන පෙසිතො, සමූහයා විසින් යවන ලද්දාවූ; භික්ඛු, මහණ තෙම; තෙන, එහෙයින්; අහං, මම; කරොමීති, සඞ්ඝයාගේ කිස කරමියි; න මඤ්ඤති, මානවසයෙන් නො හඟියි;

93. යාවතකෙසු, යම්තාක්; වත්ථුසු, වස්තූන්හි; ආපජ්ජති, ඇවැතට පැමිණේ ද; යථා, යම් ලෙසකින්; ආපත්තියා, ඇවැතින්; වුට්ඨානා හොති, නැගීසිටීම වේ ද; එතෙ උභයෙ විභඞ්ගා, යන මේ අර්ථද්වෛතකයෝ දෙදෙන; අස්ස සාගතා, ඔහුට සවාගත වෙත්; ආපත්තිවුට්ඨානපදස්ස, ඇවැතින් නැගීසිටීම් කරුණෙහි; කොවිදො, දක්ෂ වෙයි;

94. යානි චාචරං, යම්බඳු හණ්ඩන කාරණාදීන්හි හැසිරෙන්නේ; නිස්සාරණං, තජ්ජනීයාදී නිස්සාරණ කර්මයට; ගච්ඡති, යෙයි ද; යථා, යම්සේ; වත්ථුනා, වස්තු වශයෙන්; නිස්සාරිතො හොති, බැහැර කරණ ලද ද; තං, ඒ වත; වුසිතස්ස, වැස නිම වන ලද; ජන්තුනො, භික්ෂූහුගේ; ඔසාරණං, ඇතුලත් කර ගැණීමය යන; එතං අපි, මෙය ද; විභඞ්ග කොවිදො, විභඞ්ගයෙහි දක්ෂ තැනැත්තේ; ජානාති, දනියි;

95. **ඉධ**, මේ ශාසනයෙහි; **වුඩ්ඪතරෙසු**, අතිශයින් වෘද්ධ වූ; **භික්ඛූසු**, භික්ෂූන් කෙරෙහි ද; **නවෙසු**, නවකයන් කෙරෙහි ද; **මජ්ඣිමෙසු**, මධ්‍යමයන් කෙරෙහි ද; **සගාරවො**, ගෞරව සහිතවූ; **පණ්ඩිතො**, නුවණැත්තාවූ; **මහාජනස්ස**, මහජනයාට; **අත්ථචරො**, අර්ථ චාරීවූ; **තාදිසො**, එබඳුවූ; **සො භික්ඛු**, ඒ මහණ තෙම; **පග්ගහාරහො**, ප්‍රකම්යෙන් අධිකරණ විනිශ්චය පිණිස ගත යුත්තේ වෙයි;

**(පස්වස් වනතුරු "නවක" නම-දස වස් නොපිරෙණතෙක් "මජ්ඣිම" නම; පිරිපුන් දසවස් ඇතියේ "ථෙර" හෙවත් "වුඩ්ඪ" නම.)**

**මහවග ගැටපදය නිමි.**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු